
# නිවනේ නිවීම

## පස්වන වෙළුම



කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු

## <u>ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරයේ</u>

# <u>පොදු පුණ්‍යානුමෝදනාව</u>

**<u>"මහණෙනි, ආමිස දානයය, ධර්ම දානයය, යන මේ දන් දෙකෙකි. මේ දන් දෙක අතුරෙන් මෙයම අග්‍රය - එනම්, ධර්ම දානය."</u>**

මේ අසිරිමත් බුදුවදන අගය කරන බොහෝ පාඨකයින් තම පරලෝ සැපත් මවුපියාදි ඥාතීන්ට කෘතගුණපූර්වකව පින් අනුමෝදන් කරවීමේ චිරාගත චාරිත්‍රයට අනුව ලොකු කුඩා පරිත්‍යාග පිරිනමන බැවින් දෙස් - විදෙස් වැසි ගිහි - පැවිදි දහම් පිපාසිත විශාල පිරිසකට අමිල දහම් අමාපැන් නොමිලයේ බෙදාදෙන <u>ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය</u> පුණ්‍යානුමෝදනා වශයෙන් එම ධර්ම දානමය කුශලය එකී පින්වතුන්ට හා ඥාතීන්ටත් මෙම 'අමාගඟ' නොසිඳී ගලායාමට නිරතුරුව කාලය, ධනය, ශ්‍රමය වැයකරන සැමටත් පරම ශාන්ත උතුම් අමාමහ නිවනින් සැනසීමට උපනිශ්‍රය සම්පතක්ම වේවායි පතන බව දන්වා සිටිමු.

මෙයට,

සසුන් ලැදි

ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය.

# නිවනේ නිවීම
## (දෙසුම් පෙළක්)

පස්වන වෙළුම - දෙවන මුද්‍රණය

(13 - 15 දෙසුම්)

කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු

පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
'පහන් කණුව'
කන්දේගෙදර
දේවාලේගම

**2001**

ධම්මදානයකි

මුදලට විකිණීම සඳුරා සහනම් වෙයි.


ප්‍රථම මුද්‍රණය - 1997 ජූලි
දෙවන මුද්‍රණය - 1999 මාර්තු
තෙවන මුද්‍රණය - 2000 ජූනි
සිවුවන මුද්‍රණය - 2003 ඔක්තෝබර්
පස්වන මුද්‍රණය - 2007 ජනවාරි


## පොත ලබාගත හැකි ස්ථාන

- පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
  'පහන් කණුව' කන්දේගෙදර, දේවාලේගම.

- රෝයල් ඉන්ස්ටිටියුට්,
  191, හැව්ලොක් පාර,
  කොළඹ 5.

- ඩී. ටී. වේරගල මහතා
  422, වැලිපාර, තලවතුගොඩ.

- අනුර රූපසිංහ මහතා
  අංක 27, කොළඹ වීදිය, මහනුවර.

- මහා භාරකාර දෙපාර්තමේන්තුව
  2, බුලර්ස් පටුමග,
  කොළඹ 07.


මුද්‍රණය
කොලිටි ප්‍රින්ටර්ස්
17/2, පැගිරිවත්ත පාර, ගංගොඩවිල,
නුගේගොඩ.
ටෙලි : 011-4302312

මෙම දේශනාමාලාව පැවැත්වීමට ආරාධනාකොට

අප ධෛර්යවත් කළ

මීතිරිගල නිස්සරණ වන සේනාසනාධිපතිව වැඩවිසූ

අපවත් වී වදාළ

අතිපූජනීය, මහෝපාධ්‍යාය

මාතර ශ්‍රී ඥානාරාමාභිධාන

අප ගුරුදේවයන් වහන්සේගේ ශ්‍රී නාමයට

'නිවනේ නිවීම'

පූජෝපහාරයක්ම වේවා!

එතං සනතං

එතං පණීතං

යදිදං

සබබ සංඛාර සමථො

සබබූපධිපටිනිසසගෙගා

තණහකඛයො

විරාගො

නිරොධො

නිබබානං

"මෙය ශානතය

මෙය ප්‍රණීතය

එනම්

සියලු සංස්කාරයන්ගේ සංසිඳීම

සියලු උපධීන් අතහැර දැමීම

තණ්හාව ක්ෂය කිරීම

නොඇල්ම නම්වූ විරාගය

නැවැත්ම නම් වූ නිරෝධය

නිවීම නම් වූ නිබ්බානය"

# පටුන

හැඳින්වීම

ප්‍රකාශක නිවේදනය

ග්‍රන්ථ සංකේත නිරූපනය

'නිවනේ නිවීම' - 13

'නිවනේ නිවීම' - 14

'නිවනේ නිවීම' - 15

# හැඳින්වීම

බුද්ධ දේශනාවෙහි දැක්වෙන ප්‍රතිපත්ති මාර්ගයේ අවසාන පරමාර්ථය වන 'නිවන' පිළිබඳව ඈත අතීතයේ පටන්ම විවිධ මතිමතාන්තර ප්‍රකාශයට පත් වී ඇත. ආර්ය අෂ්ටාංගික මාර්ගය 'සම්මා දිට්ඨි' නම් වූ 'හරි දැක්ම' පෙරටු කරගත් ප්‍රතිපදාවකි. එබැවින් ඒ මාර්ගයෙහි ගමන් කරන්නෙකුට ගමනෙහි ඉලක්කය ගැන නිරවුල් අවබෝධයක් ඇතිවිය යුතුමය. බුද්ධ වචනයට අනුකූලව එවැනි අවබෝධයකට මඟ හෙළි කිරීම මෙම දේශනා මාලාවේ පරමාර්ථය විය.

මීතිරිගල නිස්සරණ වන සෙනසුනෙහි ප්‍රධාන කම්මට්ඨානාචාර්යයන් වහන්සේ වශයෙන් වැඩ විසූ, අපවත් වී වදාළ අතිපූජනීය මහෝපාධ්‍යාය මාතර ශ්‍රී ඥානාරාම මාහිමිපාණන් වහන්සේ විසින් අප වෙත කරන ලද සමාරාධනය මේ දේශනා පෙළට ආසන්න නිමිත්ත විය. අපගේ ගුරුදේවයන් වහන්සේ වූ උන්වහන්සේ, මෙයට වසර කීපයකට පෙර නිස්සරණ වන යෝගාවචර සඟ පිරිසට ඉදිරිපත්වූ එක්තරා ධර්ම ගැටළුවකදී 'නිවන' පිළිබඳව දේශනා පෙළක් පැවැත්වීම ප්‍රයෝජනවත් විය හැකි බවත්, ඒ දේශනා පටිගත කරගැනීමට කටයුතු යෙදිය හැකි බවත් පවසමින් අප වෙත කරන ලද දයාන්විත ආරාධනය පිළිගැනීමට මුලදී පසුබට වීමු. යළිත් එම ආරාධනාව කළ අවස්ථාවේදී, එසේ පසුබට වීමට එක් හේතුවක් වශයෙන් අප සඳහන් කළේ 'නිවන' සම්බන්ධයෙන් දැනට ප්‍රචලිතව ඇති ඇතැම් මතිමතාන්තර කෙරෙහි අප දක්වන වෙනස් ආකල්පය නිසා ඇතිවිය හැකි ප්‍රතිචාරයය. එවිට උන්වහන්සේ වදාළේ: "ඒකට කමක් නෑ...... මා ආරාධනා කළ බව දේශනාවේදීම කියන්න" යනුවෙනි.

ඒ සා උදාර පැවරීමකින් උත්සාහවත්ව ආරම්භ කැරුණු මෙම දේශනා මාලාව දෙවසරකට වැඩි කාලයක් තිස්සේ (1988.08.12-1991.01.30) දෙපෝයකට වරක් බැගින් අප ගුරුදේවයන් වහන්සේගේ අතිපූජනීය පාදමූලයේදී නිස්සරණ වනයේ අප සබ්‍රහ්මචාරී ගරුතර යෝගාවචර සඟ පිරිස හමුවේ පවත්වන්නට යෙදුණි. ගිලන්වූ ඇතැම් අවස්ථාවලදී පවා මාහිමිපාණන් වහන්සේ යහන්ගතව දෙසුමට සවන් දුන්හ. උන්වහන්සේ බැහැර සෙනසුනෙක වැඩ විසූ එක් අවස්ථාවෙක, මාහිමිපාණන් වහන්සේ මුල'සුනෙහි නොමැතිව දේශනා පැවැත්වීම සම්බන්ධයෙන් පැහැදෑහුනු

ප්‍රශ්නයක් නිසා එක් දේශනා වාරයක් මග හැරුණි. ඒ බැව් සැළවූ විට. නොකඩවාම දේශනාමාලාව පැවැත්විය යුතු බවත්, තමන් වහන්සේට ඒ දෙසුම් පටිගත කළ පසුව වුවද ඇසිය හැකි බවත්, උන්වහන්සේ වදාළහ. අප ගුරු දේවයන් වහන්සේගේ ඒ උදාර මුදිතා ගුණයට හා ධර්මකාමී ශාසන දයාවට නමස්කාර වේවා!

දෙසුම් 33 කින් පරිමිත මෙම දේශනා මාලාව පැවැත්වීමේදී අප අනුගමනය කළ විවරණ මාර්ගය අනුව හේතුසාධක වශයෙන් පෙළ අටුවා ආදියෙන් කොතෙකුත් උධෘත පාඨ ගෙනහැර දැක්වීමට සිදුවිය. ඒ අනුව එක්තරා බුද්ධිගෝචර රටාවක් මෙහි දැකිය හැකි නමුදු අප පරමාර්ථය වූයේ සද්ධර්මයේ සජීව ප්‍රායෝගික පක්ෂය ඉස්මතු කර දීමමය. ඇතැම් විට හුදු බුද්ධිවාදයක අතරමං වී සිටින උගතුන් කිසියම් ධර්මප්‍රබෝධයක් තුළින් ප්‍රතිපදාව වෙතට යොමුකරවා ගැනීමට මේ විවරණ මාර්ගය උපකාරවත් විය හැකිය. කෙසේ හෝ වේවා, යමෙකුට ධර්මරසය විඳිමින්ම දෙසුමකට සවන්දිය හැකිවන අයුරින් විවිධ උපමා, උපමා කථා, නිදර්ශන ආදියෙන් දෙසුම් පෙළ පණපෙවීමට උත්සාහවත් වීමු. බුදු පියාණන් වහන්සේ වදාළ පරිදිම, "මෙහි ඇතැම් නුවණැති පුරුෂයෝ උපමාවෙකින්දු දෙසුමෙක අරුත මැනැවින් වටහා ගනිත්".

අසන්නවුන්ගේ අවධානය නොවිසිරෙන අයුරින් මුතු ඇට පෙළක් නූලක අවුණන්නාක් මෙන් ධර්ම කාරණා සාධක සහිතව ගොනු කර දැක්වීම දේශනාවක් තුළ දී කළ හැකි පහසු කාර්යයක් නොවේ. එබැවින් එවැනි ගැටළුසු තැන්වලදී හේතුසාධක කීපයක් පමණක් දැක්වීමෙන් සෑහීමකට පත්වීමට සිදුවිය. එහිලා වඩාත් සවිස්තර විවරණ විග්‍රහ අප අතින් ලියැවී පළවූ ග්‍රන්ථ කීපයක ඇතුළත් වී ඇත.[1]

දෙසුම් පෙළ නිමකොට සත්වසරකට පසු "නිවනේ නිවීම" නමින් එළිදැක්වෙන මෙම ග්‍රන්ථයෙන් යම් ශාසනාර්ථයක් ඉටු වෙතොත් එයින් ජනිත කුශල සම්භාරය දෙසුම්පෙළට ඇරැයුම් කොට වදාළ අප ගුරුදේවයන් වහන්සේ වූ මීතිරිගල නිස්සරණ වන සේනාසනාධිපතිව වැඩවිසූ අතිපූජනීය මහෝපාධ්‍යාය මාතර ශ්‍රී ඥානාරාම මාහිමිපාණන් වහන්සේ අනුමෝදන්

---

1 * 1 Concept and Reality in Early Buddhist Thought - (1971)
* 2 Samyutta Nikaya - An Anthology Part II - (Wheel No. 183/185)
* 3 Ideal Solitude - Wheel No. 188
* 4 උත්තරීතර හුදෙකලාව - (දම්සක් අංක 172/173)
* 5 The Magic of the Mind - (1974)
6 Towards Calm and Insight-Printed for free distribution by J.Alwis
* Published by Buddhist Publication Society. P.O. Box 61, Kandy
බෞද්ධ ග්‍රන්ථ ප්‍රකාශන සමිතිය, තැ.පෙ. 61. මහනුවර

වන සේක්වා! ඒ දුර්ලභ ගුරු ඇසුර ලබාගැනීමට මඟපෑදූ ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ සමුත්පාදක අතිපූජනීය පණ්ඩිත කඩවැද්දුවේ ශ්‍රී ජිනවංශ මාහිමිපාණන් වහන්සේටත් අතිපූජනීය නාඋයනේ අරියධම්ම මාහිමිපාණන් වහන්සේටත් මෙම ධර්මදානමය කුශලය හිමිවේවා!

පටිගත වූ දෙසුම් 33 පිටපත් කිරීමේ භාරදූර කාර්ය මහත් පරිශ්‍රමයකින් ඉටුකළ හඳුරුදෙණියේ පියදස්සන හිමියන්ටද, සම්පූර්ණ ශුද්ධි ආදියෙන් පසුව එම අත්පිටපත මුද්‍රණය සඳහා සකස් කර දුන් පූජ්‍ය උඩවේරියගම ධම්මජීව, පූජ්‍ය මහයායේ ධම්ම සුනෙත්ත යන හිමිවරුන්ටද දෙසුම් පටිගත කිරීම පිටපත් කිරීම් ආදී කටයුතුවලට සහායවූ හැමදෙනා වහන්සේලාටද මෙම ධර්මදානමය පින පරම ශාන්ත නිර්වාණාවබෝධය පිණිසම වේවා! එමෙන්ම, අවශ්‍ය අවස්ථාවලදී කැසට් පටි සපයාදීමෙන් හා ලිපි ද්‍රව්‍ය, ඡායා පිටපත් ලබාදීමෙන් අනුග්‍රහය දැක්වූ ඩඩ්ලි ප්‍රනාන්දු මහතා ප්‍රධාන ඩී. එච්. පී. මුණවීර සහ සමාගමේ කාර්යමණ්ඩලයටද අපගේ පුණ්‍යානුමෝදනාව හිමිවේ.

අමිලවූ ධර්මය මිල කිරීමකින් තොපිරිහෙළා ධර්මකාමීන් අතට පත්කිරීම අපගේ අභිලාෂය විය. එහෙත් විශාල ග්‍රන්ථයක් බවට පත්වන මෙම දෙසුම් පෙළ එක්වරම බොහෝදෙනෙකුන් අතට පත් කිරීමේ දුෂ්කරතාව වටහාගෙන දෙසුම් 3 බැගින් වෙළුම් 11 ක් වශයෙන් එළි දැක්වීමට අදහස් කළෙමු. මේ අනුව යටත් පිරිසෙයින් දෙසුම් කිහිපයක් හෝ කියවීමට වැඩිදෙනෙකුට අවස්ථාව සැලසෙන අතරම ධර්මදානමය පුණ්‍ය කර්මයට බොහෝදෙනාගේ සහභාගීත්වයද ලැබෙනු ඇතැයි හඟිමු. එබැවින්, ග්‍රන්ථය නවමත් ශුද්ධිපත්‍ර අවස්ථාවේ පවතින නමුදු මෙසේ පළමු වෙළුම නිකුත් කිරීමට තීරණය කළෙමු. යථා කාලයේදී සම්පූර්ණ ග්‍රන්ථය පුස්තකාල මුද්‍රණයක් වශයෙන් අංග සම්පූර්ණව මුද්‍රණය කෙරෙනු ඇත. කෙසේ වෙතත්, 'නිවනේ නිවීම' වෙළුම් එකොළොසම පිළිවෙළින් එකතු කරගන්නා පාඨකයින්ගේ පහසුව තකා අවසන් වෙළුම සමඟ උපමා ඉගිවැලක් හා ගාථා ඉගිවැලක් ද සහිත 'පදයතුරක්' (අනුක්‍රමණිකාවක්) නිකුත් කිරීමට බලාපොරොත්තු වෙමු. එම පදයතුර සකස් කිරීමේදී අපට සහාය වූ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස් උපාලි ජයනෙත්ති මහතාට ඒ පින නිවන් දොර ඇරෙන යතුරක්ම වේවායි පතමු.

ග්‍රන්ථ මුද්‍රණයෙහිලා මුද්‍රණාලය හා අවශ්‍ය සම්බන්ධීකරණය පිළිබඳ සම්පූර්ණ වගකීම භාරගෙන විශේෂ කැපවීමකින් ග්‍රන්ථය එළිදැක්වීමට කටයුතු කරන මහාභාරකාර කැත්පත් ශු. මාපා මහතාට මෙම ධර්මදානමය කුශලය ස්වකීය ධර්ම ප්‍රාර්ථනා ඉෂ්ට කරගැනීම පිණිස හේතුවාසනා වේවා! එසේම, වෙළුම් එකොළොසකින් නිමාවන ග්‍රන්ථයෙහි බරපැන, 'බර පැනයක්' නොවනු පිණිස 'ධර්මග්‍රන්ථ මුද්‍රණ භාරය' නමින් විශේෂ අරමුදලක් පිහිටුවීමෙන් පුරෝගාමීවූ පින්වත් ජී.ජී. බණ්ඩාර මහතාට එම

ආදර්ශවත් පරිත්‍යාගයෙන් ජනිත කුශලය පරම ශාන්තවූ 'නිවනේ නිවීම' පසක් කරගැනීමට උපනිශ්‍රය වේවායි! යි පතමු. මුද්‍රණ භාරයේ හිරණ්‍යාත්මක අවසාන අදියර සඳහා පූර්ණ සහයෝගය දෙන කරුණාරත්න සහ පුත්‍ර සමාගමේ කාර්ය මණ්ඩලයටද අපගේ පුණ්‍යානුමෝදනාව හිමි විය යුතුව ඇත.

මෙයට

සදහම් ලැදි,

**කටුකුරුන්දේ ඤාණානන්ද භික්ෂු**

**පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය**
**'පහන් කණුව'**
**කන්දේගෙදර**
**දේවාලේගම**

**(25 41) 1997 ජූලි 1**

## නිවනේ නිවීම පළමු වෙළුම - පස්වන මුද්‍රණය

මෙම පස්වන මුද්‍රණයේ මුද්‍රණ කටයුතු මැනවින් නිමකළ "කොලිටි ප්‍රින්ටර්ස්" සමාගමේ සී.ජයසෝම මහතා ඇතුළු සැමටද අපගේ පුණ්‍යානුමෝදනාව හිමිවේ.

සම්පාදක

(2550) 2006 දෙසැම්බර්

# ප්‍රකාශක නිවේදනය

අතිපූජ්‍ය කටුකුරුන්දේ ඤාණනන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ "නිවනේ නිවීම" දේශනා මුද්‍රණය කොට, ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයහට එම දහම් පොත් ලබාදීමේ මූලික අදහස අප තුළ ඇතිවී මුත්, මුද්‍රණය සඳහා වැය වන මුදල උපයා ගැන්ම ප්‍රශ්නයක් විය. එය විසඳීම පිණිස අප කිහිප දෙනෙක් යෝජනා කළේ වැයවන මුද්‍රණ වියදම පමණක් අය කර ගැන්මට ප්‍රමාණවත් වූ මිලකට එම දහම් පොත් විකිණීමයි. එහෙත්, අපගේ එම යෝජනාව ගරු ඤාණනන්ද ස්වාමීන් වහන්සේ එකහෙලා ප්‍රතික්ෂේප කරමින් "ධර්මය මිල කරන්න බැහැ, එය අවශ්‍ය අයහට නොමිලේ ලබා ගැන්මට හැකිවිය යුතුයි..." කීහ.

එබැවින් උන්වහන්සේ අදහස් කළ පරිදි මුලින්ම මුද්‍රණය කල "නිවනේ නිවීම" දේශනා මාලාව සඳහා වියදම් ලබා ගැන්මේ වැඩ පිළිවෙලක් වශයෙන් රෝයල් ඉන්ස්ටිටියුට් හි අධිපති ජී.ටී.බණ්ඩාර මහතා විසින් මහා භාරකාර දෙපාර්තමේන්තුවෙහි "ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය" නමින් අරමුදලක් අරඹනු ලැබීය. එවකට මහා භාරකාර ධූරය දැරූ ශ්‍රී. මාපා මහතාගේ අදහසක් අනුව පිහිටුවන ලද එකී භාරයෙහි අරමුණ වූයේ මෙම පුණ්‍ය ක්‍රියාව ඉටුකර ගැනීම සඳහා දායක වීමට කැමති අය හට මුදලින් කෙරෙන තම පුණ්‍යාධාර එම භාරයට බැර කිරීමට අවස්ථාව සලසා දීමයි.

1997 වසරේදී ඇරඹුනු මෙම ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය මගින් පූජ්‍ය ඤාණනන්ද හිමියන්ගේ දේශනා 33 කින් යුත් "නිවනේ නිවීම" වෙළුම් 11 කින් මුද්‍රණය කොට නොමිලේ බෙදා දීමට අමතරව පසලොස්වක පොහෝ දිනයන්හිදී පහන් කණුව සෙනසුන වෙත රැස්වෙන උපාසක උපාසිකාවන් සඳහා උන්වහන්සේ විසින් කෙරෙන ධර්ම දේශනා "පහන් කණුව ධර්ම දේශනා" නමින් මේ වන විට ග්‍රන්ථ 6ක් පළකොට තිබේ. එතැනින් නොනැවතී උන්වහන්සේගේ අනෙකුත් සිංහල සහ ඉංග්‍රීසි ග්‍රන්ථද එසේම ධර්ම දාන වශයෙන් පළකිරීමට හැකිවීම ඊට දායක වූ අප සැමගේ ඉමහත් සතුටට හේතුවිය.

අති පූජ්‍ය ඤාණනන්ද ස්වාමීන් වහන්සේගේ එම ධර්ම දේශනා අගයමින් එම සත්කාර්යය නොනවත්වා කරගෙන යෑම පිණිස දායක භවතුන්ගෙන් අප වෙත ලැබෙන පැසසුම් සහිත ප්‍රතිචාරය නිසාම ඒ අයගේ පහසුව පිණිස අප විසින් මෑතකදී "ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය" නමින් සම්පත් බැංකුවේ නුගේගොඩ ශාඛාවේ අංක 0003 6000 1415 දරණ ජංගම ගිණුම විවෘත කරන ලදී.

අති පූජ්‍ය කටුකුරුන්දේ ඤාණනන්ද හිමියන් විසින් පහදා දෙනු ලබන නිර්මල බුදු දහම ඔබ අතට පත් කිරීම අපගේ එකම අරමුණයි. ඊට ඔබගෙන් ලැබෙන දායකත්වය ඉමහත් කුශලයකි. අපට ඉමහත් ධෛර්යයකි.

මෙම වටිනා ග්‍රන්ථ මුද්‍රණය කොට බෙදා හැරීමේ සම්පූර්ණ කාර්යභාරය ජී.ටී. බණ්ඩාර මහතා විසින් රෝයල් ඉන්ස්ටිටියුට් හි පින්වත් නිලධාරීන්ගේ සහායද ඇතිව වෙහෙස මහන්සි නොබලා ඉටුකර දීම ගැන අපගේ බලවත් ප්‍රසාදය මෙහිලා විශේෂයෙන්ම සඳහන් කළයුතු වේ.

මෙයට,
සසුන් ලැදි
ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරකාර මණ්ඩලය

# ධම් ග්‍රන්ථ මුද්‍රණ භාරය මගින් පළකැරෙන ග්‍රන්ථ මුද්‍රණයට දායක වීම

අති පූජ්‍ය කටුකුරුන්දේ ඤාණනන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් දේශිත නිර්මල බුදු දහම, "නිවනේ නිවීම" සහ "පහන් කණුව ධර්ම දේශනා" නමින් පළ වී ඇති දහම් පොත් තුළින් මේ වන විටත් ඔබ ඇතැම් විට කියවා තිබිය හැක.

එම ස්වාමීන් වහන්සේගේ ධර්ම දේශනා හැකි පමණ මුද්‍රණය කොට නොමිලේ බෙදා දීම ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරයේ අරමුණයි.

මෙතෙක් එම භාරය මගින් පළකොට ඇති ධර්ම ග්‍රන්ථ එකී ග්‍රන්ථ වල අවසාන පිටුවෙහි දක්වා ඇත.

මෙම මහඟු පුණ්‍ය ක්‍රියාව සඳහා දායක වීමට කැමති පින්වතුන්, පහත සඳහන් උපදෙස් පිළිපැදීම මැනවි.

1. චෙක්පත්/මුදල් ඇනවුම් මගින් එවන සියලු ආධාර "ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය" නමින් සම්පත් බැංකුවේ නුගේගොඩ ශාඛාවේ අංක 0003 6000 1415 දරණ ගිණුමට බැර කිරීම පිණිස පහත සඳහන් ලිපිනයට එවිය හැකිය.
2. දිවයිනේ පිහිටි ඕනෑම සම්පත් බැංකු ශාඛාවක් මගින් ඔබගේ ආධාර මුදල් ඉහත සඳහන් ගිණුමට බැර කල හැක.
3. කෙසේ වුවද, ඔබගේ පහසුව පිණිස සියලු පුණ්‍යාධාර කොළඹ 05, හැව්ලොක් පාරේ අංක 191 හි පිහිටි රෝයල් ඉන්ස්ටිටියුට් ආයතනයේ ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය වෙනුවෙන් පිහිටුවා ඇති අංශයටද බාර දියහැක.
4. මෙම භාරය මගින් නිකුත් කැරෙන ධර්ම ග්‍රන්ථ මගින් ඔබගේ දායකත්වය වරින් වර දායක භවතුන්ගේ දැනගැන්ම සඳහා පළ කරනු ඇත.
5. ඔබ විසින් කරනු ලබන ආධාරය බැංකු ගිණුමට බැර කරන විට ඒ සඳහා නිකුත් කරනු ලබන කුවිතාන්සියෙහි ඡායා පිටපතක් පහත සඳහන් ලිපිනයට එවීමෙන් මෙම ධර්ම දානමය කටයුත්තට දායක වන ඔබගේ නම සහ දායක මුදල අප විසින් වරින් වර පළ කරන දායක ලැයිස්තුවෙහි ඇතුළත් කිරීම කළ හැකිය.


ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය
රෝයල් ඉන්ස්ටිටියුට්
අංක 191, හැව්ලොක් පාර
කොළඹ 05

# අමා ගඟ

මහවැලි ගඟ උතුරට හැරවීමෙන් පසු එතෙක් නිසරු මුඩු බිම් ලෙස පැවති පෙදෙස්වල සිදුවූයේ ඉමහත් වෙනසෙකි. පිපාසයට පැන්බිඳක් නොලබා සිටි ගොවිහු පෙදෙස පුරා නිහඬව ගලා යන සිසිල් දිය දහරින් පිනා ගියහ. මැලවුනු ගොයම් සරුව නිල්වන්ව කරලින් බර විය. මල් පලින් ගැවසීගත් තුරු-ලිය බලා සැනසෙන පෙදෙස් වැසියෝ තුටු කඳුළු වගුළහ.

දහම් අමා ගඟ "උතුරට" හැරවීමේ වැඩ පිළිවෙළක් මෙයට කෙවසරකට පෙර ඇරඹුණි. දහම් පත-පොත කබා "එදා-වේල" සඳහා වත් විය පැහැදම් කිරීමට වත්-කමක් නැත්තෝ, නිහඬව හොම්ලයේ ගලායන අමිල දහම් අමා දිය දහරින් සදහම් පිපාසය සන්සිඳුවා ගත්හ. අරිටු මිසදිටු හැර, සැදැහැයෙන් සරුව, ගුණ නුවණින් බරව පිළිවෙත් මඟට නැමී ගත්හ. ලොවී - ලොවුතුරු මල් පල නෙලා ගනිමින් හද පුරා පිරි බැතියෙන් තන් අයුරින් සොම්නස පළකළහ.

"ධම් ග්‍රන්ථ මුද්‍රණ භාරය" නමින් දියත් කළ මෙම ධම්දාන වැඩපිළිවෙල සඳහා අපගෙන් වැයවූයේ පිරිසිදු ධම්දාන සංකල්පය පමණි. අමාගඟ "උතුරට" හැරවූවෝ සසුන් ගුණ හඳුනන පරිත්‍යාගශීලී සැදැහැවත්හුමය. "නිවනේ නිවීම" පොත් පෙළ එළි දැක්වීමෙන් නොනැවතී "පහන් කණුව ධම්දේශනා" පොත් පෙළෙහි "බර පැන" දැරීමටත්, දෙස් - විදෙස්වල දහම් පිපාසිතයින් උදෙසා අප අතින් ලියැවෙන අනිකුත් පොත - පත ඒ අයුරින්ම එළි දැක්වීමටත් ඔවුහු උත්සුක වූහ. "දෙන දේ පිරිසිදුවම දීමේ" අදහසින් අමිල වූ දහම ඊට නිසි ශෝභන මුද්‍රණයකින්ම ධම්කාමීන් අතට පත් කිරීමට පියවර ගත්හ. මුද්‍රිත පිටපත් සංඛ්‍යාව අවසන්වනු හා සමගම "නැවත මුද්‍රණ" පළකිරීමෙන් දහම් අමා ගඟ වියළී යා නොදීමට දැඩි අදිටනකින් ඇප කැපවූහ.

"පොත් අලෙවිය" පිළිබඳව මෙකල බහුලව දක්නට ලැබෙන වාණිජ සංකල්පයට පිටුපා, තහංචිවලින් තොරව, තමන් අතට හොම්ලයේම පත් කැරෙන "දහම් පඬුර" තුළින් ධම්දාන සංකල්පයෙහි අගය වටහා ගත් බොහෝ පාඨක පින්වත්හු තමන් ලද රස අහරක්, නෑ-හිතවතුන් සමග බෙදා-හදා ගන්නාක් මෙන් නොමසුරුව අන් දහම් ලැදියනටද දී ධම් දානයට සහභාගී වූහ. ඉඳුද නොනැවතී, ශක්ති පමණින් "ධම් ග්‍රන්ථ මුද්‍රණභාරයට" උරදීමටද ඉදිරිපත්වූහ, ඇතැමෙක් ලොකු කුඩා දහම් පොත්

මුද්‍රණය කරවීමේ හා නැවත-නැවත මුද්‍රණය කරවීමේ බරපැන ඉසිලීමට පවා පසුබට නොවූහ.

සම්බුදු සසුන මේ ලක් පොළොවෙහි පවතින තාක් මේ දහම් අමාගඟ ලෝ සතුන් සිත් සනහමින් නොසිඳී ගලා යේවා යනු අපගේ පැතුමයි.

"සබ්බදානං ධම්මදානං ජිනාති"

මෙයට,

සසුන් ලැදි
**කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු**

පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
'පහන් කණුව'
කන්දේගෙදර, දේවාලේගම

2000 ජුනි 05 (2544 පොසොන්)

# ග්‍රන්ථ සංකේත නිරූපණය

මහා. - මහා වග්ග පාළි

දී.නි. - දීඝ නිකාය

ම.නි. - මජ්ඣිම නිකාය

සං.නි. - සංයුත්ත නිකාය

අං.නි. - අංගුත්තර නිකාය

ඛු.නි. - ඛුද්දක නිකාය

ධ.ප. - ධම්මපද

උදා. - උදාන

ඉති. - ඉතිවුත්තක

සු.නි. - සුත්තනිපාත

ථෙර. - ථෙරගාථා

ථෙරී. - ථෙරීගාථා

මහානි. - මහා නිද්දෙස

චූ.නි. - චූලල නිද්දෙස

නෙත්ති - නෙත්තිප්පකරණ

සු.වි. - සුමඞ්ගලවිලාසිනී (දීඝ නිකාය අටුවාව)

ප.සූ. - පපඤ්චසූදනී (මජ්ඣිම නිකාය අටුවාව)

සා.ප. - සාරත්ථප්පකාසිනී (සංයුත්ත නිකාය අටුවාව)

මනො. - මනොරථපූරණී (අංගුත්තර නිකාය අටුවාව)

ධ.අ. - ධම්මපදට්ඨ කථා

ප.ජෝ. - පරමත්ථජෝතිකා

ජා.අ. - ජාතකට්ඨකථා

ප.දී. - පරමත්ථදීපනී

වි.ම. - විසුද්ධිමග්ග

බු.ජ. - බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා

හේ.මු. - සයිමන් හේවාවිතාරණ මුද්‍රණය

# 13 වන
# දේශනය

# 13 වන දේශනය

"නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස"

'එතං සන්තං එතං පණීතං යදිදං සබ්බසංඛාරසමථො සබ්බූපධි පටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං

'මෙය ශාන්තය මෙය ප්‍රණීතය එනම් සියලු සංස්කාරයන්ගේ සංසිඳීම සියලු උපධීන් අතහැරදැමීම, තණ්හාව ක්ෂය කිරීම, නොඇල්ම නම් වූ විරාගය, නැවැත්ම නම් වූ නිරෝධය, නිවීම නම් වූ නිබ්බානය'

**අතිපූජනීය මහෝපාධ්‍යාය මාහිමීපාණන්වහන්සේ ප්‍රධාන ගරුතර යෝගාවචර මහා සංඝරත්නයෙන් අවසරයි. නිබ්බාන යන මාතෘකාව යටතේ පවත්වනු ලබනු දේශනාමාලාවේ දහතුන් වන දේශනයයි මේ.**

මජ්ඣිම නිකායේ පළමුවන සූත්‍රය වන මූලපරියාය සූත්‍රයේ අඩංගු වන 'සබ්බධම්ම මූලපරියාය' කියන මාතෘකාව-හැම දේකම මූලික ආකාරය, මූලික ආකෘතිය කියන මාතෘකාව- යටතේ අපි යම්කිසි විග්‍රහයක් ගියවර දේශනයේදී කළා. ඒ සූත්‍රයේ පඨවි ආපො තෙජො වායො ආදී සංකල්ප 24ක් පිළිබඳව ආකල්ප තුනක් ඇතුළත් වන බව එද අපි සඳහන් කළා. නමුත් එයින් ආකල්ප දෙකක් පමණයි අපට එද විග්‍රහකරන්නට ලැබුනේ. එනම්, අශ්‍රැතවත් පෘථග්ජනයාගේ ලෝකදර්ශනයත්, එහෙම නැත්නම් ආකල්පයත්, සෙඛතත්ත්වයේ සිටින ආර්ය පුද්ගලයාගේ ආකල්පයත් පමණයි අපට එද සඳහන් කරන්න පුළුවන් උනේ.

අද පළමුවෙන්ම තුන්වෙනි ආකල්පය වශයෙන් සූත්‍රයේ දැක්වෙන රහතන් වහන්සේගේත්, තථාගතයන් වහන්සේගේත් - ඒ දර්ශන දෙකම එකයි - ඒ ආකල්පය පළමුවෙන්ම මතුකර ගනිමු. ඒ සූත්‍රයේ අවශ්‍ය පාළි වචන ටික, ඒ විශේෂ ආකල්පය පෙන්නුම් කරන වචන ටික, තියෙන්නෙ මෙන්න මෙහෙමයි. 'පඨවිං පඨවිතො අභිජානාති, පඨවිං පඨවිතො අභිඤ්ඤාය පඨවිං න මඤ්ඤති, පඨවියා න මඤ්ඤති, පඨවිතො න මඤ්ඤති, පඨවිං මෙති න මඤ්ඤති පඨවිං නාභිනන්දති, තං කිස්ස හෙතු පරිඤ්ඤාතං තස්සාති වදාමි'. ඒ ටිකේ අර්ථය - තථාගතයන් වහන්සේත්, රහතන්වහන්සේත්, 'පඨවිං පඨවිතො අභිජානාති' - පෘථිවිය, පෘථිවිය වශයෙන් විශිෂ්ට ඥානයෙන් දැනගනියි 'පඨවිං පඨවිතො අභිඤ්ඤය' - පෘථිවිය පෘථිවිය වශයෙන්

විශිෂ්ට ඥානයෙන් තේරුම් අරගෙන 'පඨවිං න මඤ්ඤති' - පෘථිවිය යයි නොහඟී. කල්පනා නොකරයි. 'පඨවියා න මඤ්ඤති' - පෘථිවියෙහි යයි නොහඟී. 'පඨවිතො න මඤ්ඤති- පෘථිවියෙන් යයි නොහඟී. 'පඨවිං මෙති න මඤ්ඤති' - පෘථිවිය මගේ යයි නොහඟී'' පඨවිං නාභිනන්දති' පෘථිවිය පිළිබඳ සතුටක් ඇතිකර නොගනී'. තංකිස්ස හෙතු' ඒ කවර හෙයින්ද 'පරිඤ්ඤාතං තස්සාති - උන්වහන්සේ විසින් එය පිරිසිඳ දැන ගන්නා ලද නිසාය.

දැන් අපි මේ ආකල්ප තුන සංසන්දනය කරන්න බලමු. ඒ එක්කම මේ එක එකක් තවදුරටත් අපට සවිස්තරව තේරුම් ගන්නත් පුළුවන් වෙනව. අශ්‍රැතවත් පෘථග්ජනය අර පඨවි ආපො තෙජො වායො ආදී ඒ සංකල්ප 24ත් - ඒව 24ක් දක්වල තියෙන්නෙ නිදර්ශන වශයෙනුයි - එබඳු ඒ මනසට අරමුණුවන යම්කිසි ධර්මයක් පිළිබඳව, දැන් පෘථිවිය කියල ගත්තොත්, පඨවිය පඨවිත්වයෙන් හඳුනගන්නව. පඨවිය පඨවියක් හැටියටම හඳුනගන්නව. සමහර විට හිම කැටයක් වෙන්න පුළුවනි. ඒක තදට දැනෙන නිසා ඒක පඨවිය කියල අල්ලගන්නව. ඔන්න ඔය විදියට ඒ සංඥව විතරයි, පෘථග්ජන පුද්ගලයට අවබෝධය පිළිබඳව උපකාර වෙන්නෙ. පෘථිවිය පෘථිවිය වශයෙන් හඳුනගෙන ඊළඟට 'පඨවිං මඤ්ඤති' අන්න අර මඤ්ඤනා කියන වචනයේ විශේෂත්වය තියෙන්නෙ මමත්වයක් මුල්කරගෙන හඟින එකයි. 'පෘථිවිය යයි හඟියි. 'ඊළඟට 'පඨවියා මඤ්ඤති'-පෘථිවියෙහි යයි හඟියි. පෘථිවියෙන් යයි හඟියි. පෘථිවිය මගේ යයි හඟියි. පෘථිවිය පිළිබඳව සතුට ඇතිකරගනී. මෙතන අපට දකින්න ලැබෙනව ව්‍යාකරණයෙ තිබෙන විභක්ති රූප. ඇත්ත වශයෙන් මේ ව්‍යාකරණය කියන එක ලෝකයා ඇතිකරගන්නෙ අපි කලිනුත් සඳහන් කළා, කෙලෙස් සහිත පුද්ගලයින්ගේ අදහස් හුවමාරු කිරීමට, සක්කාය දිට්ඨියට යටවෙලා සිටින ඒ සත්ත්වයින් අතර තමන්ට ඇතිවන සංකල්ප තමා හා සමාන අදහස් ඇති පුද්ගලයින් සමඟ හුවමාරු කර ගැනීමටයි. ඒක නිසා ඒකට ගැලපෙන එකක් තමයි මේ ව්‍යාකරණය කියන එක. මේ ව්‍යාකරණය තුළ දක්නට ලැබෙනව යම් යම් මිථ්‍යාවල්. දැන් මෙතැන ඒවයින් කීපයක් එළියට අරගෙන තියෙන්නෙ. 'පඨවිං මඤ්ඤති'- මේක දුතියා විභක්තිය හැටියට ගන්නත් පුළුවන්. විභක්ති රූප වශයෙන් ගන්න පුළුවනි. නාම පදයක් හැටියට සළකා ගන්නව. ඇත්තවශයෙන්ම නාම පදයක් හැටියට. ඊළඟට 'පඨවියා මඤ්ඤති පෘථිවියෙහි යයි හඟී - සත්තමී- සමහරවිට ඒක ආධාර විභක්තිය හැටියට ගන්න පුළුවනි. ඊළඟට පඨවිං මෙති මඤ්ඤති' පෘථිවිය මගෙයි, ඒ කියන්නෙ මාත් පෘථිවියත් අතර සම්බන්ධතාවක් තියෙනව, ආදී වශයෙන් කල්පනා කරන්න පුළුවන්. එහෙම කල්පනා කරනකොට අර මඤ්ඤනාවන් නිසාම පෘථිවිය ඇත්තවශයෙන්ම තිබෙන දෙයක්. ඒකට 'සද්'

භාවයක් ආරෝපනය කෙරෙනව. සත්තාවක්, සත්භාවයක්, ඇති බවක්, සැබෑබවක්, ඒ පෘථිවියට ආරෝපනය කෙරෙනව. ඒක නිසා මඤ්ඤනාවලින් කෙරෙන්නෙ ඒක තහවුරු වීමක්. පඨවිය පිළිබඳව ගත්තු අදහස තහවුරු වෙනව. ඒ තහවුරු වුනාට පස්සේ ඒ පිළිබඳව අභිනන්දනය, ඒ පිළිබඳව සතුටු වෙනව. ඔන්න ඕකයි එතකොට අශ්‍රැතවත් පෘථග්ජනයගේ ලෝක දර්ශනය. ශෛක්ෂ පුද්ගලය පිළිබඳව අපි එද සඳහන් කළා 'පඨවිං පඨවිතො අභිජානාති' පෘථිවිය පෘථිවිය වශයෙන් විශිෂ්ට ඥානයකින්- සංඥාවෙන් නොවෙයි -විශිෂ්ට ඥානයකින්, එක්තරා අවබෝධයක් ලබාගන්නව. නමුත් සම්පූර්ණයෙන්ම මඤ්ඤනාවලින් මිදිල නැහැ. ඒක නිසා තමයි අපි එද සඳහන් කළා- ඒ ශෛක්ෂ පුද්ගලය පිළිබඳව අමුතු විදියෙ වචන කීපයක් සඳහන් වෙනව. 'පඨවිං මා මඤ්ඤි පඨවියා මා මඤ්ඤි පඨවිතො මා මඤ්ඤි 'පඨවිං මේ'ති මා මඤ්ඤි පඨවිං මාභිනන්දි' කියල. මෙතෙන්දි අපිට අටුවාවෙ දක්වපු විවරණයට වඩා වෙනස් යමක් කියන්න සිද්ධ උනා. මක්නිසාද අටුවාවෙ මේ 'මා මඤ්ඤි' කියන එක තේරුම්කරන්නෙ අර ශෛක්ෂ පුද්ගලයාට 'මඤ්ඤති' කියලවත් 'න මඤ්ඤති' කියලවත් කියන්න බැරි නිසා අඩාලබවක් හැඟවීමට මේ මා මඤ්ඤි' කියන එක යෙදුව කියල. නමුත් මෙතන පැහැදිලිවම පෙනෙනව 'මා' නිපාතය යොදන්නෙ වැළැක්වීම් අර්ථයෙන්, ප්‍රතිෂේධාර්ථයෙන්. 'මා මඤ්ඤි' කියන්නෙ මඤ්ඤනා නොකරව' එහෙම නැත්නම්, 'මා අභිනන්දි' කියන්නෙ සතුටු නොවෙව. මේ ශෛක්ෂ පුද්ගලයා පිළිබඳව විශේෂයෙන් කියන්නෙ ස්වයංශික්ෂණයක හැසිරෙනව ඒ පුද්ගලය. ශෛක්ෂ කියන වචනයෙන් කියන්නෙත් ශික්ෂණයක් ලබන කියන එකයි. ඒ කියන්නෙ අභිඤ්ඤ වශයෙන් යම්කිසි අවබෝධයක් ලබා ගත්ත. පරිඤ්ඤව තාම නැහැ. පිරිසිඳ දැනගත්තෙ නැහැ. ඒකට තමයි අර ශෛක්ෂ පුද්ගලය පිළිබඳව අවසාන කෙරෙන්නෙ තං කිස්ස හෙතු - 'පරිඤ්ඤෙය්‍යං තස්සාති වදාමි, - මක්නිසාද යත් ඒ ශෛක්ෂ පුද්ගලයා විසින් පරිඤ්ඤෙය්‍යං තස්ස- පිරිසිඳ දතයුතු නිසයි. දතයුතු නිසා ඒ ශික්ෂා මාර්ගයේ හැසිරෙනව. ඒ හැසිරෙන බව පෙන්නුම් කිරීමටයි 'මා' කියල යොදල තියෙන්නෙ, 'මා මඤ්ඤි' 'මා අභිනන්දි' වශයෙන්. ඒ කියන්නෙ ලෝකයා යොදගෙන තියෙන මේ ව්‍යාකරණ රටාව ඒ සෙඛ පුද්ගලයටත් පාවිච්චි කරන්න සිද්ධ වෙනව. ඒ නිසාම තවම අර අනුසය ආදිය ඉවර නැති නිසා ශෛක්ෂ තත්ත්වයේ සිටින පුද්ගලය ඒ පිළිබඳව, එක්තරා හික්මීමක් කරනව. නිතරම සතිය, ප්‍රඥව, යොදල අර ලෝකයාගේ ව්‍යාකරණ රටාවට අසුනොවෙන්ට උත්සාහ කරනව. අන්න ඒක හැඟවීමටයි 'මා මඤ්ඤි 'මා අභිනන්දි' ආදී වශයෙන් දක්වල තියෙන්නෙ. පඨවි, ආපො, තෙජො, වායො, ආදී ඒ සංකල්ප ගැන ලෝකයා එක්ක කථාකරනකොට, ව්‍යවහාරකරන කොට, ඒවාට යටවෙන්ට ඉඩ තියෙනව. ඒක නිසා සතිය ප්‍රඥව මුල්කරගෙන අර ලබාගත්තු අභිඤ්ඤවෙ- විශිෂ්ට ඥනයෙ - පිහිටෙන් පරිඤ්ඤව දක්වා ගමන් කිරීමට

උත්සාහකරනවා. අන්න ඒකයි මෙතන මේ 'ස්වයංශික්ෂණය'. ඒ ශෛක්‍ෂ පුද්ගලයා පිළිබඳව කියනව 'අත්තගුත්තො' තමාම ආරක්‍ෂාවෙන්න උත්සාහකරන පුද්ගලයෙක්. ඒක නිසා ඒ ස්වයංශික්ෂණය දැක්වීමටයි මා මඤ්ඤි' ආදිය යෙදුනෙ. අටුවාවෙ දක්වපු විවරණයට වඩා යමක් අපට කියන්න සිද්ධඋනා. එතකොට ඒ සෙඛ පුද්ගලයා පිළිබඳව ඒ විදියේ තත්ත්වයක් තියෙනව.

ඊළඟට රහතන්වහන්සේත්, තථාගතයන් වහන්සේත්. උන්වහන්සේලා දෙනමගේම ලෝක දර්ශනය එකයි. ඒ කියන්නෙ අර පඨවිය පිළිබඳව අභිඤ්ඤ වශයෙනුත්, දැනීමක් තියෙනව. පරිඤ්ඤ වශයෙනුත් තියෙනව. 'පරිඤ්ඤාතං තස්සාති වදාමි' - සම්පූර්ණයෙන්ම පිරිසිඳ දැන ගෙන - ඒක නිසා කිසිසේත් ලෝකයාගේ ව්‍යාකරණ රටාවට යට වෙන්නෙ නැහැ. ලෝකයාගේ ව්‍යවහාරය පාවිච්චි කරනව. අර බබාගේ භාෂාව කථාකරන දෙමව්පියන් වගේ. නමුත් ඒකට යටවෙන්නේ නැහැ. 'මඤ්ඤනා' වශයෙන් ඇතුළත බැඳීමක් ඇතිවෙන්නෙ නැහැ. තණ්හා මාන දිට්ඨි වශයෙන් ඇලී වෙළී පැටලීමක් නැහැ. කෙටියෙන් කියතොත් තණ්හාවෙන් ඇලීමක්, මානයෙන් වෙළීමක්, දිට්ඨියෙන් පැටලීමක් නැහැ, අර සංකල්ප පිළිබඳව. අන්න එතකොට අපට හිතාගන්න පුළුවනි මේ මූලපරියාය සූත්‍රයේ ඇති වැදගත්කම. මේක මජ්ඣිම නිකායෙ මුලට යෙදුවෙ මක්නිසාද කියලත් හිතාගන්න පුළුවනි. බෞද්ධ දර්ශනයෙ - බුදුපියාණන්වහන්සේගේ පරියාය දේශනාවෙ - තිබෙන වචන එහෙම තේරුම් ගතයුතු ආකාරය හැඳින්වීමට අර හෝඩිය වගේ මේ මුල්ම සූත්‍රය ඉදිරිපත් කරල තිබෙනව. මජ්ඣිමනිකාය විශේෂයෙන්ම ගැඹුරු සූත්‍ර අඩංගු ග්‍රන්ථයක්.

අපි ඒ විදියට කල්පනාකරනකොට හිතාගන්න පුළුවනි අභිඤ්ඤවත් පරිඤ්ඤවත් දෙකම අවශ්‍ය බව. අපි මෙතනදී දැක්වුව, ව්‍යාකරණ රටාවට සම්බන්ධයක් තිබෙන බව මේ සූත්‍රයෙ. මේ ව්‍යාකරණ රටාවත් මඤ්ඤනා විධියත් අතර සම්බන්ධතාව නොතැකීම නිසාදෝ අටුවාචාරීන්වහන්සේට එක්තරා ගැටලුවක් ඉදිරිපත් වුනා මේ විවරණය කරගෙන යද්දී. ඒ කියන්නෙ, හැමතැනම සඳහන් වෙනව 'පඨවිං මඤ්ඤති' 'පඨවියා මඤ්ඤති' ආදී වශයෙන්. එහෙම මඤ්ඤනා විධි කීපයක් සඳහන් වෙනව. ඒ හැම මඤ්ඤනා විධියක්ම අටුවාව තෝරන්නෙ තණ්හාමානදිට්ඨි වශයෙන් මඤ්ඤනා කරයි කියල. එහෙම තේරුම් කළාට පස්සෙ අර 'මා අභිනන්දි' කියන පාඨය අනවශ්‍ය එකක් හැටියට බුද්ධඝෝෂ ස්වාමීන්වහන්සේට පෙනී ගියා. ඒක පුනරුක්තියක්-කීදේ නැවත කීමක්. ඒක ඉතින් ප්‍රශ්නයක් හැටියට ඊළඟට ඉදිරිපත් කරනව, අටුවාවෙම. 'පඨවිං මඤ්ඤතීති එතෙනෙව එතස්මිං අත්ථෙ සිද්ධෙ කස්මා එවං වුත්තනන්ති වෙ අවිචාරිතමෙතං පොරාණෙහි. අයං පන මෙ අත්තනො මති. දෙසනා විලාසතො වා ආදීනව දස්සනතො

වා[1] ඒ කියන්නෙ අටුවාචාරීන්වහන්සේ මේ විදියටයි තමන්ගෙ ගැටලුව ඉදිපත්කරන්නෙ 'පඨවිං මඤ්ඤති' කියන මේ එක කියමනෙන්ම අවශ්‍ය කාරණය ඉටුවෙලා තිබෙද්දි මක්නිසාද මේ නැවතත් පඨවිං අභිනන්දති කියල කිව්වෙ? ඒ කියන්නෙ, තණ්හා මාන දිට්ඨි වශයෙන් මඤ්ඤනා කරනව නම්, තණ්හා කියල කියන්නෙ අභිනන්දනය. එතකොට එතන කියවිලත් ඉවරයි. ඇයි මේ අගට ආයිමත් 'පඨවිං අභිනන්දති' කියල යෙදුවෙ? ඉතින් ඒක පුනරුක්තියක් හැටියට - නැවත කීමක් හැටියට - අරගෙන මේක නැවත කීමක් වශයෙන් මේ සූත්‍රයෙ දක්වල තියෙන්නෙ මක්නිසාද කියල ප්‍රශ්නයක් නගනව. 'අවිචාරිතං එතං පොරාණෙහි'-මේ කාරණය මෙතන අපට විසඳල දීල නැහැ පැරණි ඇදුරන්. 'අයං පන මෙ අත්තනො මති' මේ මගේම මතයයි' කියල බුඩඝෝෂ ස්වාමීන්වහන්සේ තමන්ගෙ මතය දක්වනව. මොකක්ද විසඳුම? 'දෙසනා විලාසතො වා ආදීනව දස්සනතො වා' 'බුදුරජාණන්වහන්සේගේ දේශනා විලාසයක් පමණයි ඒක. එහෙම නැතිනම් අර මඤ්ඤනාවල තියෙන ආදීනව තවදුරටත් දැක්වීමට පමණයි'. නමුත් අපි දැන් දුන්නු මේ විවරණය අනුව, මේ ව්‍යාකරණ රටාවට සම්බන්ධ කරල දැක්වූ විවරණය අනුව, සමහරවිට අපට හිතාගන්න පුළුවනි 'මා අභිනන්දි' කියන එක යෙදුවෙ මක්නිසාද කියල. ඒ කියන්නෙ අර ව්‍යාකරණ රටාව මගින්, අර මඤ්ඤනා මගින්, එක් එක් සංකල්පය ඇත්ත වශයෙන්ම 'දෙයක්' බවට පත්වුනා. සිතිවිලි ලෝකයේ ඇත්තවශයෙන්ම ඒක'දෙයක්' හැටියට තහවුරුඋනා. තහවුරුඋනාට පස්සේ ඉතින් ඒ පිළිබඳව සතුටු වෙන්න පුළුවනි. ඇත්ත වශයෙන්ම ඒක 'දෙයක්' උනා. මේ මඤ්ඤනා වලින් කෙරෙන්නෙ 'දෙයක්' බවට පත්වීමයි.

මෙතන අපි තවදුරටත් විමසල බැලුවොත්, දැන්, ඔන්න ඉන්ද්‍රියසංවරය පිළිබඳව නිතර සූත්‍රවල සඳහන් වන කොටසක් තියෙනව. ඒකෙ සාමාන්‍ය අර්ථය සැළකුවහම මෙන්න මෙහෙමයි. කෙලෙස් සහිත පුද්ගලයා මනසත් ඇතුළු ඉන්ද්‍රියයන් හයෙන්ම නිමිති සහ අනුව්‍යංජන ගන්නව කියල සඳහන් වෙනව. ඒ නිමිති අනුව්‍යංජන ගැනීම නිසා ඒ පුද්ගලයා තුළට නොයෙකුත් විදියේ ආශ්‍රවයන් ගලාගෙන එනවයි කියලත් සඳහන් වෙනව, ඔය ඉන්ද්‍රිය සංවරය පිළිබඳව සඳහන් වෙන ඡේදවල. එතකොට අපට හිතාගන්න පුළුවනි දැන් මනසට අරමුණු වන ධම්මාරම්මණ පිළිබඳව නිමිති ගැනීම තමයි මෙන්න මේ මඤ්ඤනාමෙන් කෙරෙන්නෙ. ඒ කියන්නෙ මනසට අරමුණුවන 'ධම්මසඤ්ඤ'. යම්කිසි දෙයක් හැටියට - 'දෙයක්' කියන අදහසයි මේ 'ධම්ම' කියන වචනයෙන් හැඟෙන්නෙ - සබ්බධම්ම මූලපරියාය - හැමදෙයක්ම අවසානයෙ මනසටයි අරමුණුවන්නෙ. ඒ මනසට අරමුණු වන දෙය පිළිබඳව නිමිතිගැනීමක් තමයි මේ 'පඨවිං මඤ්ඤති' යන්නෙන් හැඟෙන්නෙ. ඊළඟට ඒ ගත්තු නිමිත්ත තවදුරටත් තහවුරු කෙරෙන

අනුව්‍යංජන වගේ තමයි ‘පඨවියා මඤ්ඤති’ ‘පඨවිතො මඤ්ඤති’ ‘පඨවිං මෙ’ති මඤ්ඤති’ ආදී වශයෙන් ප්‍රකල්පනය කිරීම, හිතීම. ‘පෘථිවියෙහි’ යයි හඟී. ‘පෘථිවියෙන්’ යයි හඟී. ‘පෘථිවිය මගේ’ යයි හඟී. මෙයින් තව දුරටත් තහවුරු වෙනව. නිමිති අනුව්‍යංජන කියන වචනදෙක ඉන්ද්‍රිය සංවරය පිළිබඳව සඳහන් වෙනකොට අපට තේරුම් ගන්න වෙන්නෙ මෙහෙමයි. දැන්, නිමිත්තෙන් කෙරෙන්නෙ යම්කිසි ඡායාමාත්‍රයක් වශයෙන් ‘මේක මෙහෙම වෙන්න ඇති’ කියල හිතාගැනීමක්. ඒක තහවුරුවෙනව අනුව්‍යංජන වලින්. ඒ නිමිත්ත අනුව ගන්න අවශේෂ ලක්ෂණ වලින්. ‘මේක මේකට ගැලපෙනව, මේක මේකට ගැලපෙනව. ඒක නිසා මං ගත්තු නිමිත්ත හරි.’ අන්න ඒ විදියට. අපිට ඔය අන්දමට තේරුම්ගන්න පුළුවනි අර ඉන්ද්‍රිය සංවරය පිළිබඳ ඡේදය ආශ්‍රයෙනුත්, මෙතන මඤ්ඤනාවල ඇති විශේෂත්වය, මේ මඤ්ඤනා යෙදිල තියෙන්නෙ මක්නිසාද කියල. ඒ එක්කම අපට පෙනෙනව, මේ ව්‍යාකරණ රටාව පිළිබඳව එක්තරා වැදගත් දර්ශනයක් බුදුපියාණන් වහන්සේ මෙතෙන්දි ඉදිරිපත්කරල තියෙනව, මේ සූත්‍රයෙන්. මේ ව්‍යාකරණ රටාව ලෝකසත්ත්වයාගේ නිත්‍ය සංඥව අනුව සිතිවිලි පරම්පරාව ගෙනයාමට, අදහස් හුවමාරුකර ගැනීමට, උපකාරවන හැටියට තනාගත්තු එකක්. මේ වචනවලට එක්තරා විදියක ‘පණක්’ එනව මෙයින්, මේ ව්‍යාකරණ රටාවෙන්. මේ පණගැන්වෙන ආකාරය අර නාමපද ආදී වශයෙන් ‘ඒක ඇතුළේ’ ‘එයින්’ කියල එහෙම ගත්තාම ඒ අනුවත් තේරුම් ගන්න පුළුවනි. සමහරවිට ව්‍යාකරණයෙ අගටම යෙදෙන ආලපන විභක්තියෙන් තේරුම්ගන්න පුළුවනි. ‘හෙ පඨවි’ කිව්ව හැටියෙ ‘එම්බා පඨවිය’. අර පඨවියට පණදීල අන්තිමට නැගිට්ටවන තරමට ‘එම්බා පඨවිය’ කියල කියන්නත් ඉඩක් තියෙනව ව්‍යාකරණයෙ. අපි කලින් සඳහන්කළා ව්‍යාඝ්‍රයකුගේ ඇටකටු එකතුකරල සම්බන්ධකරල මස්වලින් සම්පූර්ණකරල පණගැන්වුව කථාවක්. ඔන්න ඔහොම දෙයක් මේ ව්‍යාකරණ රටාවෙ තිබෙනව. මේ තත්ත්වය අපට මේ මූලපරියාය සූත්‍රය ආශ්‍රයෙන් එක්තරා විදියකට තේරුම් ගන්න පුළුවන්.

එතකොට මේ මඤ්ඤනාවල තිබෙන, සිත අල්ලා ගන්න ස්වභාවයක් නිසා, බුදුපියාණන්වහන්සේ මේ මූලපරියාය සූත්‍රය, සියලු ධර්මයන්ගේ මූලික ආකාරය එහෙම නැත්නම් මූලික ආකෘතිය වශයෙන් ලෝකයාට ඉදිරිපත් කරල තියෙනව, තුන් ආකාර ලෝකදර්ශනයක් හැටියට. එහෙම නැත්නම් පුද්ගලයන් තුන්දෙනෙකුගේ ලෝකදර්ශනයක් හැටියට. ඒ ව්‍යාකරණ රටාවට යටත්වන අශ්‍රැතවත් පෘථග්ජනයන්, ඒ ව්‍යාකරණ රටාවෙන්, ඒ ග්‍රහණයෙන්, මිදීමට උත්සාහ කරන ශේඛ පුද්ගලයන්, එයින් සම්පූර්ණයෙන්ම මිදුන විමුක්ත පුද්ගලයන්, ලෝක දර්ශනයන්, මූලපරියාය සූත්‍රයෙ සඳහන්වුනා. කලින් දවසෙ ඒ ලැයිස්තුවම දුන්න. සංකල්ප 24ක්. මේ 24න් අපි

විශේෂයෙන් සඳහන් කරන්න ඕන, අපේ මාතෘකාව අනුව, නිබ්බාන' කියන වචනයකුත් අගට යෙදිල තියෙනව.

මේ 'නිබ්බාන' කියන වචනය පිළිබඳවත් ලෝකයා සාමාන්‍යයෙන් එක්තරා විදියක මතදනාවක් ඇතිකරගැනීමට පෙළඹෙනව, සමහර දර්ශනිකයින් පවා. 'නිවනෙහි' 'නිවනින්' 'නිවනට ආවාම' ආදී වශයෙන්, 'නිවන මගේ' - ඔය ආදී වශයෙන් එක්තරා විදියක ප්‍රපඤ්ච මඤ්ඤනා ඇතිකරගන්න පෙළඹෙනව. මක්නිසාද නිවන යම්කිසි පදාර්ථයක් හැටියට ගැනීමෙන් නිවන පිළිබඳවත් පදාර්ථසංඥාවක් ඇතිකර ගන්නව. අර පඨවිය පිළිබඳව වගේ. මේක යුක්තියුක්තද කියලයි දැන් ඉතින් අපට විසඳන්න වෙන්නෙ. මේ නිබ්බාන කියන වචනයෙ මූලික අර්ථය **නිවීමයි**. අපි අර අග්ගිවච්ඡගොත්ත සූත්‍ර ආදියෙදි කලින් අවස්ථාවකත් සාකච්ඡා කරල තියෙනව. ඒ අවස්ථාවෙ බුදුපියාණන්වහන්සේ නිබ්බාන කියන වචනය වච්ඡගොත්ත පරිබ්‍රාජකයට තේරුම් කළේ ගින්නක නිවීම පිළිබඳ කාරණය අරගෙනයි. 'නිවීගියා' කිව්වාම කොහේ ගියාද කියල දන්නෙ නැතිව වගේ. ඒ ක්‍රියා පදයයි එතන තියෙන්නෙ. නිවීම කියන එක. එතන තියෙනව, ඒ වගේම 'නිබ්බුතොති සංඛං ගච්ඡති' කියල 'නිවුනේය යන සංඛ්‍යාවට වැටේ' මේ සංඛං' කියන වචනය අපි කලින් අවස්ථාවක සඳහන් කළා සංඛා කියල යොදන්නෙ - සංඛා' සමඤ්ඤා පඤ්ඤත්ති'- ගණන් ගනු ලැබේ කියල කියන්නෙ ව්‍යවහාර කරනු ලැබේ. හඳුන්වනු ලැබේ. කියන අර්ථයමයි. එතකොට 'නිවීම' කියන එක එක්තරා විදියක සංඛාවක්, සමඤ්ඤාවක්, පඤ්ඤත්තියක්. ඒ අග්ගිවච්ඡගොත්ත සූත්‍රය අනුව බලනකොට නම් නිබ්බාන කියන වචනය පඤ්ඤත්තියක් හැටියටයි අපට ගන්ට වෙන්නෙ. නමුත් මේ අටුවාචාරීන්වහන්සේ, විශේෂයෙන් ඒ ගැන සැළකිලිමත්වෙලා මූලපරියාය සූත්‍රයෙ අගට සඳහන්වන නිබ්බානය, අපේ නිබ්බානය නොවේය අන්‍යතීර්ථකයන් අතර ප්‍රකට නිබ්බානයක්ය මේ සූත්‍රයෙ සඳහන් වෙන්නෙ කියල විස්තර කරනව.

මොකද ඒකට හේතුව? මේ 'අපේ නිබ්බානය' බේරාගන්න. නමුත් ඒ විවරණය ගැලපෙන්නෙ නැහැ. මක්නිසාද? ශෛක්ෂ පුද්ගලයට කිසිසේත් අන්‍යතීර්ථකයන්ගේ නිබ්බානයක් පිළිබඳව මඤ්ඤනාවලින් වැළකී සිටීමට උත්සාහයක් දැරියයුතු නැහැ. ඒ අන්‍යතීර්ථකයන්ගේ නිබ්බානය පිළිබඳ සතුටක් ඇතිවීමෙන් වැළකීමට අවශ්‍යවන්නෙ නැහැ. මෙතන තියෙන්නෙ මේ 'අපේ නිබ්බානය' ගැනම තමයි. නමුත් මේ 'අපේ නිබ්බානය' පිළිබඳව රහතන්වහන්සේලා මොකද සතුටුවෙන්නෙ නැත්තෙ' කියන එක මේ අටුවාචාරීන් වහන්සේට තේරුම්ගන්න බැරිවෙන්න ඇති. තථාගතයන් වහන්සේ පිළිබඳව කියන ඒ කොටසේ සඳහන්වෙනව මෙන්න මෙහෙම - 'නිබ්බානං නාභිනන්දති තං කිස්ස හෙතු? නන්දි දුක්ඛස්ස මූලන්ති ඉති විදිත්වා

භවා ජාති භූතස්ස ජරාමරණං - නිබ්බානය පිළිබඳව සතුටු වෙන්නෙ නැහැ තථාගතයන් වහන්සේ. මක්නිසාද? නන්දි දුක්ඛස්ස මූලන්ති ඉති විදිත්වා - සතුටුවීම දුකට මුලයි. මොකද 'නන්දි' කියල කියන්නෙ තණ්හාවෙන් ඇතිකරගන්න උපාදානයක්. සමහරවිට උපාදන නමිනුත් සඳහන් වෙනව. යා වෙදනාසු නන්දි තදුපාදනං[2]' කියල. 'නන්දි' කියන්නෙ සතුටු වීමයි. සතුටුවීම එක්කම යනව උපාදනය. උපාදනය යම්තැනකද, එතන භවය, ඒක නිසා තමයි 'භවා ජාති භූතස්ස ජරාමරණං. අර නිබ්බාන සංකල්පය පවා ඒ ප්‍රඥප්තිය පවා සාමාන්‍යයෙන් අපේ මේ ශික්ෂණයට අරමුණක් හැටියට ඈතින් තියාගන්නව. නමුත් ඒක අල්ලගත්තොත්, පෘථිවිසංකල්පය වගේ, ඒ පිළිබඳව මඤ්ඤනාකරන්න ගියොත්, කවදවත් නිර්වාණය ප්‍රත්‍යක්ෂ කරගන්න බැහැ මක්නිසාද? මෙතන තියෙන්නෙ මේ හැම සංකල්ප වලින්ම මිදීමේ පුදුම ප්‍රතිපදවක්. 'නිස්සාය නිස්සාය ඔඝස්ස නිත්ථරණා[3] හැම එකක්ම උපකාර කරගන්නව. නමුත් අල්ලගන්නෙ නැහැ. බඳගන්නෙ නැහැ. තණ්හාමානදිට්ඨි වශයෙන් අල්ලාගැනීමක් නැහැ. අන්න ඒක නිසා තමයි තථාගතයන් වහන්සේ පිළිබඳව සඳහන්වෙනකොටත් 'නිබ්බානං නාභිනන්දති' කියල තියෙන්නෙ. නිවන පිළිබඳව සතුටුවන්නෙ නැහැ. එතකොට නිවන පිළිබඳව සතුටුඋනාම නරකද කියල අපට අහන්න පුළුවන්. ඒ නරකබව වෙන්න ඕන. කලින් දේශනයක අපි සඳහන් කළා සගාථ වග්ගයේ තියෙන එක්තරා කෙටි සංවාදයක්, බොහොම ලස්සන සංවාදයක්[4]. දේවතාවෙක් ඇවිල්ල බුදුපියාණන්වහන්සේගෙන් අහනව හිටිගමන්ම ගත්කටටම වගේ, 'නන්දසි සමණ' මහණ ඔබ සතුටු වන්නෙහිද? 'කිං ලද්ධා ආවුසො' - බුදුරජාණන්වහන්සේ ඒකට දෙන පිළිතුර 'කුමක් ලබාගත්තටද ඇවැත්නි?' ඊළඟට අහනව මේ දේවතාව, 'තෙනහි සමණ සොචසි'- 'එහෙනම් මහණ ඔබ දුක්වන්නෙහිද?' බුදුරජාණන්වහන්සේ ඒකටත් දෙන කෙටි පිළිතුර මොකක්ද?'කිං ජීයිත්ථාවුසො' - 'මොකක්ද ඇවැත්නි නැතිවුනේ'. 'තෙනහි සමණ නෙව නන්දසි න සොචසි' - ඔන්න ඊළඟට දේවතාව අහනව 'එහෙමනම් මහණ ඔබ සතුටුවන්නෙත් නැහැ දුක් වන්නෙත් නැහැ.' 'එවං ආවුසො' 'එසේය ඇවැත්නි'. ඔන්න ඔතනින් තේරෙනව නිවන පිළිබඳවත්, නිබ්බාන ප්‍රඥප්තිය පිළිබඳවත්, තථාගතයන් වහන්සේල, රහතුන් වහන්සේලා සතුටුවන්නෙ නැහැ. සතුටුවන්න දෙයක් නැහැ. උපේක්ෂාව තියෙන්නෙ එතන.

ඔන්න ඔය විදියට ගත්තොත් මේ මූලපරියාය සූත්‍රයෙ තියෙන නිබ්බානය අර අන්‍යතීර්ථකයන්ගෙ නිබ්බානයක් හැටියට ගතයුතු නැහැ. මෙතන තියෙන්නෙ මේ 'අපේ නිබ්බානයම' තමයි. නමුත් මේක පිළිබඳව ආකල්පය ඇත්තවශයෙන්ම වෙනස් විය යුතුයි, මේ මාර්ගයෙ යන අතරෙ. එහෙම නැතිව ඒක බඳගත්තොත්, පදර්ථයක් කරගත්තොත්, නිබ්බාන කියන

වචනය අංගසම්පූර්ණ නාමපදයක් හැටියට අරගෙන අල්ලගෙන, ඒ පිළිබඳව නොයෙකුත් විදියේ තර්ක විතර්ක ප්‍රපඤ්ච කරන්ට පටන් ගත්තොත්, ඒක 'අපේ නිබ්බානය' බවට හැරෙන්නෙ නැහැ. එතැන මිථ්‍යාදෘෂ්ටියට නැඹුරුවෙනව. ඒ දෘෂ්ටියෙන් මිදීමට හැකියාවක් ලැබෙන්නෙ නැහැ ඒකෙන්. අන්න ඒක නිසා මෙතන ඉතාම වැදගත් කාරණයක්. බොහොම දර්ශනිකයින් භාව සාධනයෙන් ධර්මවිවරණය කරන්න පටන්ගන්නව. නමුත් නිබ්බානය ළඟට එනකොට කරණ සාධනයක පිහිට සොයනව. එතෙන්දි කරණ සාධනයක් නැතුව බැරි වෙනව. 'නිබ්බානං ආගම්ම රාගාදයො පහීනා' ආදිය අපි කලින් අවස්ථාවකත් සඳහන් කළා. ඔය විදියට අටුවාචාරීන් වහන්සේලා විග්‍රහකරන්නෙ ඔය මතකදනාවලට යටවීම නිසා. 'නිවනට ආවාම රාගාදිය නැතිවෙනව'. එහෙම නැත්නම් තෝරනව - 'නිවන කරණකොටගෙන කෙලෙස් ගිනි නිවෙනව'. නිවන කරණකොටගෙන කෙලෙස් ගිනි නිවෙනවයි කීම එක්තරා විදියක වටරවුම් තර්ක න්‍යායයක්, ප්‍රපඤ්චයක්. ක්‍රියාකාරක පද සම්බන්ධයට වහල් වීමක්. 'ගඟ ගලයි' කීවහම ගැලීමෙන් තොර ගඟක්වත්, වැස්ස වහිනවයි කීවාම වැහීමෙන් තොර වැස්සක්වත් නැහැ. මේක මේ ව්‍යාකරණ රටාවෙ එක්තරා අංගයක්. අපි අර කලින් අවස්ථාවකදී පොට්ඨපාදසූත්‍රයෙ ඉතාමත්ම වැදගත් කොටස් කීපයක් සාකච්ඡා කළා. එයිනුත් පෙනුනා බුද්ධපියාණන්වහන්සේ භාෂාව පිළිබඳව මේ කාලයේ පවා කෙනෙකුට පුදුමවියහැකි අඳමේ පුදුම දර්ශනයක් ඉදිරිපත්කරල තියෙනව. මේ මූලපරියාය සූත්‍රයෙ තියෙන්නෙත් ඒ විදියෙම කාරණයක්. එතකොට භාෂාවක නාමපද ක්‍රියාපද ආදිය ගැන කල්පනාකරල බලනකොට ලෝකයා සිතන ආකාරයයි මේ. අර බබාගේ සිතිවිලි වගේ නාමපදයක් අවශ්‍යමයි. ඒකනිසා අර 'දෙවො වස්සති' කියල කියනව. නාමපදයක තියෙන ක්‍රියා අර්ථය වසන් කරනව. එහේම නැත්නම් අමතක කරනව. ඉතින් අර කී දේ නැවත කීමක් වගේ. ගඟ ගලනව. වැස්ස වහිනව. එහෙම නැත්නම් 'දෙවො වස්සති'. ඒකට ගුණත්වයක් ආරෝපණය කරනව. ප්‍රාණත්වයක් ආරෝපණය කරනව. ආදිකල්පික මනුෂ්‍යයින් හැමදේකටම පණ තියෙනව කියල හිතුව. යම්කිසි ක්‍රියාවලියක් කෙරෙනවනම් එතන පණ තියෙනව. ඔන්න ඔය විදියට ඒ ප්‍රකල්පන මාධ්‍යයමයි මෙතන තියෙන්නෙ, නාම පදයයි ක්‍රියා පදයයි අතරෙ. ඊළඟට නාමපදයට නාම විශේෂණ තියෙනව. ක්‍රියා පදයට ක්‍රියා විශේෂණ තියෙනව. අතරතුර නිපාතපද දාගන්නව. ඔය විදියට ව්‍යාකරණයක් හද ගන්නව. ව්‍යාකරණයෙ හැටියටම ලෝකය තියෙනව කියල හිතුවොත් අන්න වැරදීම එතනයි. එතකොට මේ නිබ්බාන කියන ප්‍රඥප්තිය පිළිබඳවත් මහා තර්ක රාශියක් අටුවාචාරීන්වහන්සේල දක්වන්නෙ ඔන්න ඔය කාරණය ගැන සෑහෙන අවබෝධයක් නැතිකම නිසයි. ඒක නිසාම තමයි මේ මූලපරියාය සූත්‍රය 'කොන්වෙලා' තියෙන්නෙ. මූලපරියාය සූත්‍රය මජ්ඣිම නිකායෙ

මුලටම තිබුනට මොකද 'කොන්වෙලයි' තියෙන්නෙ. එතකොට ඔය විදියට කල්පනාකරල බලන කොට විශේෂයෙන්ම මේ සංකල්ප ගැන, මේ භාෂාවෙ ඇති නාමපද ක්‍රියාපද ආදියෙ එක්තරා නිත්‍ය සංඥවක් තියෙනව. නාමපදයක් හදගත්තම ඒකට නිත්‍ය සංඥවක් ආරෝපණය කරනව. 'ගඟ ගලයි' කීවම ගඟේ අර ගැලීම් ස්වභාවය අමතක වෙනව, ඉබේටම. මේ නිත්‍ය සංඥව ගැන අපි කලිනුත් අවස්ථාවක සඳහන් කළා. ඇත්තවශයෙන් සංඥාවම නිත්‍යයි. සංඥව කියල කියන්නෙ නිමිතිගැනීමයි. නිමිත්තක් ගන්න පුළුවන් වෙන්නෙ එතන නිත්‍යබවක් ඇතෙයි කියල හිතා ගැනීමෙන්මයි. එතකොට ඒ සංඥව ගන්නෙ හඳුනාගැනීමට පමණක් නොවෙයි. හඳුන්වාදීමට. හඳුනාගැනීමත් හඳුන්වාදීමත් අතර ඉතාම සමීප සම්බන්ධතාවක් තිබෙන බව බුදුරජාණන් වහන්සේ අඞ්ගුත්තර නිකායෙ ඡක්ක නිපාතයෙ එක්තරා වටිනා පාඨයකිනුත් සඳහන් කරල තියෙනව.

**'වොහාරවෙපක්කාහං භික්ඛවෙ සඤ්ඤං වදාමි. යථා යථා නං සඤ්ජානාති තථා තථා වොහරති එවං සඤ්ඤී අහොසින්ති'**[5]

'මහණෙනි මම ව්‍යවහාරය සංඥවේ විපාකය යයි කියමි. මක්නිසාද 'යථා යථා නං සඤ්ජානාති'' යම් යම් ආකාරයකින් හඳුනාගනීද ඒ ඒ ආකාරයෙන් ව්‍යවහාර කරනව, මෙබඳු සංඥවක් ඇතිව සිටියෙමැයි ආදී වශයෙන්. දැන් මෙතන මේ විපාක කියල යොදල තියෙන වචනය අර කම්විපාක කියන ඒ වචනය අනුව කෙනෙක් හිතන්න පුළුවනි. නමුත් විපාක කියන වචනයෙ සාමාන්‍ය අර්ථය පැසීම, මේරූ අවස්ථාව. එතකොට තමා හඳුනාගැනීම සඳහා ගන්නා ඒ සංඥවේ, තමාගේ ප්‍රයෝජනය සඳහා ගන්නා සංඥවේ විපාකය, මේරූ අවස්ථාව තමයි ව්‍යවහාරය. අන්න එතනින් පේනව එතකොට 'සඤ්ඤාව' සහ 'සංඛාව' අතර ඇති සම්බන්ධතාව. ඒක නිසාම තමයි අපි කලින් අවස්ථාවක සඳහන් කළ කලහ විවාද සූත්‍රයේ 'සඤ්ඤානිදානා හි පපඤ්චසංඛා' කියල කිවුවෙ. ප්‍රපංචයෙන් ඇතිකරගන්නා හැඳින්වීම්, සංඛ්‍යාවන්, ඒ ප්‍රඥප්ති හැමඑකක්ම, සංඥව නිදාන කොට තියෙනව කියන එක දැන් තේරුම්ගන්න පුළුවනි. මක්නිසාද සංඥවෙ පැසුනු මේරූ අවස්ථාව තමයි අර ව්‍යවහාරය. ඔය විදියට කල්පනා කරල බලනකොට අපට පේනව භාෂාව පිළිබඳ දර්ශනය ඉතාමත්ම වැදගත් මේ ධර්මය තේරුම් ගැනීමට. ඒකයි මේ මූලපරියාය සූත්‍ර ආදියෙන් මතුකරගතයුත්තේ. එතකොට මෙන්න මේ සංඛා සමඤ්ඤා පඤ්ඤත්ති ආදී වශයෙන් ඇතිවුන ලෝකව්‍යවහාරවලට සාමාන්‍යයෙන් සත්ත්වයා යටත් වෙන්නෙ මේවා තුළ නිත්‍යසංඥාව නැන්පත් වෙලා තිබෙන නිසා. මේකෙන් මිදීම ඉතාමත් අමාරුයි. අර කිරි, දීකිරි, වෙඩරු කියල ඒ වචන ටික හදගත්තට පස්සේ ඒව අතර ඇති සම්බන්ධතාව මහාගැටලුවක්, මහාදාර්ශනිකයින්ට පවා තේරුම් ගන්ට බැරි විදියෙ ගැටලුවක්, බවට පත්වෙනව.

දැන් අපි අර නිබ්බානය ගැන කථාකළා - ඒ නිබ්බානය, මේ කාලයේ සමහරවිට කෙනෙක් අහන්න පුළුවන්, අපොයි එහෙනම් නිබ්බානය පරමාර්ථධර්මයක් නොවෙයිද කියල, පරමාර්ථයක් නොවෙයිද කියල. නිබ්බානය 'පරමාර්ථයක්' නොවෙයි. නිබ්බානය තමයි 'පරම අර්ථය'. සූත්‍රදේශනාවලට අනුව බලනකොට නිබ්බානය තමයි පරමාර්ථය. නමුත් ඒ වෙනත් අර්ථයකින්. මේ කාලයේ පරමාර්ථය හැටියට ගන්න අර්ථයෙන් නොවෙයි. උතුම්ම යහපත, ප්‍රත්‍යක්ෂකර ගතයුතු ඉහළම උතුම්ම යහපත කියන අර්ථයෙනුයි, සූත්‍ර දේශනාවල නම් නිබ්බානය පරමාර්ථයක් හැටියට හඳුන්වල තියෙන්නෙ. ආරද්ධ විරියො පරමත්ථපත්තියා[6] - ඉහළම, උතුම්ම, යහපතට පැමිණීම සඳහා අරඹන ලද වීර්‍ය්‍ය ඇත්තේ - ඔය විදියේ පාඨ සඳහන් වෙනව. ඒ හැරෙන්න වෙන පරමාර්ථ කථාවක් නම් පේන්න නැහැ සූත්‍රවල. නමුත් කල්යාමේදී නොයෙකුත් නොයෙකුත් අර්ථවලින් නොයෙකුත් නොයෙකුත් පරමාර්ථ මේ ධර්මයට එකතුවෙන්න පටන්ගත්ත. එහෙම එකතුවෙන්න පටන්ගැනීම නිසා බුදුරජාණන්වහන්සේ ලෝකසඤ්ඤ ලොක නිරුත්ති ලොක පඤ්ඤත්ති පිළිබඳව දේශනාකොට වදාළ වැදගත් සූත්‍රදේශනා ටිකෙන් ටික පසුබැසගියා. ඒ වෙනුවට සිදුවුනේ ගොඩනැගිල්ලක් තනාගැනීමට උපකාරකරගන්න පලංචිවල පදිංචිවෙන්න පටන් ගැනීමයි.

ඊළඟට අපට මූලපරියාය සූත්‍රයෙ තවත් ටිකක් කියන්න තියෙනව. විශේෂ කාරණයක් - මේ සූත්‍රදේශනාව අනෙකුත් හැම සූත්‍ර දේශනාවන්ට වඩා විශේෂයෙන් සැළකිය හැකි තවත් විශේෂ කාරණාවක් තියෙනව. ඒ කියන්නෙ, මේ සූත්‍රදේශනාව අවසානයේදී ඒකට සවන්දුන් භික්ෂූන් වහන්සේලා ඒකට සතුටු නොවුනුබව සඳහන්වීමයි. සාමාන්‍යයෙන් සූත්‍රදේශනාවක් යම්කිසි භික්ෂු පිරිසක් අරමුණුකරගෙන බුදුපියාණන් වහන්සේ දේශනා කළා නම් අවසානයෙ තියෙන්නෙ 'අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුං' කියල. ඒ භික්ෂූන්වහන්සේලා භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව පිළිබඳව සතුට දැක්වූව කියන එක. නමුත් මෙතන තියෙන්නෙ කොහොමද? ඉදමවොච භගවා න තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුං - 'ඒ භික්ෂූන් වහන්සේලා භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය ගැන සතුටුවුනේ නැත. මේකත් උපකාර කරගන්නව අට්ඨවාචාරීන්වහන්සේල මේ සූත්‍රය බොහොම ගැඹුරුයි. අසාගෙන සිටි ස්වාමීන් වහන්සේලාටත් තේරුනේ නැහැ. අපි කොහොමද මේක තේරුම්ගන්නෙ කියන අදහසක් දීමට. ඒ නිසාදෝ මේ සූත්‍රය මුළුගැන්නිල තියෙනව. නමුත් මේ කළ විවරණය අනුව අපට හිතාගන්න පුළුවනි මේ සංඝයා වහන්සේලාගේ නොසතුටට වෙන හේතුවක් තිබුන කියල. මොකක්ද ඒ? නිබ්බානයත් ඇතුළු සියලුම ප්‍රඥප්ති පිළිබඳව, එහෙම නැත්නම් කිසිම ප්‍රඥප්තියක් පිළිබඳව මඤ්ඤනා නොකළ යුතු බව ප්‍රකාශකිරීම එදත් අදත්, එකලත් මෙකලත්,

සංඝයාවහන්සේලා වැඩිදෙනාගේ නොසතුටට හේතුවී ඇති කාරණයක්. එතකොට මූල පරියාය සූත්‍රය ගැන එච්චරයි කියන්න තියෙන්නෙ.

බුදුරජාණන්වහන්සේ මේ මඤ්ඤනාව ඉතාමත්ම සියුම් මාර බන්ධනයක් හැටියට දක්වල තිබෙනව. ඉතාමත්ම වටිනා සූත්‍රයක් සළායතන සංයුත්තයේ 'යවකලාපී සූත්‍රය[7] නමින් සඳහන් වෙනව. ඒ යවකලාපී සූත්‍රයේදි බුදුරජාණන්වහන්සේ ඉතාම හොඳ උපමාවකින්, වටිනා ධර්මකාරණයක්- එනම් මේ මඤ්ඤනාවල තිබෙන සියුම්බව - ප්‍රකාශකරනව. මොකක්ද උපමාව? සුරාසුර යුද්ධය ගැන නිතර සූත්‍රවල සඳහන්වෙනව. මෙතනත් බුදුරජාණන්වහන්සේ සුරාසුර යුද්ධයයි උපමාවට ගන්නෙ. දෙවියනුත් අසුරයනුත් අතර මහා සංග්‍රාමයක් පැවතිලා දෙවියන් දිනනව. අසුරයන් පරදිනව. අසුරයන් පැරදුනාට පස්සෙ දෙවියන් මොකද කරන්නෙ. වේපචිත්ති අසුරේන්ද්‍රය බැඳුම් පහකින් බැඳගෙන, ඒ කියන්නෙ, දෙඅත්, දෙපා ගෙල කියන පස්තැනකින් බැඳල, අරගෙන එනව ශක්‍රදේවේන්ද්‍රය ඉදිරියට. මේ බන්ධනය මහ පුදුම අද්භූත විදියෙ බන්ධනයක්. මොකක්ද මේ බන්ධනයෙ ඇති විශේෂත්වය? ඒක බුදුරජාණන්වහන්සේ මෙහෙමයි ප්‍රකාශ කරන්නෙ. මේ වේපචිත්ති අසුරේන්ද්‍රය යම් අවස්ථාවක සිතුවොත් 'දෙවියන් ධාර්මිකයි. අසුරයෝ අධාර්මිකයි. මම දිව්‍යලෝකයට යනව කියල, හිතුව හැටියෙම අර බන්ධනයෙන් මිදිල දිව්‍යමය පඤ්ච කාමසම්පත්තියත් භුක්ති විඳින්න හැකියාවක් ලබනව, වේපචිත්ති අසුරේන්ද්‍රය. නමුත් බැරිවෙලාවත් හිතුනොත් 'අසුරයින් ධාර්මිකයි දෙවියන් අධාර්මිකයි මම ආපසු අසුරලෝකයට යනව' කියල, හිතුව හැටියෙ අර දිව්‍යමය පඤ්චකාම සම්පත්තියෙනුත් පිරිහිලා බන්ධන පහෙන් බැඳෙනව ආයෙත්. ඔන්න ඔහොම ඔය උපමාව ඉදිරිපත් කරල උපමේය වශයෙන් බුදුරජාණන් වහන්සේ වටිනා ධර්ම කාරණයක් මතු කරනව.

> **එවං සුඛුමං ඛො වෙපචිත්තිබන්ධනං තතො සුඛුමතරං මාර බන්ධනං මඤ්ඤමානො ඛො භික්ඛවෙ බද්ධො මාරස්ස අමඤ්ඤමානො මුත්තො පාපිමතො. අස්මීති භික්ඛවෙ මඤ්ඤිතමෙතං අයමහමස්මීති මඤ්ඤිතමෙතං භවිස්සන්ති මඤ්ඤිතමෙතං න භවිස්සන්ති මඤ්ඤිතමෙතං රූපීභවිස්සන්ති මඤ්ඤිතමෙතං අරූපීභවිස්සන්ති මඤ්ඤිතමෙතං සඤ්ඤී භවිස්සන්ති මඤ්ඤිතමෙතං අසඤ්ඤී භවිස්සන්ති මඤ්ඤිතමෙතං නෙවසඤ්ඤීනාසඤ්ඤී භවිස්සන්ති මඤ්ඤිතමෙතං මඤ්ඤිතං භික්ඛවෙ රොගො මඤ්ඤිතං ගණ්ඩො මඤ්ඤිතං සල්ලං තස්මාතිහ භික්ඛවෙ අමඤ්ඤමානෙන චෙතසා විහරිස්සාමාති එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බං**

මේකෙ අදහස අපි ඉස්සෙල්ල තේරුම් ගන්න බලමු. උපමාවට සම්බන්ධ කිරීම් වශයෙනුයි අර පළමුවෙනි පාඨය බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ

කරන්නෙ. 'එවං සුඛුමං ඛො භික්ඛවෙ වෙපචිත්ති බන්ධනං' මහණෙනි වේපචිත්තිව බැදල තිබිය ඒ බන්ධනය ඔන්න ඔය තරම් සියුම් දෙයක්. ඒ කියන්නෙ අර සිතුවිල්ලට යා කළ බන්ධනයක්. සිතත් එක්කමයි ඒ බන්ධනය ක්‍රියාකරන්නෙ. ඊළඟට බුදුරජාණන්වහන්සේ ප්‍රකාශ කරනව - 'තතො සුඛුමතරං මාරබන්ධනං' - නමුත් ඊට වඩා සියුම්, මාරබන්ධනය. මොකක්ද මේ මාර බන්ධනය? මඤ්ඤමානො භික්ඛවෙ බද්ධො මාරස්ස අමඤ්ඤමානො මුත්තො පාපිමතො'- 'මහණෙනි මඤ්ඤනා කරන්නේ මාරයාට බැඳෙයි. මඤ්ඤනා නොකරන්නේ ඒ පාපී වූ මාරයාගෙන් මිදෙයි. ඊළඟට කියනව මොනවද මේ මඤ්ඤනා - 'අස්මීති භික්ඛවෙ මඤ්ඤිතමෙතං - 'අස්මි' - 'වෙමි' යන්න පවා මඤ්ඤිතයක් - මහණෙනි 'වෙමි' යන්නද මඤ්ඤිතයෙකි. 'අයං අහං අස්මීති මඤ්ඤිතමෙතං' 'මෙය මම වෙමි' යනුද මඤ්ඤිතයෙකි. 'භවිස්සන්ති' යනුද මඤ්ඤිතයෙකි. ඒ කියන්නෙ 'වන්නෙමි' කියල හිතුවත් මඤ්ඤිතයක්. ''නොවන්නෙමි' කියල හිතුවත් ඒකත් මඤ්ඤිතයක් 'රූපී වන්නෙමි' කියල හිතුවත් මඤ්ඤිතයක්. 'අරූපී වන්නෙමි' කියල හිතුවත් මඤ්ඤිතයක්. 'සඤ්ඤී වන්නෙමි' කියල හිතුවත් ඒකත් මඤ්ඤිතයක්. 'අසඤ්ඤී වන්නෙමි' කියල හිතුවත් ඒකත් මඤ්ඤිතයක්. 'නෙවසඤ්ඤීනාසඤ්ඤී වන්නෙමි කියල හිතුවත්, ඒකත් මඤ්ඤිතයක්. ඔන්න ඔය විදියට මඤ්ඤනා නවයක් මේ සූත්‍රයෙ දක්වනව බුදුරජාණන්වහන්සේ. එපමණක් නොවෙයි. මේ සූත්‍රයෙම, මේ කොටසෙම, නැවතත් පුනරුක්ති වශයෙන් දක්වල ඒ එක එකක් තවත් විශේෂණ පද හතරකින් හඳුන්වනව. මේ එක එකක්ම මඤ්ඤිතයක් වගේම ඉඤ්ජිතයක් මඤ්ඤිතයක් වගේම ඵන්දිතයක්. මඤ්ඤිතයක් වගේම පපඤ්චිතයක්. ඒ වගේම මානගතයක්. එතකොට මේ එක් එක් වචනයේ විශේෂත්වය කෙටියෙන් සඳහන් කරන්න පුළුවනි.

'ඉඤ්ජිතං' කියල කියන්නෙ - 'එජා' කියන්නෙ තණ්හාවට නමක්. තණ්හාවෙන් උපන්න දෙයක් කියන එක දැක්වීමටයි. තණ්හාව නිසයි මේ 'අස්මි' ආදී මඤ්ඤනා ඇතිවෙන්නෙ, කියන එකයි එතනින් කියැවෙන්නෙ. 'ඵන්දිතං' කියල කියන්නෙ 'ඵන්දනං චපලං චිත්තං'[8] ආදී වශයෙන් දැක්වෙනව. අර සිතේ තිබෙන සසල වන ස්වභාවය, ස්පන්දනය. චපල ස්වභාවයයි එතන කියන්නෙ. සිතේ තිබෙන චපල ස්වභාවය නිසා ඇතිවන සිතිවිල්ලක් ඒක. ඒ වගේම පපඤ්චිතං- ඒක ප්‍රපංචිතයක්. පපඤ්ච කියන වචනය ගැන අපි සෑහෙනදුරට ප්‍රකාශ කරල තියෙනව. ඒක නියම මාර්ගයෙන් ඉවත්ව වටරවුම් ගමනක් යාමක් වගෙයි. ඒවගේම 'මානගතං' කියන්නෙ ඒ මානය නිසා මැනීමක් නිසා - මූලික අර්ථය බැලුවොත් මැනීමක් - එක්තරා මැනීමක්. 'අස්මි' කියන එකම මැනීමක්. මේ මානය කියන්නෙ ඒකයි. 'අස්මි' කියන කුඤ්ඤය. අපි කලින් අවස්ථාවක සඳහන් කළා මුළුමහත් භාෂාවෙ ව්‍යාකරණයම රඳා පවතින්නෙ 'අස්මි' කියන කුඤ්ඤය උඩය කියල. අර

උත්තම පුරුෂ, ප්‍රථම පුරුෂ, මධ්‍යම පුරුෂ ආදි ඒවා ගැන සඳහන් කරන අවස්ථාවෙත් 'මම වෙමි' කියල ගත්තු හැටියෙ 'මෙතනක්' ඇති වෙනව. 'මෙතන' ඇති උනාට පස්සෙ තමයි 'එතනකුත් ඔතැනකුත්' ඇතිවෙන්නේ. උත්තම පුරුෂයාවූ මම ඇති උනාට පස්සෙ තමයි ප්‍රථම පුරුෂයත් මධ්‍යම පුරුෂයත් ඇති වෙන්නෙ. ඔන්න එතකොට ව්‍යාකරණය සම්පූර්ණයි. ව්‍යාකරණයට අවශ්‍ය කොටස් තියෙනව. ඔන්න ඔය විදියට අපට මෙතනින් පෙනෙනව අස්මි' කියන එකම මඤ්ඤිතයක් වගේම ප්‍රපංචිතයකුත් බව. ඇත්ත වශයෙන්ම මේ පපඤ්චයෙන් කෙරෙන නොමගයාම. නිසිමග හැර අනිසිමග යාම - මේ මඤ්ඤනාවලින්ම, විවිධ මඤ්ඤනා වලින්ම, සිදුවන දෙයක්.

මේ මඤ්ඤනාවල ඇති ස්වභාවය කුමක්ද? යම්කිසි දෙයක් ගැන මේ මඤ්ඤනාව ඇතිකරනවත් එක්කම, ඒ මඤ්ඤනාව නිසාම ඒක 'දෙයක්' බවට පත්වෙනව. මේ 'දෙයක්' බවට පත්වීම නිසා-යම්කිසි 'දෙයක්' ඇති උනා නම්, ඒ එක්කම, ඒක 'දෙයක්' වෙනවත් එක්කම-අනිත්‍යතා ධර්මය ඒකට අරක් ගන්නව. ඒ වශයට යටත් වෙනව. මේක මහ පුදුම ධර්මතාවක්. **'දෙයක්' වෙලයි 'අන්දෙයක්' වන්නෙ.** අන්‍යථාභාවය කියල කියන්නෙ අනෙක් ආකාරයකට පෙරලීම. අනෙක් ආකාරයකට පෙරළෙන්න නම් යම්කිසි ආකාරයකට තියෙන්න ඕන. ඒ තියෙන ආකාරය තමයි අන්න 'දෙයක්' කියල කියන්නෙ. යම්කිසි 'දෙයක්' උපදින්නෙ කොහෙද? හිතේ. හිතේ යම්කිසි දෙයක් හැටියට තහවුරු උනා නම්, ඒ එක්කම ඒකට අරක්ගන්නව, ඇතුල්වෙනව, අර අනිත්‍යතා ධර්මය කියන විෂබීජය. දැන් අර මඤ්ඤනාවලමත් අපට පෙනෙනව, අර වේපචිත්තිගේ බන්ධනය වගේ දෙපැත්තට බැඳිල. නිදහසක් නෑ කොයි විදියට හිතුවත්. රූපී කියල හිතුවත් අරූපී කියල හිතුවත් සඤ්ඤී කියල හිතුවත්. අසඤ්ඤී කියල හිතුවත් ඔන්න ඔය ද්වයතාව අනුව ගියා. අපි සූත්‍ර රාශියකදිම ඔය ද්වයතාව ගැන සඳහන් කරන්න යෙදුන. ඒකම තමයි මෙතනත් තියෙන්නෙ- ද්වයතාවක්. රූපී-අරූපී සඤ්ඤී-අසඤ්ඤී වශයෙන්. ඒ හැම එකකටම මුල 'අස්මි' කියන එකයි. ද්වයතානුපස්සනා සූත්‍රයෙන් වටිනා ගාථා යුගලයක් සොයාගන්න පුළුවනි, මේ මඤ්ඤනා පිළිබඳව යම්කිසි සියුම් කාරණයක් හෙළිකර ගැනීමට. මේකයි ඒ ගාථා යුගලය.

**යෙන යෙන හි මඤ්ඤන්ති - තතො තං හොති අඤ්ඤථා**
**තං හි තස්ස මුසා හොති - මොසධම්මං හි ඉත්තරං**
**අමොස ධම්මං නිබ්බානං - තදරියා සච්චතො විදූ**
**තෙ වෙ සච්චාභිසමයා - නිච්ඡාතා පරිනිබ්බුතා**[9]

'යෙන යෙනහි මඤ්ඤන්ති තතො තං හොති අඤ්ඤථා' - යම් යම් ආකාරයකට ලෝකයා මඤ්ඤනා කරත්ද, සිතා ගනිත්ද, හඟිත්ද, ඒ

මඤ්ඤනාව නිසාම එය අන්‍යථාභාවයකට පෙරළෙයි. අනික් බවකට පෙරළෙයි. එහෙම අනෙක් බවට පෙරළෙන නිසාම- 'තං හි තස්ස මුසා හොති' එයම ඒ අනික් බවට පෙරළීම නිසාම - එයම එහි මුසාව වෙයි. 'මොසධම්මං හි ඉත්තරං' මක්නිසාද එය ඉතාමත්ම ළාමකවූ මුළාකරන ස්වරූපයක් ඇති දෙයක් නිසාය. ඔන්න දැන් තේරෙනව සිතේ බිහිවුන ඒ ධර්‍ම, ධර්‍ම හැටියට තදින් ගත්තු මඤ්ඤනාව නිසා 'දෙයක්' ඇති උනා නම්, හිතේ බිහිඋනානම්, ඒ එක්කම අඤ්ඤථාභාවය කියන විෂබීජය ඒකට ඇතුල් වෙනව. 'දෙයක්' උනානම් 'දෙයක්' උනාට පස්සෙ තමයි අන්දෙයක් වෙන්නෙ. එතකොට ඒ අදහස එහෙම කියල, ඒක නිසා ලෝකයේ- සිතේ- බිහිවන මේ ධර්‍මය අර විදියට පරාමර්ශනය කළ හැටියේ, දැඩිව ගත්තු හැටියේ, එතනට අනිත්‍යතාව එකතුවෙනව. ජාති ජරා මරණ ඔක්කොම පෙල ගැහිල එනව. ඊළඟ ගාථාවෙ කියැවෙන්නෙ කුමක්ද?

**අමොසධම්මං නිබ්බානං - තදරියා සච්චතො විදූ**
**තෙ වෙ සච්චාභිසමයා - නිච්ඡාතා පරිනිබ්බුතා**

'අමොසධම්මං නිබ්බානං' - නිවන වනාහි මුළා නොකරන ස්වභාවය ඇති දෙයකි. අපට 'දෙයක්' කියන වචනය යොදන්න වෙනව මෙතනදි. 'කරන්න දෙයක්' නැහැ. නිවන මුළා නොකරන ස්වභාවය ඇති දෙයකි. තදරියා සච්චතො විදූ- ආර්‍යයෝ එය සත්‍යය වශයෙන් - පරමාර්ථ සත්‍යය කියල මොකක්වත් මෙතන යොදල නැහැ. - නමුත් සත්‍ය වශයෙන් දනිත්. තෙ වෙ සච්චාභිසමයා නිච්ඡාතා පරිනිබ්බුතා' ඒ ආර්‍ය පුද්ගලයෝ සත්‍යය තේරුම් ගත්තාහු 'නිච්ඡාතා පරිනිබ්බුතා, තණ්හාව නැමැති කුසගින්නෙන් මිදුනාහු- පරිනිබ්බුතා කියන්නෙ - පරිනිබ්බාන කියන වචනය ඇහෙනවත් එක්කම අමුතු අදහසක් එන්නෙ, ඒක නිසා අපි මෙතනදි කියමු- පූර්ණ නිවීමට පත්වෙත් කියල. මේ වචනවලත් යම් යම් අර්ථ ගැබ්වෙලා තිබෙන නිසා වචනත් පාවිච්චි කරන්න අමාරු තත්ත්වයක් දැන් තියෙන්නෙ. පරිනිබ්බුතා කියන්නෙ ඒ අවබෝධය එනවත් එක්කම ඒ රහතන් වහන්සේ මෙලොවින් තුරන් උනා නොවෙයි. 'පරිනිබ්බුතා' කියන්නෙ සම්පූර්ණ නිවීමට පත්වෙනව අර තණ්හා කුසගින්න නිවුන නිසා. එතකොට මේ නිවන 'අමොසධම්මං' වන්නෙ, මුළා නොකරන ස්වභාවයක් වන්නෙ, මක්නිසාද? කියල ටිකක් කල්පනා කරන්න සිද්ධ වෙනව. නිවනේ '**දෙයක්**' නැතිනිසා. '**දෙයක්**' තියෙන නිසා තමයි මේ ඔක්කොම කරදර. නිවනෙහි දෙයක් නැති නිසා තමයි ඒක 'අනිමිත්ත' කියල කියන්නෙ. ඒක අනිමිත්ත' නිසා තමයි ඒක අප්පණිහිත' වෙන්නෙ. එතන ප්‍රණිධියක් පිහිටීමක් නැහැ. ප්‍රතිෂ්ඨාවක් නැහැ. ප්‍රතිෂ්ඨාවක් තියෙනවනම් තමයි ඒක තල්ලුකරන්න පුළුවන් වෙන්නෙ. චංචල වෙන්නෙ, කොප්‍ය වෙන්නෙ. අකුප්පාචෙතොවිමුත්ති' කියන්නෙ කුපිත නොවෙන, කෝප්‍ය නොවන, චංචල නොවන, ස්වභාවය නිසයි. තණ්හාවක්

නැති නිසා ප්‍රණිධියක් නැහැ. ඒවගේම 'සුඤ්ඤත' කියල කියන්නෙ ලෝකයා හිතන විදියෙ සාරයක් නැහැ. අර මහා සාරෝපම සූත්‍රයෙ[10] කිව්ව වගේ විමුක්තියම තමයි සාරය. වෙන සාරයක් නැහැ. ලෝකයා හිතන විදියෙ පදාර්ථයක් නැහැ මෙතන නිබ්බානෙ. ඔන්න ඔය විදියට එතකොට දෙයක් නැති නිසාමයි වෙනස්වෙන්නෙ නැත්තෙ.

අපි කලිනුත් අවස්ථාවක සඳහන් කළා කොයිතරම් ව්‍යාකූල තත්ත්වයකට මේව පිළිබඳ අදහස් යොමුවෙලා තියෙනවද කියල. සංඛතයත් දෙයක්. අසංඛතයත් දෙයක්. සංඛතය අනිත්‍ය දෙයක්. අසංඛතය නිත්‍යදෙයක්. සංඛතය දුක්ඛදෙයක් අසංඛතය සුඛදෙයක්. සංඛතය අනාත්මයි. අසංඛතය?- කියල නවතින්ට සිද්ධවෙනව. ඔන්න ඔය විදියේ තත්ත්වයකට මේ දර්ශනිකයින් පත්වුනේ මේ කාරණා ගැන අවබෝධයක් නැති නිසා වෙන්ට ඕන. එතකොට 'යෙන යෙන හි මඤ්ඤන්ති' කියන මේ ගාථාවලින් ඉතාමත්ම වටිනා අදහසක් ප්‍රකාශ කෙරෙන්නෙ.

මේ මඤ්ඤනාව නිසා මේ ලෝකයේ සිතට අරමුණුවන දේවල් පිළිබඳව එක්තරා උපාදානයක්, එක්තරා ග්‍රහණයක්, පරාමර්ශනයක්, ලෝකයා තුළින් සිද්ධ වෙනව. බුදුරජාණන්වහන්සේ මේ සංකල්ප ඉදිරිපත් කරල තියෙන්නෙ ඒවා උපකාර කරගෙන සැඩ වතුරෙන් එතරවීම සඳහායි, 'දෙසිතා 'නිස්සාය නිස්සාය ඔඝස්ස නිත්ථරණා.'[11] මේ හැම එකක්ම, මධ්‍යම ප්‍රතිපදව අනුව සංකල්පවල ඇති ආදීනව පක්ෂයත් තේරුම් අරගෙන, මේ අර රථවිනීත ප්‍රතිපදවෙත්, අලගද්දූපම සූත්‍රාදියෙත් දැක්වෙන ආකාරයට එකක් එකකට උපකාරවන හැටියට මේ ධර්ම පාවිච්චිකරනව මිසක් මේ එකක්වත් බදගැනීමට නොවෙයි. වෙන එකක් තබා නිවනවත් බදගන්නේ නැහැ. 'නිබ්බාන' කියන ප්‍රඥප්තිය බදගත්තොත් ඒකත් අමාරුවෙ වැටෙන තැනක්. ඔන්න ඔය විදියට එතකොට 'යෙන යෙන හි මඤ්ඤන්ති' ආදි ගාථාවෙන් අපට තවදුරටත් තේරුම් ගන්න පුළුවනි, අර මඤ්ඤනා වල තිබෙන සියුම් ස්වභාවය- මේක ඉතාමත්ම සියුම් මාරබන්ධනයක් කියල ප්‍රකාශකළේ මක්නිසාද කියන එක.

මෙතෙන්දි අපට මතක්කරගන්න පුළුවනි බ්‍රහ්මනිමන්තනික සූත්‍රය විග්‍රහ කරන අවස්ථාවේදී, අර අනිදස්සන විඤ්ඤාණය ගැන කථා කරන අවස්ථාවේදී, අපි ප්‍රකාශකළා ඒ අනිදස්සන විඤ්ඤාණය 'පඨවියේ පඨවිත්වයෙන් අනනුභූතයි' කියල. ඒ කියන්නෙ පෘථිවියෙහි පෘථිවිබවෙන්, පෘථිවි ස්වභාවයට යටත්වෙලා නැහැ' කියල. ඇත්තවශයෙන්ම කලින් සඳහන්කළ මූලපරියාය සූත්‍රයෙ සංකල්ප 24න් 13 ක්ම බ්‍රහ්මනිමන්තනික සූත්‍රයෙත් සඳහන් වෙනව. ඒ කියන්නෙ, අර අනිදස්සන විඤ්ඤාණය අර කියාපු එක සංකල්පයකටවත් යටත් නැහැ. යටත් නැහැ කියල කියන්නෙ

ඒ එකක්වත් වස්තුත්වයෙන්, පදාර්ථත්වයෙන් ගන්නෙ නැහැ. ඒක නිසා තමයි 'අනිදස්සන' වෙන්නෙ. විඤ්ඤාණය 'අනිදස්සන' වන්නෙ. සාමාන්‍යයෙන් විඤ්ඤාණය අරමුණක් අල්ලගෙනයි තිබෙන්නෙ. ඒ අල්ල නොගත් ස්වභාවය පෙන්නීමටයි මේකට අනිදස්සන කියල කියන්නෙ'. අර විදියට අල්ලගන්න දෙයක් නැහැ. ඒ වගේම මෙතනදි අපි මේ ප්‍රකාශකළ කාරණා තවදුරටත් පැහැදිලි කරගන්න උපකාරවන වටිනා සූත්‍රයක් තිබෙනව මජ්ඣිමනිකායෙම- චූලතණ්හාසංඛය සූත්‍රය. මේකෙ සඳහන් වෙනව පාඨයක්, වටිනා පාඨයක්.

'සබ්බෙ ධම්මා නාලං අභිනිවෙසාය'[12]- සාමාන්‍ය අර්ථයෙන් ගත්තොත් ඒකෙ අදහස 'කිසිම දෙයකට දෘෂ්ටි වශයෙන් රිංගා නොගත යුතුයි' කියන එකයි. 'අභිනිවෙස' කියල කියන්නේ දෘෂ්ටිවශයෙන් ඇතුල්වීම කියන එකයි, පරාමර්ශනය කිරීම. දැන් මෙතෙනදි අපට වැදගත් උපමාවක් මතුතරගන්න පුළුවනි. දැන් අර සංකල්ප පිළිබඳව, කිසිම සංකල්පයක් පිළිබඳව, දැඩිව ගැනීමක් රහතන්වහන්සේට නැතිබව අපි ප්‍රකාශ කළා. අපි ටිකකට කල්පනා කරමු 'ගෙයක්' කියන එක. 'ගෙයක්' කියන ප්‍රඥප්තිය. රහතන් වහන්සේලත් ගෙවල් ඇතුලට යනව. නමුත් ඇත්ත වශයෙන්ම රහතන් වහන්සේල ගෙවල් ඇතුලට යාමක් නෑ. මේක විතර්කයක් ඇතිවෙන්න පුළුවන් අදහසක්. විතර්කයක් ඇතිවෙන කාරණයක් වෙන්න පුළුවනි. නමුත් රහතන්වහන්සේ 'ගෙයක්' කියන ප්‍රඥප්තියට ඇතුල් උනේ නැහැ.

ගෙයකට ඇතුල්වෙන්න පුළුවනි ගෙයක් කියන ප්‍රඥප්තියට ඇතුල් නොවී. සමහරවිට ගෙයකට ඇතුල් නොවුනත් ගෙය කියන ප්‍රඥප්තියට ඇතුල්වෙන්න පුළුවනි. මේක ප්‍රහේලිකාවක් හැටියට මෙහෙම තියෙද්දී අපි චූලතණ්හා සංඛය සූත්‍රයේ එන සුරංගනාකථාවක් වැනි පොඩි කථාන්තරයක් ඉස්සෙල්ල විග්‍රහකරන්න බලමු.

මේ චූලතණ්හා සංඛය සූත්‍රයේ මූලිකව සඳහන් වෙන්නෙ මේකයි. ශක්‍රයා එක් අවස්ථාවක බුදුරජාණන්වහන්සේ පුබ්බාරාමයේ වැඩවසන අවස්ථාවක ඇවිල්ල ප්‍රශ්නයක් ඇසුව. යම්කිසි භික්ෂුවක් සම්පූර්ණයෙන්ම තණ්හාව ක්ෂයකරල විමුක්තිය ලබන්නෙ කොහොමද කියල. ඒකට බුදුරජුන් දුන්න කෙටි දේශනයේ අඩංගුවන වටිනා පාඨය තමයි මේ 'සබ්බෙ ධම්මා නාලං අභිනිවෙසාය' කියන එක. කිසිම දෙයකට දෘෂ්ටිවශයෙන් ඇතුල් නොවිය යුතුයි කියන එක. මේ සූත්‍ර දේශනාව අහල, ශක්‍රය ගියා. කලකට පස්සේ මුගලන් මහරහතන් වහන්සේට නිකමට හිතුන' මේ ශක්‍රය ' සාධු සාධු' කියල මේක අනුමෝදන් වෙලා ගියා. හැබැයි ශක්‍රය මේක තේරුම් ගත්තද? මේ විදියට ජීවත් වෙනවද කියල බලන්න ඕන, කියල. මුගලන් මහරහතන් වහන්සේ දික්කළ අතක් වක්කළ සැණින් පුබ්බාරාමයෙන් අතුරුදහන් වෙලා

තව්තිසා දෙව්ලොවේ පහළවුනා. ශක්‍රයා ඒ වෙලාවෙ හොඳට සංගීතයෙන් විනෝදවෙන අවස්ථාවක්, තූර්‍යභාණ්ඩ තියාගෙන. ඈතදීම දැක්ක මුගලන් මහරහතන් වහන්සේ. දැකල, ඒව හෙමිහිට නවත්වල මුගලන් මහරහතන් වහන්සේට ආරාධනා කළා 'ස්වාගතං ස්වාගතං' කියල. 'බොහොම හොඳයි කාලෙකට පස්සේ වැඩමකළේ, වැඩහිටින්න' කියල උස් ආසනයක් පිළිගන්වල තමා පහත් ආසනයක ඉඳගත්තහම මුගලන් මහරහතන් වහන්සේ අහනව ශක්‍රයගෙන්, ඔබ බුදුරජාණන් වහන්සේ ළඟට ගිහිල්ල යම්කිසි ධර්ම දේශනාවක් ශ්‍රවණයකළා නේද? අපිත් කැමතියි ඒක අහන්න කියල. ශක්‍රය කියනව අපට බොහොම වැඩ කටයුතු බහුලයි. අපේ වැඩ විතරක් නොවෙයි. මේ අනෙකුත් තව්තිසා වැසි දෙවියන්ගෙ වැඩ නිසා. ඒකනිසා මේ වගේ ධර්ම කොටඨාස අපට මතක තියා ගන්න බොහොම අමාරුයි කියල. ඊළඟට ඊට වඩා වැදගත් හැටියට ශක්‍රය හිතන කාරණයක් කියනව. මම මේ සුරාසුර යුධය දිනල ඉවරවෙලා වෛජයන්ත කියල හොඳ ප්‍රාසාදයක් මැව්ව. මුගලන් නිදුකාණෙනි ඔබ කැමතිද ඒක දකින්න කියල. ඉතින් ආගන්තුකයෙක් නිසා බැහැයි කියන්න බැරි නිසාදෝ මුගලන් මහරහතන් වහන්සේත් කැමති උනා. ඊළඟට ශක්‍රයා තමාගේ මිත්‍ර වෛශ්‍රවණ දිව්‍යරාජයත් එක්ක, මුගලන් මහරහතන් වහන්සේත් එක්කගෙන ප්‍රාසාදය බලන්න යනව. මේ ප්‍රාසාදය මහා කූටාගාර සීයගණනක් ඇති මහ පුදුම අන්දමේ එකක්. ඈතදීම දැක්ක ශක්‍රයාගේ පාරිචාරිකාවන්-දිව්‍යාප්සරාවන් - මුගලන් මහරහතන් වහන්සේ වඩිනව. දැකල ගෞරවය නිසා හිරිඔතප් පිහිටුවාගෙන තම තමන්ගේ කාමර තුළට 'රිංග ගත්ත'. ශක්‍රය මුගලන් මහරහතන් වහන්සේ ප්‍රාසාදය වටේ වඩම්මවමින්, 'බලන්න නිදුකාණෙනි මොග්ගල්ලාන මේ ප්‍රාසාදයේ රමණීයත්වය' කියල පෙන්නන්න පටන්ගත්ත ප්‍රාසාදයෙ රමණීය ස්වභාවය. මුගලන් මහරහතන් වහන්සේත් එහෙමතමයි ඔබේ පින්බලය නිසා තමයි මේවා පහළවෙලා තියෙන්නෙ කියලා, ප්‍රකාශකරල ඊළඟට කල්පනාකළා මේ ශක්‍රය-මේ 'යක්ෂයා' - යක්ෂයා කියන වචනයයි එතන යෙදිල තියෙන්නේ - යක්ෂ කියල යොදනව දෙවියන්ටත්. මේ 'යක්ෂය' ප්‍රමාදයට වැටිලයි ඉන්නේ. සංවේගයට පත් කරන්න ඕන කියල, උන්වහන්සේ ඊළඟට මොකද කළේ. පයේ ඇඟිල්ලෙන් අර වෛජයන්ත ප්‍රාසාදය හෙල්ලුව. එතකොට ශක්‍රය මේකට තණ්හාමානදිට්ඨි වශයෙන් ඇතුල්වෙලා හිටිය නිසා ශක්‍රයත් හෙල්ලුනා ඒ එක්කම, ශක්‍රයට සංවේගය පහළ උනා. අන්න ඒ අවස්ථාවේ තමයි බුදුරජාණන්වහන්සේ දේශනා කළ ධර්මදේශනාවත් මතක් උනේ ශක්‍රයට. ඔන්න එතකොට මුගලන් මහරහතන් වහන්සේ ශක්‍ර දේවේන්ද්‍රයගෙන් ඇහුව 'මොකක්ද අර දේශනාව' කියල. එතකොට හොඳට ඉදිරිපත් කළා දේශනාව. 'සබ්බෙ ධම්මා නාලං අභිනිවේසාය' කිසිම දෙයකට '**රිංගා නොගතයුතුය**' කියන පාඩම උගන්වන්නයි මුගලන් මහරහතන් වහන්සේ මෙච්චර වෙහෙසුනෙ.

දැන් මේ සූත්‍ර දේශනාවෙ ගැඹුරු ධර්ම ගැන සැලකීමක් නැතිව, කථාරසයට කියවනවනම් මේක නිකම්ම නිකං සුරංගනා කථාවක්. මෙතන මේ දිව්‍ය අප්සරාවන් රිංග ගත්ත වගේ, ශක්‍රයා බොහොම ආඩම්බරයෙන් තණ්හා මාන දිට්ඨි වශයෙන් අර තමන් මවාගත්තු මේ වෛජයන්ත ප්‍රාසාදය පිළිබඳව මානයක් ඇති කරගෙනයි ආගන්තුකයට පෙන්නුවෙ. හරියට අර යම්කිසි ධනවතෙක් මේ කාලේ මන්දිරයක් හැදුවාම අමුත්තන්ට පෙන්වන්න වගේ, ඒ විදියට පෙන්වගෙන ගියා. එතකොට මෙයින් අපට පේනව මේ ලෝකයාගේ ප්‍රඥප්ති හැම එකකම ස්වභාවය - දැන් ගෙයක් කියන ප්‍රඥප්තිය ගත්තාම, මේ ගෙට ඇතුල්වූ පමණින්ම ගෙට ඇතුල් උනා නොවෙයි. වෙන විදියකට කියනවනම්, ගෙයක් කියන **ප්‍රඥප්තියට** ඇතුල් උනොත් තමයි ඒක සිද්ධවෙන්නෙ. ඊළඟට අපි ගනිමු පොඩි උපමාවක්, එදිනෙදා උපමාවක්. දැන් කුඩා දරුවන් සමහරවිට සෙල්ලම් ගෙවල් හදනව. කෝටු හතරක් ඉන්දවල ඔය හබරල කොල කීපයකින් සෙවෙනි කරල පොඩි සෙල්ලම් ගෙයක් හදනව. සමහරවිට ගෙවදින අවස්ථාවට මැණියන්ටත් ආරාධනා කරනව. මැණියනුත් 'රිංග ගන්නව' මේ සෙල්ලං ගෙට. රිංගන අවස්ථාවෙ අර කුඩා දරුවන්ට තියෙන චමත්කාරජනක සුන්දර හැඟීමක් නෑ, ගෙයක් කියන හැඟීමක් නෑ, මැණියන්ට: අන්න ඒ මැණියන්ට කුඩා දරුවන්ගේ සෙල්ලම් ගෙය ගැන තිබෙන හැඟීම වගේ තමයි තථාගතයන් වහන්සේලාට, රහතන් වහන්සේලාට. අභිඥා පරිඥා වශයෙන් මේ 'ගෙය' , 'මන්දිරය', 'ප්‍රාසාදය' ආදී මේ වචනවල අර්ථය හරියට තේරුම්ගත්තු ඒ විමුක්ත පුද්ගලයින්ට, මෙන්න මේ **වැඩිහිටියන්ගෙ ගෙවල්** පිළිබඳව හිතෙන්නෙත් ඒ ආකාරයටයි. එතකොට මෙයින් අපට තේරුම්ගන්න පුළුවනි මේ ප්‍රඥප්ති-ලෝකයේ තිබෙන ප්‍රඥප්ති තමයි තථාගතයන් වහන්සේලාට පාවිච්චි කරන්න වෙන්නෙ. වෙන එකක් තබා එක්තරා අවස්ථාවකදී දේවතාවෙක් අහනව ප්‍රශ්නයක්. 'විමුක්ත රහතන් වහන්සේල මොකද 'අහං වදාමි' 'මමං වදන්ති කියල කියන්නේ?' රහතන් වහන්සේල මොකද 'මම කියනව' 'මට කියනව' කියල මෙහෙම ප්‍රකාශ කරන්නේ? මානයක් නිසාද එහෙම කියන්නේ? කියල. බුදුරජාණන් වහන්සේ ඒකට දෙන පිළිතුර මොකක්ද?

**යො හොති භික්ඛු අරහං කතාවී - ඛීණාසවො අන්තිමදෙහධාරී**
**අහං වදාමීතිපි සො වදෙය්‍ය - මමං වදන්තීතිපි සො වදෙය්‍ය**
**ලොකෙ සමඤ්ඤං කුසලො විදිත්වා - වොහාරමත්තෙන සො වොහරෙය්‍ය**[13]

'යො හොති භික්ඛු අරහං කතාවී' - කෘතකෘත්‍යවූ, සියලු වැඩකටයුතු අවසාන කළ, රහතන් වහන්සේ, 'ඛීණාසවො - ක්ෂීණාශ්‍රවයන් වහන්සේ, උන්වහන්සේට අර විදියට ආශ්‍රවයන් ගලාගෙන එන්නේ නෑ. සංකල්පයක් හිතට වැටුනු හැටියේ ආශ්‍රවයන් ගලාගෙන එන්නේ නැහැ. 'ගෙයක්'

'මන්දිරයක්' ප්‍රාසාදයක්' කියල ඇහුන හැටියෙ තණ්හාමානදිට්ඨි ආදියක් ගලාගෙන එන්නේ නැහැ. ඒ විදියටම 'අන්තිම දෙහධාරී' - අවසාන ශරීරය දරන්නාවූ, 'අහං වදාමීතිපි සො වදෙය්‍ය' - 'මම කියනව' 'මම බණ දෙසනව' කියල ප්‍රකාශකරනව 'මමං වදන්තීතිපි සො වදෙය්‍ය' 'මට කියනව' කියලත් පාවිච්චි කරනව. නමුත් 'ලොකෙ සමඤ්ඤං කුසලො විදිත්වා, වොහාරමත්තෙන සො වොහරෙය්‍ය' - ලෝක සමඤ්ඤාවන් පිළිබඳව, කුසල' කියල කියන්නේ ඒ පිළිබඳ කෞශල්‍යය, කාරණාකාරණා හරියට නුවණින් තේරුම් අරගෙන, ලෝකයේ තිබෙන සමඤ්ඤාව, ලෝකයේ තිබෙන ප්‍රඥප්ති ව්‍යවහාර ආදිය තේරුම් අරගෙන, වොහාරමත්තෙන සො වොහරෙය්‍ය - ව්‍යවහාර මාත්‍රවශයෙන් පමණක් ව්‍යවහාර කරනව. අන්න ඒක නිසා තථාගතයන් වහන්සේල, රහතන් වහන්සේල කොයිතරම් මන්දිරයකට, ගෙයකට ඇතුල් උනත් ඇත්තවශයෙන්ම ගේකට නොවෙයි ඇතුල්උනෙ. ගේකට ඇතුල්උනා කියන ඒ සංඥව නැහැ. 'ගෙයක්' කියල කියනකොට සමහරවිට හිතෙන්න පුළුවන්, ගෙයක් කියන මේ ප්‍රඥප්තිය කඩාදැමීමට නම් අපි කරන්න ඕන මොකද්ද? ගෙයි තියෙන උළුකැට, ගඩොල්කැට ඕව පරමාණුවලට බෙදල බලල තේරුම් ගන්න ඕන කියල, ඔහොමයි කෙනෙක් හිතන්නෙ මේ 'ගෙය' කියන ප්‍රඥප්තියෙන් මිදෙන්න. නමුත් එතන නොවෙයි රහස. පටිච්චසමුප්පාද ධර්මය අනුව තේරුම් ගන්න ඕන මේ ගෙය ඇති උනෙ උළුගඩොල් ආදියෙන් පමණක් නොවෙයි. උළුගඩොල් ඇතිඋනේ ගේ නිසා. එතන තියෙන ඒ සාපේක්ෂකතාව බොහෝවිට අමතක කරනව, මේ දර්ශනිකයින්.

උළු ගඩොල් ඇතිඋනෙත් ගේ නිසා. මේක ටිකක් අර විදියටම කල්පනා කළයුතු කාරණයක්. කෙනෙක් හිතන්න පුළුවන් උළු ගඩොල් ආදියෙන්ය ගෙයක් හදන්නෙ කියල. නමුත් උළු ගඩොල් බිහිවන්නෙත් ගේ නිසා. මේ දෙක එකිනෙකට සම්බන්ධයි. උළුකැටය කුමක්ද කියල කෙනෙක් ඇහුවාම ඒක හඳුන්වන්නේ කොහොමද? උළුකැටය වනාහි ගෙයක වහල තැනීමට ගන්නා උපකරණයකි. ගඩොල් කැටය වනාහි ගෙයක බිත්තියක් සෑදීමට ගන්නා දෙයකි. එයින් පෙනෙනව ගෙයත් - උළු කැටයත්, ගෙයත් - ගඩොල් කැටයත්, අතර සාපේක්ෂකතාවක් තියෙන බව. එතකොට මේව පිළිබඳව අර පරමාණු විද්‍යාඥයන් කරන්න වගේ කෑලිවලට කඩන්න ඕන නැහැ. මේ ධර්මතාව ඒ තිබෙන තැනම විනිවිද දැකීමයි ප්‍රඥව කියල කියන්නෙ. අද අපි ගැඹුරු ධර්ම කොට්ඨාස පිළිබඳව සඳහන් කළා යම් යම් කාරණා මඤ්ඤනා ගැන විශේෂයෙන් සඳහන් කළා. මේ මඤ්ඤනා වලින් සිතේ ඇතිවන ව්‍යාකූලත්වය ඉවත්කර ගැනීමට උපකාර වෙනව බුදුරජාණන්වහන්සේ විසින් දේශනාකළ පරියාය දේශනා, වොහාර දේශනා හැටියට මේ කාලේ කොන් වී තිබෙන සමහර සූත්‍ර දේශනාවල ගැඹුරු අර්

මතුකර ගැනීම. මූලපරියාය සූත්‍රාදියෙන් දැක්වූ මඤ්ඤනා ගැන කියාපු කාරණා විශේෂයෙන් උපකාරවෙනව. බුදුරජාණන් වහන්සේ ඇත්ත වශයෙන්ම ලෝකයා කථා කරන භාෂාව හැර වෙන භාෂාවකින් කථාකරනව නොවෙයි.

දැන් සමහර විට රසායන විද්‍යාඥයින් රසායනාගාරවල නොයෙකුත් විදියෙ වීජගණිතමය වගේ සංකේත පාවිච්චි කරනව. ගෙදර ආවට පස්සේ වෙන සංකේත පාවිච්චි කරන්නේ. නමුත් දෙකම සංකේත. එතකොට අමුතුවෙන් ඒක වෙනම ගොඩකට දන්න බැහැ. මේව විශිෂ්ටයි කියල. තමන්ගේ ඒ වැඩේට ගැලපෙන හැටියට සංකේත යොදනව. අන්න ඒ නිසා මේවා පරියාය දේසනා කියල කොන් කරන්න බැහැ. ලෝකයා පාවිච්චි කරන වචන තමයි කොතැනදිත් උපකාර කරගන්නෙ. එතකොට අර රසායනාගාරෙදි එකවිදියක සංකේත පාවිච්චි කරනව. ගෙදරදි වෙන සංකේත පාවිච්චි කරනව. ඒ වගේ මේ හැමඑකක්ම, මේව කොටස් කරල, මලු බැඳල, වෙන් කරල ගන්න බැහැ, මේ සංකල්ප විතරක් වෙනස් වෙන්නෙ නැහැ කියල. මේ ඔක්කොම 'ලොකසමඤ්ඤා, ලොකනිරුත්තියො, ලොකවොහාරා ලොකපඤ්ඤත්තියො' අර පොට්ඨපාද සූත්‍රයේ සඳහන් කළා වගේ, 'යාහි තථාගතො වොහරති අපරාමසං' - ඒ සංකල්ප ඒ වචන කොයිතරම් දර්ශනික උනත් කොයිතරම් ශාස්ත්‍රීය උනත් ඒවා උපකාර කර ගන්නව **පරාමර්ශනය නොකර** ඒ රහතන්වහන්සේල.

එතකොට මේවයින් කෙරෙන්න ඕන කෘත්‍යයයි අපට වැදගත් වන්නෙ. අර සංකල්ප 'පලංචි' අපි පාවිච්චි කරන්න ඕනෙ ගොඩනැගිල්ල තනා ගැනීමට පමණයි. ගොඩනැගිල්ල තැනෙනකොට මේ පලංචියත් ඉවරයි. පලංචිය අහක්කරගන්න ඕන. පලංචිය 'අල්ලගෙන' හිටියොත් කවදවත් ගොඩනැගිල්ල තැනෙන්නෙ නැහැ.

## අධෝලිපි

1. ප. සූ. I 26 පිට. (හේ. මු)
2. සං. නි. III 22 පිට. (බු. ජ. 15)
3. ම. නි. III 88 පිට ආනෙඤ්ජසප්පාය සු. (බු. ජ. 12)
4. සං. නි. I 102 පිට කකුධ සු. (බු. ජ. 13)
5. අං. නි. IV 206 පිට. (බු. ජ. 21)
6. සු. නි. 20 පිට. ඛග්ගවිසාණ සු. (බු. ජ. 25)
7. සං. නි. IV 384 පිට. (බු. ජ. 16)
8. ධ. ප. චිත්ත වග්ග ඛු. නි I ඛු. ජ. 24-34 පිට
9. සු. නි. 236-237 පිටු. (බු. ජ. 25)
10. ම. නි. I 476 පිට. (බු. ජ. 10)
11. ම. නි. III 88 පිට (බු. ජ. 12)
12. ම. නි. I 598 පිට. (බු. ජ. 10)
13. සං. නි. I 28 පිට. (බු. ජ. 13)

# 14 වන
# දේශනය

# 14 වන දේශනය

**"නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස"**

"එතං සන්තං එතං පණීතං යදිදං සබ්බසංඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං"

"මෙය ශාන්තය මෙය ප්‍රණීතය, එනම් සියලු සංස්කාරයන්ගේ සංසිඳීම, සියලු උපධීන් අතහැරදැමීම, තණ්හාව ක්‍ෂය කිරීම, නොඇල්ම නම් වූ විරාගය, නැවැත්ම නම් වූ නිරෝධය, නිවීම නම් වූ නිබ්බානය."

**අතිපූජනීය මහෝපාධ්‍යාය මාහිමිපාණන් වහන්සේ ප්‍රධාන ගරුතර යෝගාවචර මහා සංඝරත්නයෙන් අවසරයි. 'නිබ්බාන' යන මාතෘකාව යටතේ පවත්වනු ලබන දේශනාමාලාවේ දහහතර වන දේශනයයි මේ.**

බුදුරජාණන් වහන්සේ විසින් ඉතාමත්ම සියුම් මාරබන්ධනයක් හැටියට හඳුන්වා දෙන ලද මඤ්ඤිතයන් ගැන පසුගිය දේශනයේදී අප විස්තර කළා. අස්මිමානය අනුව භවය පිළිබඳව ඇතිකරගන්නා විවිධාකාර කල්පනා සියල්ලක්ම මඤ්ඤිතයන් බවත්, ඒ මඤ්ඤිතයන් මාරබන්ධන වන්නේ ඒ කල්පනා තුළම සත්ත්වයා භවයෙහි බැඳ තැබීමේ ශක්තිය ඇතිනිසා බවත් අපට ඒ සළායතන සංයුක්තයේ යවකලාපිය සූත්‍රයෙන් හෙළිවුනා. වෙපචිත්ති අසුරේන්ද්‍රයාගේ පඤ්චවිධ බන්ධනය වගේම උභතෝකෝටික තත්ත්වයක් මේ මඤ්ඤිතයන් පිළිබඳවත් තිබෙන බව අපට පෙනී ගියා. 'භවිස්සං', න භවිස්සං', 'වන්නෙමි' 'නොවන්නෙමි'. 'වන්නෙමි', කියල හිතුවත්, 'නොවන්නෙමි' කියල හිතුවත් මාරයට අහුවෙලා. 'සඤ්ඤී වන්නෙමි', 'අසඤ්ඤී වන්නෙමි', 'නෙවසඤ්ඤීනාසඤ්ඤී වන්නෙමි' කියල හිතුවත් මාරයට අහුවෙලා. මෙතන එක්තරා උභතෝකෝටික තත්ත්වයක් තියෙන්නෙ. උභතෝකෝටික තත්ත්වයක් සහිත මේ මඤ්ඤිතයන් සම්පූර්ණයෙන්ම ඉක්මවිය යුතු බවත් ඉක්මවීමේ මාර්ගයත් බුදුරජාණන් වහන්සේ පුක්කුසාති ස්වාමීන් වහන්සේට මැදුම් සඟියේ එන ධාතුවිභංග සූත්‍රයේදී දේශනා කරල තියෙනව.[1] ඒ ධාතු විභංග සූත්‍රදේශනාව අවසාන කරමින් බුදුපියාණන් වහන්සේ, ඒ දේශනාව කුළුගන්වමින් ප්‍රකාශ කළ එක්තරා සාරගර්භ ඡේදයක් තියෙනව, ඒකෙ ධම් තේජසකුත් තියෙන බව පේනව. ඒක නිසා අපි ඒක උද්ධෘත වශයෙන් දක්වන්න කල්පනා කළා.

**'යත්ථට්ඨිතං මඤ්ඤුස්සවා නප්පවත්තන්ති මඤ්ඤුස්සවෙ ඛො පන නප්පවත්තමානෙ මුනි සන්තොති වුච්චතීති. ඉති ඛො පනෙතං වුත්තං කිඤ්චෙතං පටිච්ච වුත්තං. අස්මීති භික්ඛු මඤ්ඤිතමෙතං අයමහමස්මීතිමඤ්ඤිතමෙතං භවිස්සන්ති මඤ්ඤිතමෙතං න භවිස්සන්ති මඤ්ඤිතමෙතං, රූපී භවිස්සන්ති මඤ්ඤිතමෙතං, අරූපී භවිස්සන්ති මඤ්ඤිතමෙතං සඤ්ඤීභවිස්සන්ති මඤ්ඤිත මෙතං අසඤ්ඤී භවිස්සන්ති මඤ්ඤිතමෙතං, නෙවසඤ්ඤීනාසඤ්ඤී භවිස්සන්ති මඤ්ඤිතමෙතං, මඤ්ඤිතං භික්ඛු රොගො, මඤ්ඤිතං ගණ්ඩො, මඤ්ඤිතං සල්ලං සබ්බමඤ්ඤිතානං ත්වෙව භික්ඛු, සමතික්කමා මුනි සන්තොති වුච්චති. මුනි ඛො පන භික්ඛු සන්තො න ජායති න ජීයති, න මීයති, න කුප්පති, න පිහෙති තම්පිස්ස භික්ඛු නත්ථි යෙන ජායෙථ, අජායමානො කිං ජීයිස්සති අජීයමානො කිං මීයිස්සති අමීයමානො කිං කුප්පිස්සති අකුප්පමානො කිස්ස පිහෙස්සති යත්ථට්ඨිතං මඤ්ඤුස්සවා නප්පවත්තන්ති මඤ්ඤුස්සවෙ ඛො පන නප්පවත්තමානෙ මුනි සන්තොති. වුච්චති ඉති යං තං වුත්තං ඉදමෙතං පටිච්ච වුත්තං.**

ධාතු විභංග සූත්‍රයේදී බුදුපියාණන්වහන්සේ උද්දෙස පාඨය වශයෙන්, මාතෘකා පාඨය වශයෙන්, යම්කිසි කාරණා කීපයක් ඉදිරිපත් කරල, ඒවාම ක්‍රමක්‍රමයෙන් විග්‍රහ කරල, පැහැදිලි කරල, විස්තර කරල, තමයි සූත්‍රදේශනාව අවසාන කරන්නෙ. මුලින්ම කියාපු පාඨය බුදුපියාණන්වහන්සේ අර මුලදි ප්‍රකාශකළ ඒ මාතෘකා වශයෙන් තැබූ පාඨයයි. ඒකෙ අදහස- 'යම්තැනක සිටියේ මඤ්ඤනාධාරාවෝ ගලා නොඑත්ද, මඤ්ඤනා ධාරාවන් ගලා නොඑන කල්හි මුනිවරයා ශාන්ත යයි කියනු ලැබේ, යනුවෙන් ඉහත කියන ලදී'. මාතෘකා පාඨයෙන් කියාපු විස්තරයයි ඒ සඳහන් කළේ. ඊළඟට, 'කිඤ්චෙතං පටිච්ච වුත්තං' - කුමක් නිසා එසේ කියන ලද්දේද? බුදුපියාණන්වහන්සේම 'කථෙතුකම්‍යතා' වශයෙන් ප්‍රශ්නකරල ඒක තව විග්‍රහ කරනව. අස්මීති භික්ඛු මඤ්ඤිතමෙතං' මෙතන 'භික්ඛු' කියල අමතන්නෙ පුක්කුසාති ස්වාමීන්වහන්සේටයි. මහණ, 'වෙමි' යන මෙය මඤ්ඤිතයකි. 'අයමහමස්මීති මඤ්ඤිතමෙතං' - 'මේ මම වෙමි' යන මෙය මඤ්ඤිතයකි. 'භවිස්සන්ති මඤ්ඤිතමෙතං' - 'වන්නෙමි' යන මෙය මඤ්ඤිතයකි. 'න භවිස්සන්ති මඤ්ඤිතමෙතං' - 'නොවන්නෙමි' යන මෙය මඤ්ඤිතයකි. 'රූපී භවිස්සන්ති මඤ්ඤිතමෙතං' - 'රූපී වන්නෙමි' යන මෙය මඤ්ඤිතයකි. 'අරූපී භවිස්සන්ති මඤ්ඤිතමෙතං' - අරූපී වන්නෙමි' යන මෙය මඤ්ඤිතයකි. 'සඤ්ඤී භවිස්සන්ති මඤ්ඤිතමෙතං' - 'සඤ්ඤීවන්නෙමි' යන මෙය මඤ්ඤිතයකි. 'අසඤ්ඤී භවිස්සන්ති මඤ්ඤිතමෙතං' - අසඤ්ඤී වන්නෙමි' යන මෙය මඤ්ඤිතයකි. 'නෙවසඤ්ඤීනාසඤ්ඤී භවිස්සන්ති මඤ්ඤිතමෙතං' - 'සඤ්ඤිත් නොවන අසඤ්ඤිත් 'අසඤ්ඤී භවිස්සන්ති මඤ්ඤිතමෙතං' - අසඤ්ඤී වන්නෙමි' යන මෙය මඤ්ඤිතයකි. නොවන තත්ත්වයට පත්වන්නෙමි' යනුවෙන් සිතීමත් මඤ්ඤිතයකි.

මඤ්ඤිතං භික්ඛු රොගො, මඤ්ඤිතං ගණ්ඩො, මඤ්ඤිතං සල්ලං' මහණ, මඤ්ඤිතය රෝගයකි, මඤ්ඤිතය ගඩකි. මඤ්ඤිතය උලකි. 'සබ්බමඤ්ඤිතානං තෙව්ව භික්ඛු සමතික්කමා මුනි සන්තොති වුච්චති.' සියලු මඤ්ඤිතයන්ගේම ඉක්මවීමෙන් මුනිවරයා ශාන්තයයි කියනු ලැබේ.'

'මුනි ඛො පන භික්ඛු සන්තො න ජායති' - මහණ, ශාන්ත වූ මුනිවරයා නූපදී'. න ජීරති - නොදිරයි, 'න මීයති' - නොමියෙයි, 'න කුප්පති' - සසල නොවෙයි, චංචල නොවෙයි. 'න පිහෙති' - ආශා නොකරයි, තම්පිස්ස භික්ඛු නත්ථි යෙන ජායෙථ' යමකින් උපත වේද, ඒද ඔහුට නැත. 'අජායමානො කිං ජීයිස්සථ' - නූපදනේ කෙසේ නම් දිරන්නේද? අජීයමානො කිං මීයිස්සථ' - නොදිරන්නේ කෙසේ නම් මැරෙන්නේද? 'අමීයමානො කිං කුප්පිස්සති' - නොමැරෙන්නේ කෙසේ නම් සසල වන්නේද? චංචල වන්නේද? 'අකුප්පමානො කිස්ස පිහෙස්සති' - චංචල නොවන්නේ කුමකට නම් ආශා කරන්නේද? 'යත්ථට්ඨිතං මඤ්ඤුස්සවා නප්පවත්තන්ති මඤ්ඤුස්සවෙ ඛො පන නප්පවත්තමානෙ මුනි සන්තොති වුච්චති ඉති යං තං වුත්තං ඉදමෙතං පටිච්ච වුත්තං' අර කියාපු පාඨය දැන් එතකොට විග්‍රහ කරල ඉවරයි. ඒ විග්‍රහ කළ බවයි අවසාන වශයෙන් බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කරන්නෙ. 'යත්ථට්ඨිතං' ආදී පාඨයෙන් යම් අදහසක් ප්‍රකාශ කළාද, ඒ මෙන්න මේ අදහස නිසයි, කියල මේ ඡේදයෙන් සම්පූර්ණයෙන්ම විග්‍රහ කරනව, එතකොට මෙයින් අපට පේනව, මේ නිර්වාණගාමී ප්‍රතිපදාවට මේ මඤ්ඤිතයන් පිළිබඳ ප්‍රශ්නය කොයිතරම් වැදගත්ද කියන එකත්. මේ සූත්‍රදේශනාව අගට එන බොහොම සාරගර්භ ඡේදයක් තමයි මේක. මෙයින් පෙනීයනව අපට මඤ්ඤනා ගලා නොඑන විමුක්ත තත්ත්වයට පත් වූ සිතක් ඇති ඒ මුනිවරයා ශාන්ත බව. ශාන්ත තත්ත්වයකට පත්වෙනව. ඒ මුනිවරයා ජාති ජරා මරණ ආදියෙන් මෙලොවදීම මිදෙන්නෙ භවනිරෝධය මෙලොවදීම ප්‍රත්‍යක්ෂ කර ගත්ත නිසයි. අන්න ඒක නිසා තමයි අතන අර කියවුණේ 'තම්පිස්ස භික්ඛු නත්ථි යෙන ජායෙථ' - යමක් නිසා උපත වේද, එද ඔහුහට නැත. යම් භවයක් නිසා - 'භව පච්චයා ජාති' - යම් භවයක් නිසා උපතක් ගැන කථාකරන්න පුළුවන්ද, ඒ භවය පවා ඔහුට නැත. 'අජායමානො කිං ජීයිස්සථ' - නූපදනේ කෙසේනම් දිරන්නේ වේද? ඒවායේ ප්‍රත්‍යසම්බන්ධතාව නිසයි ඒක වෙන්නෙ. මෙතනදී අපට මතක් කරගන්න පුළුවන් තවදුරටත් මේ කාරණය පැහැදිලි කරගැනීම සඳහා, අපි කලින් අවස්ථාවක සඳහන් කළ ගසක් පිළිබඳ උපමාව. ජාති ජරා මරණ ආදී සංකල්ප එකිනෙකට සාපේක්ෂක බව තේරුම් කිරීමට අපි එක්තරා උපමාවක් - සූත්‍රවල තියෙන උපමාවක් නොවෙයි - ඉදිරියට ගත්තා, ඒ කිව්වෙ, දැන් යම්කිසි ගසක් තියෙනව, ඒ ගසේ දලුත් කොළත් මලුත් ගෙඩිත් දැවත් විකුණල යම් ජීවිකාවක් කරගන්න පුළුවනි. අන්න ඒ ගසේම දලු විකුණා ජීවත්වෙන මිනිසෙකුත්, කොළ විකුණා ජීවත්වෙන

මිනිසෙකුත්, මල් විකුණා ජීවත්වෙන මිනිසෙකුත්, දැව විකුණා ජීවත්වෙන මිනිසෙකුත්, පෙලගස්වල ඒ ගසේ වැඩීමේ යම්කිසි අවස්ථාවකදී ඒ ගස පෙන්වල ඇහුවොත් මේ ගස ලාද, මෝරලාද කියල, ඒ පස්දෙනා දෙන පිළිතුරු වෙනස්වෙන්න පුළුවන් එක් එක්කෙනාගෙ උපාදානය අනුව. ඒ ඒ අය ගස දිහා බලන දෘෂ්ටිකෝණය වෙනස් නිසයි. දැන් අපි නිදසුන් හැටියට ගත්තොත් දලු විකුණා ජීවත්වෙන මිනිහ, ඒ දලු කොළ බවට හැරෙනකොට කියාවි "මේක මෝරල වැඩියි" කියල. ඊළඟට කොළ හැලිල මල් පිපෙන කාලෙට, කොළ විකුණල ජීවත්වෙන පුද්ගලය කියන්න පුළුවනි සමහර විට "මේ ගහ මෝරල වැඩියි" කියල. මල් විකුණල ජීවත්වෙන පුද්ගලය ඒ මල් ගෙඩි බවට හැරෙන කොට කියාවි "මේ ගහ මෝරල වැඩියි" කියල. ඔන්න ඔය විදියට කල්පනාකරල තේරුම්ගන්න පුළුවනි. මේ සංකල්පය ඒ ඒ පුද්ගලය ගන්න උපාදානය, අල්ලගන්න දෙය, අනුව වෙනස් වෙන බව. මේවායේ සාපේක්ෂක බවක් තිබෙනව. අන්න ඒ නිසා තමයි, දැන් මේ මුනිවරයා අල්ලගෙන සිටි හැම එකක්ම අතහැරිය. සම්පූර්ණයෙන්ම උපාදානයත් අතෑරිය. මඤ්ඤිතයත් අතෑරිය. අන්න ඒක නිසා තමයි 'අජායමානො කිං ජීයිස්සති'. ඒ මුනිවරයට භවයක් නැහැ. භවය නැති නිසාම ජාතියක් නැහැ. ජාතිය නැති නිසාම දිරීමක් නැහැ. ඒක ඉතාමත්ම ප්‍රකට කාරණයක්. 'ජරා' කියන වචනෙ වැඩීමත් දිරීමත් කියන දෙකම තියෙනව. යම්කිසි සීමාවක් තියලයි අපි වැඩීම ඉවර වෙලා දිරීම පටන් ගන්නව කියල කියන්නෙ. ඒ සීමාව අප අපට, අපගේ උපාදානය අනුව, අප ඒ දිහා බලන දෘෂ්ටි කෝණය අනුව වෙනස් වෙනව. ඒකයි අපි මේ උපමාවකින් පෙන්නුම් කළේ. එතකොට ඊළඟට කියැවෙනව 'අජීයමානො කිං මීයිස්සති' එතකොට ජරාවක් නැත්නම්, ජරාව කියල කියන්නෙ මරණයට ළංවීමක්, දිරායාමක්. එතකොට ජරාවක් නැත්නම් මරණයකුත් නැහැ එතන. මරණයක් නැති බව අපට කලින් අවස්ථාවක උද්ධෘතවශයෙන් දැක්වූ අධිමුත්ත ථෙරගාථා වලිනුත් පෙනී ගියා.

අධිමුත්ත තේරුන්වහන්සේව පල්හොරුන් එකතුවෙලා මරන්න සූදානම් වෙනකොට උන්වහන්සේ ප්‍රකාශ කළේ,

> **'න මෙ හොති අහොසින්ති- භවිස්සන්ති න හොති මෙ**[2]
> **සංඛාරා විභවිස්සන්ති - තත්ථ කා පරිදෙවනා'**

'මට හිතෙන්නෙ නැහැ මමූ ඉස්සර හිටිය කියල. මට හිතෙන්නෙ නැහැ අනාගතයෙ ඉන්නව කියල. සංස්කාරයන් පමණක් නැතිවෙනව[2]. ඉතින් මොකක්ද මෙතන වැලපෙන්න තියෙන්නෙ.' ඔන්න ඔය විදියට ප්‍රකාශ කළෙත් අර කාරණය නිසයි. දැන් දිරීමක් නැහැ, තමන් ඔක්කොම උපාදානයන් අතහැරල නිසා, ඒ නිසාම මරණයත් නැහැ.

'අමීයමානො කිං කුප්පිස්සති' - මෙතන කුප්පති කියල කියන්නේ කෝප්‍ය වීම, කෝප වීම නොවෙයි මෙතන හැඟෙන්නෙ. සසල වීම, චංචල වීම කියන අදහසයි. යමක් අල්ලගෙන ඉන්නවනම්, එතනින් තල්ලුකරල දානකොට ඇතිවන එක්තරා විදියක කම්පනයක්, - කොටින්ම, කම්පනයක් කියල ගන්නත් පුළුවන්. එතකොට 'අමීයමානො කිං කුප්පිස්සති', නිවනට යොදන වචනයක්, අපි කලිනුත් සඳහන් කළා - 'අකුප්පා චෙතොවිමුත්ති'. ලෝකයේ ඇතිතාක් අනෙක් හැම චෙතොවිමුක්තියක්ම කුප්පයි. 'කුප්ප' කියල කියන්නෙ කෝප්‍යයි. චංචල වෙනව. මරණය ඉදිරියෙ සසල වෙනව. මරණ වේදනාව ඉදිරියෙ සසල වෙනව. නිවන පමණක් 'අකුප්පාචෙතොවිමුත්ති'. එතකොට රහතන් වහන්සේ, මේ ශාන්තවූ මුනිවරයා, 'අනාසවං චෙතොවිමුත්තිං, පඤ්ඤාවිමුත්තිං' යනුවෙන් හැඳින්වෙන, ඒ ආශ්‍රවයන්ගේ ගලා ඒමක් නැති අරහත් ඵලසමාධියේ, අරහත් ඵල ප්‍රඥාවේ, පිහිටි ඒ ශාන්ත මුනිවරයා මරණය ඉදිරියේ කම්පනයකට පත්වන්නේ නැහැ. සසලවීමක් නැහැ. සිත පිළිබඳව සසලවීමක් නැහැ. ඒකම තමයි අර අධිමුත්ත තෙරුන්වහන්සේ පල්හොරුන්ට නිර්භයව ප්‍රකාශ කළේ.

**'අමීයමානො කිං කුප්පිස්සති - අකුප්පමානො කිස්ස පිහෙස්සති'[3]**

එහෙම කෝප්‍ය වෙන්නෙ නැත්නම්, සසල වීමක්, තැති ගැන්මක් නැත්නම්, කුමකට ආශා කරන්නේද? 'පිහා' කියල කියන්නෙ ආශාව, යම් යම් දේවල් වලට ආශාකිරීම. විශේෂයෙන්ම මෙතන යෙදිල තියෙන්නෙ අර මරණය නිසාම, තෘෂ්ණාව ක්ෂය නොකළ පුද්ගලයා තුළ යම්කිසි ආශාවක් ඇතිවෙනව. ඒ ආශාවට පිළිතුරු වශයෙන් තමයි කර්මානුරූපව යම්කිසි භවයකට ඒ තැනැත්තා එළඹෙන්නෙ. එතකොට ඒ ආශාව නැහැ මේ මුනිවරයා තුළ. මක්නිසාද එයින් චංචලවීමක් නැතිනිසාම. තවත් **'බලාපොරොත්තු'** නැහැ. ඉච්ඡා, බලාපොරොත්තු, මේ කිසිවක් නැහැ. 'අකුප්පමානො කිස්ස පිහෙස්සති' - චංචල වීමක් නැති නිසාම කුමකට නම් ආශා කරන්නේද? මෙයින් අපට පේනව එතකොට, අර ජාති ජරා මරණ ආදි ඒ සංකල්ප සියල්ලම අර්ථශූන්‍ය වෙනව මේ මුනිවරයාට. ඒ නිසාමයි උන්වහන්සේ ශාන්ත වන්නෙ. අර මඤ්ඤිතයන් සියල්ලම ඉක්මවීම නිසා. එතකොට මෙයින් අපට පැහැදිලි වෙනවා මේ 'නිවන' අජරාමර තත්ත්වයක්. මෙලොව ප්‍රත්‍යක්ෂකරගත හැකි අජරාමර තත්ත්වයක්, හැටියට හඳුන්වන්නෙ මක්නිසාද කියන එක මේ සූත්‍ර දේශනාවෙනුත් අපට තේරුම් ගන්න පුළුවනි. මෙලොව වශයෙනුත් ජරාවත් මරණයත් ජයගෙන, ඒ මුනිවරයා. මක්නිසාද? භවනිරෝධය මෙලොවදීම ප්‍රත්‍යක්ෂ කළ නිසා. මේක මහ පුදුම කාරණයක්. භව නිරෝධය ඵලසමාපත්තියේදී ප්‍රත්‍යක්ෂ කරනව. භව නිරෝධය ප්‍රත්‍යක්ෂ කරන්නෙ කොහොමද? තණ්හාව ක්ෂය කළා. ඊළඟට උපාදානය නැහැ. ඒකනිසා භවය නැහැ. භවය නැති නිසාම ජාති ජරා මරණ ඒ එක්කම අර සෝක පරිදේව ආදී ඒ සියල්ලම නැහැ.

එතකොට මේ අනුව අපට හිතාගන්න පුළුවනි, මේ ජාති ජරා මරණ සෝක පරිදේව දුක්ඛ දොමනස්ස උපායාස කියන මේ සංකල්ප සියල්ලක්ම පැවැත්මක් පිළිබඳ මානය - අස්මි මානය - පදනම්කරගත් සඤ්ඤා විපල්ලාස චිත්තවිපල්ලාස දිට්ඨි විපල්ලාස සමූහයක ප්‍රතිඵලයයි. මේව එහෙම පිටින්ම විපර්යාස ගොඩක්. සඤ්ඤා විපල්ලාස, චිත්ත විපල්ලාස, දිට්ඨි විපල්ලාස වශයෙන් සිතින්ම මවාගත්තු සංකල්ප ගොඩක් මෙතන තියෙන්නෙ. ජාති ජරා මරණ සෝක පරිදේව දුක්ඛ දොමනස්ස උපායාස ආදී මේ දුක් කඳ, සම්පූර්ණයෙන්ම මේ දුඃඛස්කන්ධය සිතින්ම මවාගත්තු එකක්. මෙතෙන්දි තවදුරටත් මේ කාරණය පැහැදිලි කරගැනීමට අපි කලින් අවස්ථාවක සඳහන් කළ, වරපටක, කඹයක, උපමාව ගැනත් හිත යොදල බලමු. අපි සඳහන් කළා එකම පැත්තට කරකැවෙමින් තිබෙන වරපටවල් කීපයක්, එහෙම නැත්නම් ලනුපොටවල් කීපයක්, වරපටක් හෝ කඹයක් බවට පත්වෙන්නෙ, කවුරුහරි මැදින් අල්ලගත්තු අවස්ථාවෙදියි. එතෙක් ඒක ඔහේ කරකැවෙමින් තියෙනව. ගැට වැටීමක්, දඟ වැටීමක් මුකුත් නැහැ. මැදින් කවුරුහරි අල්ලගත්තු හැටියෙ ඔන්න පටන්ගන්නව දඟලීම් දැඟලීම් ගොඩක්. ගැට වැටෙන්නත් පටන්ගන්නව. අන්න ඒ උපාදානය නිසා, මැදින් අල්ලාගැනීම නිසා. අන්න ඒ විදියෙ දෙයක් තමයි මේ භවය පිළිබඳවත් තියෙන්නෙ. අනිත්‍යතා වශයෙන් ලෝකයේ හැම දෙයක්ම වෙනස් වෙනව. නමුත් මේ වෙනස්වන දෙය ඉතාමත්ම අහිංසක විදියටයි වෙනස්වෙන්නෙ. මේ අනිත්‍යතාව අහිංසකයි. 'අහිංසක' කියන වචනය අපි මෙතන යොදන්නෙ එයින් කාටවත් පීඩාවක් නැහැ. ඒක ලෝකස්වභාවය. තථතාව, ධම්මතාව. මේකෙන් පීඩාවක් වෙන්නෙ මැදින් අල්ලගත්තු හැටියෙ. කඹයේ දඟවැටෙන්න පටන්ගත්ත වගේ. මේ දඟලීම් දැඟලීම් සියල්ලම භවය පිළිබඳව - අපට හිතාගන්න පුළුවන් - භව සංස්කාර හැටියට සළකන්නෙ ඒවයි. මේ සංස්කාර ගොඩක් පටන්ගන්නෙ එතනිනුයි. අවිද්‍යාව නිසා සංස්කාර ඇතිවෙනව කියන එක අපිට ඒ අනුව හිතා ගන්න පුළුවනි. එතකොට කඹය අල්ලාගැනීම ගැන කල්පනා කරනකොට තවත් අංශයක් මෙතන තිබෙනව. මේ මැදින් අල්ලා ගැනීම නිසා දෙකොනක් ඇතිවෙනව. මෙතනත් තිබෙනව එක්තරා 'උභතෝකෝටික' තත්ත්වයක්. සිත යොදනකොටයි මේක හොඳට පැහැදිලිවන්නෙ. දෙකොනක් සහ මැදක් කියන අදහස පැන නගින්නෙ අර මැදින් අල්ලාගැනීම නිසා. එතකොට අල්ලාගැනීම නිසා දෙකොනක් ඇතිවෙනව මේ භවයෙ. ඒ වගේම 'දෙයක්' බවට පත්වීම නිසාම 'අන්දෙයක්' බවට පත්වෙනව. මඤ්ඤනා ගැන කලින් අවස්ථාවක අපි සඳහන් කළා 'යෙන යෙන හි මඤ්ඤන්ති තතො තං හොති අඤ්ඤථා' ආදී ගාථාවෙන්. මේ මඤ්ඤනා පිළිබඳ මහ පුදුම විදියෙ උභතෝකෝටික තත්ත්වයක් තමයි මඤ්ඤනා නිසාම දෙයක් බිහිවන බව. මඤ්ඤනා කිරීම නිසයි යම්කිසි දෙයක් 'දෙයක්' බවට පත්වෙන්නෙ. එතකොට ඒ 'දෙයක්' බවට පත්වීම හා සමගම

අඤ්ඤථා භාවයට පත්වෙනව. 'යෙන යෙන හි මඤ්ඤන්ති තතො තං හොති අඤ්ඤථා' - මෙතන තියෙන්නෙ මහ පුදුම විදියෙ උභතෝකෝටික ප්‍රශ්නයක්. එක තැනකින් අල්ලාගැනීම නිසා දෙකොනක් ඇතිවෙනව. ඒ වගේම 'දෙයක්' බවට පත්උන හැටියෙ ඒක 'අන්දෙයක්' බවට පත්වෙන්නෙ පටන්ගන්නව. අනිත්‍යතා ධර්මයට යට වෙනව. මේ ධර්මතාව පෙන්නුම් කරන සූත්‍රදේශනා කොතෙකුත් අපට සූත්‍ර පිටකයෙ හමුවෙනව. ඒව සමහර විට පැහැදිලිව විග්‍රහ කෙරිල නැති බව පමණයි කියන්න තියෙන්නෙ. මේ දෙකොනක් සහ මැද කියන අදහස සමහර විට යෙදිල තියෙනව 'උඩ' 'යට' 'සරස' 'මැද' කියල - 'උද්ධං අධො තිරියං මජ්ඣෙ' තවත් සමහර විට යෙදිල තියෙනව 'පෙර' 'පසු' 'මැද' කියල. 'පුරෙ පච්ඡා මජ්ඣෙ'. ඔය විදියට නිවන පිළිබඳව ප්‍රකාශවෙන ගැඹුරු අදහස් යම් යම් සූත්‍ර දේශනාවල යෙදිල තියෙනව. අපි ඒකට හොඳ නිදසුනක් හැටියට සුත්ත නිපාතයෙ පාරායණ වග්ගයෙ මෙත්තගූමාණව පුච්ඡාවෙ එන ගාථා යුගලයක් ඉස්සරහට ගනිමු.

1. **'යං කිඤ්චි සම්පජානාසි - උද්ධං අධො තිරියඤ්චාපි මජ්ඣෙ**
   **එතෙසු නන්දිං ච නිවෙසනං ච - පනුජ්ජ විඤ්ඤාණං භවෙ න තිට්ඨෙ**

2 **.'එවං විහාරී සතො අප්පමත්තො - භික්ඛු චරං හිත්වා මමායිතානි**
   **ජාති ජරං සොක පරිද්දවං ච - ඉධෙව විද්වා පජහෙය්‍ය දුක්ඛං'**[4]

'යං කිඤ්චි සම්පජානාසි උද්ධං අධො තිරියඤ්චාපි මජ්ඣෙ' - උඩත් යටත් මැද සරසත් යමක් ඇතැයි දන්නෙහිද, යම්තාක් දැයක් ඇතැයි දන්නෙහිද, 'එතෙසු නන්දිං ච නිවෙසනං ච' ඒ හැම දෙයක්ම පිළිබඳව 'නන්දි' නම් වූ සතුටු වීමත්, 'නිවෙසනං' නම්වූ පැලපදියම් වීමත්, 'පනුජ්ජ' - අතහරින්නේය. එවිට විඤ්ඤාණය භවයෙහි නොරඳන්නේය.

'එවංවිහාරී සතො අප්පමත්තො - භික්ඛු චරං හිත්වා මමායිතානි' - මෙසේ සතිමත්ව අප්‍රමාදීව වාසය කරන්නාවූ භික්ෂුව 'මමායිතයන්' නම් වූ මමය මාගේය යයි කියාගත් දේ අතහැර හැසිරෙන්නේ, 'ජාති ජරං සොක පරිද්දවං ච - ඉධෙව විද්වා පජහෙය්‍ය දුක්ඛං' 'ඉධෙව' - මෙහිදීම ජාති ජරා සොක පරිදෙව දුක්ඛ ආදී මේ සියල්ලම තේරුම් අරගෙන අතහරින්නේය. මේ 'ඉධෙව' කියන වචනය ඉතාම වැදගත්. මෙහිදීම ඒ සියල්ල අතහරිනවා, නැවත භවයක් එනකං ඉන්නෙ නැතිව. එතකොට, මෙන්න මේ අදහසට, 'ඉධෙව' කියන අවධාරණය යෙදිල තියෙනව සුත්ත නිපාතයෙ අට්ඨක වග්ගයෙ මහා වියූහ සූත්‍රයෙත්. 'චුතූපපාතො ඉධ යස්ස නත්ථි' රහතන් වහන්සේ පිළිබඳව යෙදෙනව, රහතන් වහන්සේට මෙහිදීම, මෙලොවම චුතූපපාතයක් නැහැ. චුතියක් උත්පත්තියක් නැහැ. ඒ සංකල්ප අර්ථ ශූන්‍යයි. මේ දෙවෙනි ගාථාවෙ යෙදිල තිබෙන වැදගත් වචනයක් තමයි 'නිවෙසනං' කියන එක. 'නන්දිංච නිවෙසනංච' කියල අපි සඳහන් කළා. 'නිවෙසනං' කියල කියන්නෙ පැලපදියං වීම.

විඤ්ඤාණයෙ තිබෙනව එක්තරා පැලපදියම් වීමේ ස්වභාවයක්. ඒක නිසා තමයි සමහර තැන්වල තියෙන්නෙ 'රූප ධාතු බො ගහපති විඤ්ඤාණස්ස ඔකො'[5]. රූප, වේදනා ආදී ඒ එක එකක් අරගෙන කියනව රූපධාතුව විඤ්ඤාණයේ ගෙදරයි' විඤ්ඤාණයේ වාසස්ථානයයි. 'ඔක' 'නිකෙත' 'නිවෙසන' කියන පද සමානාර්ථවත්. ගෙදර, නිවෙස, කියන අදහසයි. ඒව නිතරම යෙදිල තියෙනව. විඤ්ඤාණයේ තියෙනව එක්තරා පැලපදියම් වීමේ ස්වභාවයක් ගෙවදින ස්වභාවයක්. පදිංචිවන සවභාවයක්. එතකොට පදිංචි නොවන ස්වභාවය ඇති විඤ්ඤාණය තමයි අනිදස්සන 'විඤ්ඤාණය, විඤ්ඤාණයේ පැලපදියම් වන ස්වභාවය අතහැරියාම. එතෙන්දි තිබෙන්නෙ 'අනිදස්සන විඤ්ඤාණයක්'. ඊළඟට අපට ධාතුවිභංග සූත්‍රයේ අපි සඳහන් කළ ඡේදයත් මතුකර ගන්න පුළුවනි. මෙතන කියැවුනා මඤ්ඤනා ධාරාවන් ගලා ඒමක් ගැන. 'යම් තැනක සිටියේද, සිටි විට, මඤ්ඤනාධාරාවෝ ගලා නොඑත්ද, කියලයි මේ ඡේදය පටන්ගන්නෙ. මේ මඤ්ඤනා ධාරාවන් ගලා ඒම පිළිබඳ අදහස ඇත්ත වශයෙන්ම තේරුම්කරන්නෙ 'ආසව' කියන වචනයෙන්. මේ 'ආසව' කියන වචනය ප්‍රකට වචනයක්. ආශ්‍රවයන්, ඕසයන් වශයෙන් දැක්වෙනව, කාම භව, දිට්ඨි අවිජ්ජා කියන ඒ ධර්ම හතර. මේ කියන්නෙ සාංසාරික පුරුදු ප්‍රවාහ හතරක් සත්ත්වයාගේ සිත් තුළට ගලාගෙන එන, නිරන්තරව ගලාගෙන එන සාංසාරික පුරුදු ප්‍රවාහ හතරක්. කාම භව දිට්ඨි අවිජ්ජා' මේව ආශ්‍රව වශයෙනුත් දක්වනව. 'ඔඝ' කියලත් දැක්වෙනව. 'ඔඝ' කියල කියන්නෙ සැඩවතුරු. එතකොට මේ 'යම් තැනක සිටියේ කියල කිව්වෙ ඒ සැඩවතුරු ගලාගෙන ආවාම, ඒ ගලාගෙන එන මඤ්ඤස්සවා වලින් පීඩාවක් නැති තැනක්. ඒ නිසාම තමයි නිවනට 'දීපං' කියල යොදල තියෙන්නෙ. නිවන පිළිබඳ පර්යාය පද අතර 'දීපං' කියන පදය තියෙන නිසා, සමහර කෙනෙක් හිතන්න පුළුවනි, මේක මේ ලෝකයේ යම්කිසි තැනක තියන 'තැනක්' කියල. ඇත්ත වශයෙන්ම ඒ වගේ සංකල්පයකට තමයි නිබ්බානය තේරීමේදී ඇතැම් කෙනෙක් බර වෙන්නෙ. නමුත් මේ නිවනම දිවයිනක් කියල කිව්වෙ මක්නිසාද කියන එක ඉතාමත්ම හොඳින් පැහැදිලි වෙන සූත්‍රයක් තමයි පාරායණ වග්ගයෙම එන කප්පමාණවපුච්ඡාව. කප්ප කියන බ්‍රාහ්මණ මාණවකයා බුදුපියාණන් වහන්සේගෙන් ඇසූ ප්‍රශ්නය මොකක්ද?

**'මජ්ඣෙ සරස්මිං තිට්ඨතං - ඔඝෙ ජාතෙ මහබ්භයෙ**
**ජරා මච්චු පරෙතානං - දීපං පබ්‍රෑහි මාරිස**
**ත්වඤ්ච මෙ දීපං අක්ඛාහි - යථයිදං නාපරං සියා'**[6]

'මජ්ඣෙ සරස්මිං තිට්ඨතං ඔඝෙ ජාතෙ මහබ්භයෙ' - මහත් භයානක වූ සැඩවතුර ගලාගෙන එන කල්හි, 'ජරා මච්චු පරෙතානං දීපං පබ්‍රෑහි මාරිස' ජරා මරණයට කැපව, විල මැද සිටින සත්ත්වයාට දිවයිනක් කියනු මැන

නිදුකාණෙනි'. 'ත්වඤ්ච මෙ දීපං අක්ඛාහි - යථයිදං නාපරංසියා' - ඔබ මට මේ දුක්කඳ නැවත ඇති නොවන පරිදි දිවයිනක් කියනු මැනව කියල ඒ විදියට ඉල්ලා සිටිය බුදුපියාණන් වහන්සේගෙන්. බුදුපියාණන් වහන්සේ ඊට දුන්න පිළිතුර මොකක්ද?

**'අකිඤ්චනං අනාදානං - එතං දීපං අනාපරං**
**නිබ්බානමිති නං බ්‍රෑමි - ජරාමච්චු පරික්ඛයං'**

'අකිඤ්චනං අනාදනං - එතං දීපං අනාපරං' - අකිඤ්චනං' කියල කියන්නෙ කිසිවක් අයත් නැතිබව. 'අනාදනං' - කිසිවක් අල්ලාගත්තෙ නැතිබව. මේ පද දෙකෙනුයි බුදුපියාණන් වහන්සේ නිවන හඳුන්වන්නෙ. කිසිවක් අයත් නැති බවත්, කිසිවක් අල්ලානොගත් බවත්, තණ්හාව ක්ෂය වීමත්, උපාදානය ක්ෂය වීමත්. මේ පද දෙකට තමයි මම 'නිවන' කියල කියන්නෙ. 'එතං දීපං අනාපරං' - වෙන දිවයිනක් තිබුන නම් බුදුපියාණන්වහන්සේ මෙතන ප්‍රකාශ කරනව. එතකොට මෙතන ගැඹුරු අර්ථයක් බවයි 'දීපං' කියන වචනයෙන් පෙනී යන්නෙ. අකිඤ්චන අනාදාන තත්ත්වය - මෙයමයි දිවයින. 'අනාපරං' වෙන එකක් නොවෙයි. 'නිබ්බානමිති නං බ්‍රෑමි' - මම එයට නිබ්බාන කියල කියනව. නිබ්බාන කියන වචනය මම යොදන්නෙ ඔය වචන දෙකටයි. 'අකිඤ්චන අනාදාන' තත්ත්වයටමයි. ඒ තත්ත්වයට මම 'නිවන' යයි කියමි. 'ජරා මච්චු පරික්ඛයං' - ඒ තත්වය කෙබඳු එකක්ද? ජරාවත් මරණයත් ක්ෂය කරන සවභාවය ඇති දෙයක් - 'ජරාමච්චු පරික්ඛයං'

එතකොට මේ අවස්ථාවෙදීම අපිට දැන් ඉතින් සෑහෙන පමණ ඒකට පසුබිම සූදානම් වුනු නිසා - ධාතුවිභංග සූත්‍රයෙ තවත් කොටසක් තිබුනත්, ඉදිරියට ගන්න පුළුවනි නිතර නිබ්බානය ගැන සාකච්ඡා කිරීමේදී ඉදිරිපත් කරන උදාන පාළියේ පාටලීගාමියවග්ගයේ එන කෙටි සූත්‍රයක්. ඒ සූත්‍රය තේරුම් ගැනීම පහසුයි දැනට අපි කළ මේ විග්‍රහය අනුව. ඒ නිසයි මේ අවස්ථාවෙ ඒක ඉදිරිපත් කරන්නේ.

**'අත්ථි භික්ඛවෙ අජාතං අභූතං අකතං අසංඛතං නොචෙතං භික්ඛවෙ අභවිස්ස අජාතං අභූතං අකතං අසංඛතං නයිධ ජාතස්ස භූතස්ස කතස්ස සංඛතස්ස නිස්සරණං පඤ්ඤායෙථ යස්මා ච ඛො භික්ඛවෙ අත්ථි අජාතං අභූතං අකතං අසංඛතං තස්මා ජාතස්ස භූතස්ස කතස්ස සංඛතස්ස නිස්සරණං පඤ්ඤායති'**[7]

මෙතන කියැවෙන්නෙ, 'මහණෙනි, නූපන් හටනොගත්, නොකළ, සකස් නොකළ තත්ත්වයක් ඇත. 'අත්ථි භික්ඛවෙ අජාතං අභූතං අකතං, අසංඛතං' - මේ හැම එකක්ම නිවනට නම්. 'නොචෙතං භික්ඛවෙ අභවිස්ස අජාතං අභූතං අකතං, අසංඛතං නයිධ ජාතස්ස භූතස්ස කතස්ස සංඛතස්ස නිස්සරණං පඤ්ඤායෙථ' - යම් හෙයකින් මේ කියාපු අජාත, අභූත, අකත අසංඛත

තත්ත්වයක් නැතිවූයේ නම් 'න ඉධ' - ඔන්න තියෙනව මෙතනත් 'ඉධ' කියන වචනය - මෙහිදීම, 'න ඉධ' - ජාතස්ස භූතස්ස කතස්ස සංඛතස්ස නිස්සරණං පඤ්ඤායෙථ. මේ ලෝකයේදීම, මෙහිදීම, උපන්, හටගත්, කළ, සකස් කළ දෙයෙහි නිස්සරණයක්, ඒ දෙයින් නික්මීමක් දක්වාලිය නොහැක. ඒකම අවධාරණය කරනව ඊළඟට - 'යස්මා ච ඛො භික්ඛවෙ අත්ථි අජාතං අභූතං අකතං අසංඛතං තස්මා ජාතස්ස භූතස්ස කතස්ස සංඛතස්ස නිස්සරණං පඤ්ඤායති' - යම් හෙයකින් ඒ අජාත අභූත අකත අසංඛත තත්ත්වයක් තිබේද, ඒ නිසාම, ජාත භූත කත සංඛත තත්ත්වයෙන් නික්මීමක් ඇත.

මේ සූත්‍රයෙ අදහස: අජාත අභූත අකත, අසංඛත වචනවලින් පෙන්නුම් කරන්නෙ රහතන් වහන්සේගේ සිත, ජාති භව සංස්කාර ආදියෙන් විමුක්තවීමයි. ඒ රහතන්වහන්සේගේ ජාති නිරොධය, භවනිරොධය සංස්කාර නිරෝධය ප්‍රකාශකරන වචනයි අජාතං, අභූතං, අකතං ආදී වචනවලින් මෙතන දක්වල තියෙන්නෙ. එතකොට මේ හැම එකක්ම මේ සිතේම ඇතිවන එක්තරා තත්ත්වයක් හැටියටයි මෙතන ගත යුත්තෙ. නමුත් අටුවාවෙ පවා ධම්මපාල ස්වාමීන්වහන්සේ තෝරන්නෙ මේ සූත්‍රයේ අවශ්‍යයෙන්ම අවධාරණය කළයුතු 'ඉධෙව' කියන වචනය, 'ඉධ' කියන වචනය, ගැන වැඩි තැකීමක් නැතිවයි. 'න ඉධ ජාතස්ස භූතස්ස, කතස්ස සංඛතස්ස නිස්සරණං' - මෙහිදීම මේ කියාපු ජාත භූත කත සංඛත තත්ත්වයෙන් නිස්සරණයක් ඇතිවීම ඇත්තවශයෙන්ම අවධාරණය කළයුතු කාරණයක්. මක්නිසාද එතෙක් ලෝකයා සිතා සිටියේ මේ ජරා මරණාදියෙන් මිදෙන්න පුළුවන් වන්නෙ මෙයින් මියගියාට පස්සෙයි. අමෘතය දෙවියන් ගෙන් ලබාගත යුතු දෙයක් හැටියට එහෙම කල්පනා කරන්න පටන් ගත්ත. මේ ජරාමරණ ආදියෙන් මිදීම කරන්න පුළුවන් වන්නේ මෙතනින් මිය ගිහිල්ල යන තැනකදියි කියල. එතකොට මෙලොවදීම, දිටුදැමියෙහිම ජරාමරණ ආදියෙන්, ජාත භූත ආදියෙන් මිදෙනව කියන කාරණය අවශ්‍යයෙන්ම අවධාරණය කළ යුතු දෙයක්. අන්න ඒක නිසා තමයි මෙතන මේ 'අත්ථි භික්ඛවෙ අජාතං අභූතං . .' ආදී වශයෙන් දක්වල තියෙන්නෙ. නමුත් මේ 'ඉධ' කියන වචනය අවධාරණය කරනු වෙනුවට, සාමාන්‍යයෙන් මේ නිර්වාණය ගැන සාකච්ඡා කරන බොහෝදෙනා 'අත්ථි' කියන වචනය පමණක් අවධාරණය කරගෙන 'නිවන' පරමාර්ථ වශයෙන් තියෙන දෙයක් හැටියට, කොහේ කොහේදෝ යම්කිසි තැනක විශේෂයෙන් වෙනම තියෙන දෙයක් හැටියට, දක්වන්න උත්සාහ කරනවා. නමුත් මේ ධාතු විභංග සූත්‍රයේ අපි පෙන්නුම් කළ මඤ්ඤනා පිළිබඳ ඡේදයෙනුත් පැහැදිලි වෙනව, ගැඹුරින් ගතයුතු අර්ථවත් වචනකීපයක් මෙතන තියෙන්නෙ. 'අජාතං අභූතං අකතං, අසංඛතං' සිතින්ම මවාගත්තු භවයක්, සිතින්ම ඇතිකරගත්තු විපර්යාස ගොඩක්, මෙතන තියෙන්නෙ. එතකොට ඒවා නැතිකළ යුත්තෙත් මේ සිතේදිමයි. මේ සිතෙන්මයි. ඒ බවයි මෙතන කියැවුනෙ.

දැන් අපි ආයෙත් ධාතුවිභංග සූත්‍රයෙ තවත් අංශයකට සිත යොමු කරමු. මේ ධාතු විභංග සූත්‍රයෙ අග කෙළවරිනුයි අපි විග්‍රහය පටන් ගත්තෙ. මක් නිසාද, මඤ්ඤනා ගැන බුදුපියාණන්වහන්සේ ප්‍රකාශ කරන ඒ පාඨය වැදගත් නිසයි. නමුත් මේ සූත්‍රයේදී පුක්කුසාති ස්වාමීන්වහන්සේට ඇත්තවශයෙන්ම බුදුපියාණන්වහන්සේ ප්‍රකාශකරන්නෙ මඤ්ඤනාවන්ගෙන් සිත මුදාගැනීමේ එක්තරා ක්‍රමානුකූල ප්‍රතිපදාවක්. 'ඡ ධාතුරො අයං භික්ඛු පුරිසො "මහණ මේ පුරුෂයා කියන එක්කෙනා ධාතූන් හයකින් සමන්විත කෙනෙක්" කියලයි බුදුපියාණන්වහන්සේ දේශනාව අරඹන්නෙ. සත්ත්වයා කියල කියන්නෙ, මේ අනිත් දේටත් වඩා ඇත්ත වශයෙන්ම සිටින තැනැත්තා හැටියට වගෙයි මේ ලෝකයා හිතන්නෙ. එතකොට මේ සත්ත්ව සංකල්පය බිඳීමට බුදුපියාණන්වහන්සේ පුක්කුසාති ස්වාමීන්වහන්සේට වදාළ මේ දේශනාවේදී කළේ මොකක්ද? මේ පුරුෂයා කියන කෙනා ධාතු හයකින් සමන්විත හැටියට - මොනවද, පඨවි ආපො තෙජො වායො ආකාස විඤ්ඤාණ කියන මේ ධාතු හයෙන් සමන්විත කෙනෙක් හැටියට - අරගෙන ඒ එක් එක් ධාතුවෙන්, සිත, නිබ්බිද විරාග වශයෙන් මෑත්කර ගැනීමේ ක්‍රමය ඉතාමත් සරල අන්දමින් මේ සූත්‍රයෙ දක්වල තිබෙනව. අපි මේ දේශනා මාලාව ආරම්භයේදීම ප්‍රකාශකළා මේ ධර්මයේ ගැඹුර දැකිය හැක්කේ නිර්මල වූ සරලත්වය තුළින් කියල. සංකීර්ණත්වය තුළින් නොවෙයි. ඇත්ත වශයෙන්ම මේ සූත්‍රයෙත් තිබෙන්න එබඳු සරල ස්වරූපයක්. පසුකාලයක බෞද්ධ දාර්ශනිකයින් එක්තරා කාල්පනික පරමාණුවාදයක් ඔස්සේ යමින් සංකීර්ණ බවට පත්කරගත්තු ධාතුකම්ස්ථානය මේ ධාතු විභංග සූත්‍රයෙ දැක්වෙන්නෙ ඉතාමත් සරල අන්දමින්. කෙනෙකුට කෙලින්ම ප්‍රත්‍යක්ෂයට ළං කරගත හැකි අන්දමින්. නිදසුනක් වශයෙන් ගතහොත් පඨවි ධාතුව ගැන විස්තර කරද්දී බුදුපියාණන්වහන්සේ ප්‍රකාශකරන්නෙ, ආධ්‍යාත්මික පඨවිධාතුව පිළිබඳව නිදසුනක් හැටියට දෙන්නෙ, කාටත් පහසුවෙන් තේරුම්ගත හැකි මේ ශරීරයේ උපාදින්න වූ කෙස්, ලොම්, නිය, දත් ආදී ඒ කොටස්. බාහිර පඨවි ධාතුවට අමුතු නිදසුන් අවශ්‍ය නැති නිසා ඒව දීලවත් නැහැ. ඒව කෙනෙකුට හිතාගන්න පුළුවනි. අමුතු පරමාණු වාදයක් ඔස්සේ ගිහිල්ල නැහැ. නමුත් එක්තරා විශේෂ වැදගත් මූලධර්මයක් බුදුපියාණන් වහන්සේ මතුකරල දෙනව.

**'යාචෙව ඛො පන අජ්ඣත්තිකා පඨවිධාතු, යා ච බාහිරා පඨවි ධාතු, පඨවිධාතුරෙවෙසා තං නෙතං මම නෙසො හමස්මි, න මෙසො අත්තාති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා පඨවිධාතුයා නිබ්බින්දති, පඨවිධාතුයා චිත්තං විරාජෙති'**

මේ පාඨයේ තේරුම 'යා චෙව ඛො පන අජ්ඣත්තිකා පඨවිධාතු යා ච බාහිරා පඨවිධාතු පඨවිධාතුරෙවෙසා' - යම් ආධ්‍යාත්මික පඨවිධාතුවක් වේද යම් බාහිර පඨවිධාතුවක් වේද ඒ මේ දෙකම හුදු පඨවි ධාතුව මැයි. - 'තං නෙතං මම නෙසොහමස්මි නමෙසො අත්තාති එවමෙතං යථා භූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං' - මෙය මගේ නොවෙයි, මෙය මම නොවෙමි, මෙය මගේ ආත්මය නොවෙයි, යනුවෙන් එය යථාභූත වශයෙන්, තත්වූ පරිදි සම්‍යක් ප්‍රඥාවෙන් මනා නුවණින් දැකිය යුත්තේය. 'එව මෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා' - මෙසේ යථාභූත වශයෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දැක, 'පඨවි ධාතුයා නිබ්බින්දති පඨවිධාතුයා චිත්තං විරාජෙති' - පඨවි ධාතුව පිළිබඳව කලකිරෙයි. පඨවි ධාතුවෙන් සිත මැත් කරගනියි. විරාග වශයෙන් සිත මැත් කර ගනියි.

එතකොට මෙන්න මේ මූලධර්මයයි මෙතන ඉතාමත්ම වැදගත් වන්නේ මේ සූත්‍රයෙ. අර විධියෙ පරමාණුවාදයක් නොවෙයි. සංසාර වට්ටය කියල කියන, අපි කලින් සඳහන් කළ අර දිය සුළිය නතර කිරීමේ රහස තමයි මේ අජ්ඣත්තික බාහිර භේදය බිඳලීම. මේ අජ්ඣත්තික බාහිර භේදය උඩයි මේ සංසාර දියසුළිය ක්‍රියාකරන්නෙ. දැන් දියසුළියක ඇත්ත වශයෙන්ම ඇතුළතත් පිටතත් තියෙන්නෙ වතුරමයි. නමුත් මෙතන මහා ජවයක්, මහා ක්‍රියාකාරිත්වයක්, විපර්යාස ගොඩක්, තියෙනව. ඒ වගේම මේ පුද්ගලය පිළිබඳවත්. මේ අපේ ශරීරයෙ තියෙන්නෙත් පඨවිධාතුව. බාහිරව තිබෙන්නෙත් පඨවිධාතුව. නමුත් මේ දෙක අතර මහා පරතරයක් තියෙන බවක් සාමාන්‍ය පුද්ගලයට පෙනෙනව. මක්නිසාද මේ? මේක අර විඤ්ඤාණයෙ තිබෙන මායාත්මක ස්වරූපය නිසයි. අපි දේශනා කීපයක්ම කැපකළා මේ විඤ්ඤාණයත් නාමරූපයත් අතර සම්බන්ධය පෙන්නුම් කිරීමේදී. ඒ නාමරූප පිළිබිඹුව ගැන ප්‍රකාශ කළා. දැන් මේ අවස්ථාවෙ තවදුරටත් ඕන නම් හිතාගන්න පුළුවනි, හරියට කන්නාඩියක් ඉදිරිපිටට ආපු කෙනෙක් තමාගේ ඡායාව දැකල 'එතං මම' - මෙය මගෙයි, 'එසො අහං අස්මි' - මේ මමයි 'එසො මෙ අත්තා' - මේ මගේ ආත්මයයි. කියල කියන්න වගේ ලෝකයා අර තණ්හා මාන දිට්ඨි ඇතිකරගන්නව. ඇත්ත වශයෙන්ම තණ්හා මාන දිට්ඨි වලින් කෙරෙන්නෙ අර අජ්ඣත්තික බාහිර භේදය තහවුරු කිරීමයි. 'එතං මම' කියල කියනකොට 'මෙය මගෙයි'. මෙය වෙනමයි, මම වෙනමයි' 'එසො අහං අස්මි' මෙය මම වෙමි, 'එසො මෙ අත්තා' මෙය මගේ ආතමයයි. හරියට අර කණ්ණාඩියෙ තිබෙන ප්‍රතිබිම්බය, පිළිබිඹුව, දිහා බලල ඊට ඇලුම්කිරීම, එහෙම නැත්නම් ඒ සමග ගැටීම් ආදී වශයෙන් ඇතිකරගන්නා විපර්යාස රාශිය වගෙයි මෙතන හිතාගන්න තියෙන්නෙ. ඔන්න ඔය ඔක්කොම තියෙන්නෙ මේ අජ්ඣත්තික බාහිර භේදය බිඳලීමක් නැති නිසයි. මේ සාමාන්‍ය පුද්ගලයගෙ සන්තානයෙ, එතකොට, තණ්හා මාන දිට්ඨි වලින් ඒ අජ්ඣත්තික

බාහිර භේදය තවදුරටත් තහවුරු වෙනව. ඒක බිඳලීම සඳහා තමයි මේ ධාතුකම්ස්ථාන මූලධර්මය බුදුපියාණන්වහන්සේ මතුකරල දීල තියෙන්නෙ. මේ කාරණය, එනම් පඨවිධාතුව පිළිබඳව, ඒ වගේම අනෙකුත් ධාතූන් පිළිබඳව අර අජ්ඣත්තික බාහිර භේදය බිඳලූ හැටියෙ ඒ සිත විමුක්ත වන බව, තාලපුට ථෙරගාථාවෙ එන එක්තරා වටිනා ගාථාවකිනුත් අපට පැහැදිලි වෙනව. තාලපුට තෙරුන්වහන්සෙ අර්හත්වය පිළිබඳව තමාගේ ප්‍රාර්ථනා- 'මම කවදානම් රහත්වන්නෙමිද' කියන අදහස - කවියට නංවමින් මෙන්න මෙහෙම ප්‍රකාශ කරනව.

**'කදා නු කට්ඨෙ ච තිණෙ ලතා ච**
**ඛන්ධෙ ඉමෙහං අමිතෙ ච ධම්මෙ**
**අජ්ඣත්තිකානෙව ච බාහිරානිච**
**සමං තුලෙය්‍යං තදිදං කදා මේ'[8]**

'කදා නු කට්ඨෙ ච තිණෙ ලතාව' ලී කැබලිද තණකොළ ද වැල්ද, ඛන්ධෙ ඉමෙ ' මේ ස්කන්ධයන්ද ආධ්‍යාත්මික හා බාහිර වූ, ඇතුළත හා පිටත ඇති 'අමිතෙ ච ධම්මෙ' - හැම දෙයක්ම, අප්‍රමාණ ධර්මයන් ද, මේ හැම දෙයක්ම කවදා නම් 'සමං තුලෙය්‍ය තදිදං කදා මේ' - සමකොට තුලනය කරම්ද සමකොට කිරා බලම්ද 'එය මට කවද වන්නේද?' , මේ කියන්නේ මේව සම හැටියට - ඇතුළතත් පිටතත් සම හැටියට පෙනෙන්නෙ- අර රහත් අවස්ථාවේදී. ඒකම තමයි අපි අර අධිමුත්ත ථෙර ගාථාවේදී ප්‍රකාශ කළේ. 'තිණකට්ඨසමං ලොකං යදා පඤ්ඤාය පස්සති' ආදී වශයෙන්, ලෝකය තණකොළ හා ලී කැබලි වලට සමාන කළා. මේ පඤ්චස්කන්ධ ලෝකයත් - ශරීරයත්- බාහිරව තිබෙන දේවලුත් සම හැටියට සැළකීමේ අවස්ථාවයි. එතකොට පඨවි ආපො තෙජෝ වායො පිළිබඳව අර විදියේ ඉතාමත්ම සරල නිදසුන් ආශ්‍රයෙන් බුදුපියාණන්වහන්සේ ඒවායින් සිත මුදාගන්නා ආකාරය පෙන්නුව වගේම ආකාශ ධාතුව ගැනත් දැක්වීමේදි බුදුපියාණන්වහන්සේ නිදසුන් හැටියට ඉදිරිපත් කරන්නෙ කාටත් ප්‍රකට ශරීරයේ විවරස්ථාන කීපයක්. කන්සිදුරු, නාස්සිදුරු, මුවසිදුරු ආදිය ආධ්‍යාත්මික ආකාශධාතුව දැක්වීමට දෙන නිදසුන්. ඒ මිසක් භෞතික විද්‍යාඥයින් වගේ අණුදක්නවලට හසුවන යම්කිසි සියුම් ආකාශධාතුවක් නොවෙයි. එහෙම දැක්වුවෙ නැත්තෙ ඒව අනවශ්‍ය නිසා වෙන්ට ඕන. මේ සම්මර්ශණ විදිය සඳහා ඒව අනවශ්‍යයි. මෙතෙන්දි අපි මතක් කරගතයුතු කාරණයක් තමයි, මේ සංඥාව මිරිඟුවක්. කොයි තරම් ඈතට බෙදාගෙන ගියත් රූපයත් ආකාශයත් හරියට චිත්‍රයත් පසුබිමත් වගේ එකිනෙකට සාපේක්ෂකයි. චිත්‍රයයි පසුබිමයි වගේ එකිනෙකට සාපේක්ෂකයි, මේ රූපය සහ අවකාශය කියන ප්‍රඥප්ති දෙක. මේ චිත්‍රය තිබෙන්නෙ විඤ්ඤාණ රාමුව ඇතුළෙයි. අන්න ඒ කාරණය වඩාත් පැහැදිලි කිරීම් වශයෙන් අපට මතක්

කරන්න පුළුවනි. විදර්ශනා වශයෙන් මේ ප්‍රශ්නය විසඳන්න කලින්, මෙය විසඳීමට උත්සාහ කළ අතීත යෝගීන් එහෙම සමථමාර්ගයෙන්ම මේ ප්‍රශ්නය විසඳීමේදී ඉස්සෙල්ලම කළේ රූපය, රූපසංකල්පය, යටපත්කළා පළමුව එන රූප ධ්‍යාන වලින්. ඊළඟට අරූපයට යාමේදී, ඒ රූපය ඉවත්කළාට පස්සෙ ඊළඟට පළමුවෙන්ම එන්නෙ ආකාශය. දැන් මෙතනට ඉතාමත්ම පැහැදිලි නිදසුනක් තමයි කසිණ නිමිත්ත උගුලුවල එතන පෙනෙන ආකාශය අරමුණු කරගෙනයි 'ආකාසං අනන්තං' කියල ආකාසානඤ්චායතනය ඒ කාලෙ නිපදවා ගත්තෙ. එයින්ම අපට පෙනෙනවා. රූපය ඉවත් කළාට පස්සෙ එතන පෙනෙන අවකාශය ඒක අනන්ත හැටියට සිහිපත් කරනවා. මේ සිහිපත් කිරීම නිසාම අපට පෙනෙනවා ආකාසයත් සංඛතයක්. 'සංඛතං' කියල කියන්නෙ. 'අභිසංඛතං', 'අභිසංචෙතයිතං' - සිතින්ම මවාගත්තු දෙයක්. බුදුපියාණන් වහන්සේ නම් දැක්වූයේ එකම අසංඛතයක් - 'නිවන'. නමුත් පසුකාලීන දාර්ශනිකයින් කොයිතරම් ව්‍යාකූලත්වයට පැමිණියාද කියතොත් ආකාසයත් අසංඛතයක් හැටියට හඳුන්වන්න පටන්ගත්ත. මේවායේ මේ සිතට තිබෙන සම්බන්ධය ගැන තැකීමක් නැතිව හේතුප්‍රත්‍ය කියන ඒව නිකම් පිටත තිබෙන දේවල් හැටියට සැළකීමෙන් වෙන්න ඕන, ආකාශය අසංඛතයක් හැටියට දැක්වූවෙ. දැන් මෙතනින් පෙනෙනව ඒවායේ සාපේක්ෂකත්වය. චිත්‍රයත් පසුබිමත් වගේ රූපයත් ආකාශයත් සාපේක්ෂකයි. මේ හැම එකක්ම ඉදිරිපත් කෙරෙන්නෙ මනසිකාරයෙන්. 'මනසිකාර සම්භවා සබ්බෙ ධම්මා'. මනසිකාරයටයි මේ හැම දෙයක්ම 'හම්බ වෙන්නෙ'. අපි පොඩි නිදසුනක් හැටියට කල්පනා කළොත්, කොඩි වැලක ඉතාමත්ම කැපී පෙනෙන අංගදෙකක් තමයි ධජයයි පතාකයයි. ධජය කැපිල ඉවරවෙනකොට පතාකයත් කැපිල පේනව. පතාකය කපල ඉවර වෙනකොට ධජයත් කැපිල පේනව. නමුත් මේ දෙකම කැපිල පේන්නෙ මනසිකාරය නිසයි. 'මනසිකාර සම්භවා සබ්බෙ ධම්මා'. අර ධජයෙන් ඉවත්කරපු කෑල්ලයි පතාකය හැටියට සැළකෙන්නෙ. ඔය විධියටම තමයි රූපයයි, අවකාශයයි. මේව එකිනෙකට සාපේක්ෂක ධර්ම. එතකොට මෙන්න මේ අනුවත් අපට හිතාගන්න පුළුවනි ආකාශධාතුව. ආකාශධාතුව ගැන පසුකාලීන සංකල්ප බොහෝවිට ධර්මයේ දැක්වෙන මූලික සිද්ධාන්ත වලට විරුද්ධයි. අසංඛතය ගැන පැහැදිලි අවබෝධයක් නැතිවීම නිසාම වෙන්න ඕන මේ විදියට ව්‍යාකූලත්වයක් පැන නැඟුනේ.

ඊළඟට අපි මේ සූත්‍ර දේශනාව ගැන තවදුරටත් යමක් ප්‍රකාශ කරනව නම්, අර පඨවි, අපො, තෙජො, වායො ආකාශ කියන ඒ ධාතු පහෙන් සිත මෑත්කරගත්තට පස්සේ ඉතිරිවන විඤ්ඤාණය ඉතාමත්ම පිරිසිදු එකක්. විඤ්ඤාණයේ සාමාන්‍ය කෘත්‍යය තමයි යමක් වෙන්කර දැනගැනීම. මේක තිත්තයි මේක පැණිරසයි ආදී වශයෙන් වෙන්කර ගන්නව. එහෙම නැත්නම්

මේක සැපයි - මේක දුකයි, දුක්සහිත වේදනාවක් - මේක උපේක්ෂා වේදනාවක් ආදී වශයෙන් වෙන්කරගන්නව. දැන් එතකොට අර බාහිරව විඤ්ඤාණයේ කෘත්‍ය හැටියට පෙනෙන දේවල් දැක්වීමට උපකාරවන, නානත්ත සඤ්ඤාවට උපකාරවන, අර පඨවි ආපො තෙජො වායො යන සියල්ලම ඉවත්කළ නිසා දැන් විඤ්ඤාණයට ඉතිරිවෙලා තියෙන කෘත්‍යය කුමක්ද? සුඛ දුක්ඛ අදුක්ඛමසුඛ කියල කියන අර වේදනාවේ තුන් ආකාරය පිළිබඳව වෙන්කර දැනගැනීම පමණයි. එතකොට එතනට පැමිණි මුනිවරයා, නිර්වාණගාමී ප්‍රතිපදාවේ මෙතාක් දුරට පැමිණි මුනිවරයා, ඊළඟට කරන්නෙ මොකක්ද? අර සැප, දුක් අදුක්ඛමසුඛ කියන ඒ ත්‍රිවිධ වේදනාවල් ඒ ඒ ප්‍රත්‍යයන්ගෙන් ඒ ඒ ස්පර්ශයන්ගෙන් ඇතිවන හැටිත් නැතිවන හැටිත් බලමින් ඊළඟට ක්‍රමක්‍රමයෙන් සිත උපේක්ෂාවට ගේනව. ඉතාමත්ම ප්‍රභාස්වර උපේක්ෂාවකට ගේනව. ඊළඟට ඒ උපේක්ෂාව පවා මඤ්ඤනා වශයෙන් අල්ලා නොගැනීම නිසා ඒ වේදනාවන් පිළිබඳව ඇති ඇල්ම පවා දුරලීමයි. ඒකට කියන්නේ 'විසංයුත්තො තං න වෙදෙති'. සුඛදුඃඛ ආදි ඒ වේදනා විඳීමේදී ඒවා පිළිබඳ එක්තරා විසංයෝගයක්, වෙන්වීමක්, ඇතිකරගන්නවා. එතන වඩාත් පැහැදිලිව සඳහන් වෙනව. සුඛ වේදනාවක් නම් එතකොට ඒ ගැන හිතනව 'අනිච්චාති පජානාති. අනජ්ඣෝසිතාති පජානාති, අනභිනන්දිතාති පජානාති' 'මේ සැප වේදනාව අනිත්‍යයි. එයින් මානය දුරුවීම හැඟෙනව. 'අනජ්ඣෝසිතයි' - අනජ්ඣෝසිත කියල කියන්නෙ 'මෙහි මා බැඳී නැහැ.' කියන අදහසයි. එයින් දෘෂ්ටිය දුරුවීම හැඟෙනව. අනභිනන්දිතාති' කියල කියන්නෙ මේ පිළිබඳව මා තුළ සතුටක් නැහැ. එයින් තෘෂ්ණාව දුරුවීම හැඟෙනව. ඔන්න ඔය විදියට රහත් තත්ත්වයට පත්වීමේදී වෙන්නෙ අර විඤ්ඤාණයත් නිරුද්ධවීමයි. අර සැප දුක් අදුක්ඛමසුඛ කියන වේදනා තුන වෙන්කර දැනගැනීම සඳහා උපයෝගීවන විඤ්ඤාණයේ පවා කෘත්‍යය නැතිකරනව. විසංයුත්තො කියල කියන්නෙ ඒ පිළිබඳව විරාගය ඇතිකරගැනීම. එතකොට මේ ධාතුවිභංග සූත්‍රයෙන් අපට ඉතාමත්ම හොඳින් පැහැදිලි වෙනව මේ මඤ්ඤනා පිළිබඳ ප්‍රශ්නය, නිවන පිළිබඳ ප්‍රතිපදාවට කොයිතරම් බලපානවද කියන එක.

ඒ වගේම සමහර තැනක මේ මඤ්ඤනා නොකිරීමේ පිළිවෙත හඳුන්වල තියෙන්නෙ 'අතම්මයතා' නමින්. මැදුම් සඟියෙ සප්පුරිස සූත්‍රයේදී බුදුපියාණන් වහන්සේ මේ මඤ්ඤනා නොකිරීමේ පිළිවෙත හැඳින්වීමට යොදල තියෙන්නෙ 'අතම්මයතා' කියන වචනයයි. බුදුපියාණන්වහන්සේ ප්‍රකාශකරනව, නියම සත්පුරුෂපුද්ගලයා - ඒ කියන්නෙ සාමාන්‍ය ලෝකයේ සත්පුරුෂ කියන අර්ථයෙන් නොවෙයි, ආර්‍ය පුද්ගලයා කියන ඒ අදහසින් - 'සප්පුරිසො ච ඛො භික්ඛවෙ ඉති පටිසංචික්ඛති නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තියාපි ඛො අතම්මයතා වුත්තා භගවතා යෙන යෙන හි මඤ්ඤන්ති තතො තං හොති

අකදකදථාති'[9] ඒ කියන්නෙ, සත්පුරුෂය කල්පනාකරන්නෙ නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තිය ලබාගත්තත්, මෙන්න මේ විදියටයි. භාග්‍යවතුන්වහන්සේ විසින් නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තිය වැනි ඒ තරම් දියුණු සමාපත්තියක් පිළිබඳව පවා 'අතම්මයතාව' ප්‍රකාශකොට තිබේ. යෙන යෙන හි මඤ්ඤන්ති' ආදී පාඨයෙන්. 'යමක් උපකාර කරගෙන මඤ්ඤනාකරත්ද ඒ නිසාම එය අඤ්ඤථාභාවයකට - වෙනස් බවකට පැමිණෙයි කියල මෙන්න මේ අවවාදය ඇතිව.

මේ 'අතම්මය' කියන වචනය අපි විග්‍රහකරනතාක් මේක සමහරවිට පැහැදිලි වෙන්නෙ නැහැ. 'තම්මය කියල කියන්නෙ 'තද්+මය', අපට ඉතාමත්ම පැහැදිලි වචන තමයි 'රන්මය, රිදීමය' ආදී වචන. පාළියෙන් කියනවනම් 'සොවණ්ණමය රජතමය.' අන්න ඒ වගේ වචනයක් තමයි මෙතන 'තම්මය කියල කියන්නෙ. 'තම්මය' කියල කියන්නෙ එතකොට 'තද්+මය. යම්කිසි දෙයක් පිළිබඳ තණ්හා මාන දිට්ඨි වශයෙන් ඇල්මක් ඇතිකරගත්ත නම්, ඒ දේ හා ඒ ඇල්ම ඇතිකරගත් පුද්ගලය එකක් බවට පත්වෙනව, අල්ල ගැනීම නිසාම. අන්න ඒක නිසා තමයි නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තිය පිළිබඳව මඤ්ඤනාව ඇතිකරගත්තු කෙනෙක් ඒ පිළිබඳව හිතන්නෙ මම නෙවසඤ්ඤානාසඤ්ඤායතන ලාභියෙක් කියල. ඒ පිළිබඳව මානය ආදී ක්ලෙශධර්ම ඇතිකරගන්නව. එතකොට නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තියෙන් පිරිහුන හැටියෙ ඒ තැනැත්තාට විපර්යාස රාශියකට මුහුණපාන්න සිද්‍ධවෙනව. ඒක නිසා තමයි බුදුපියාණන්වහන්සේ ප්‍රකාශකරල තියෙන්නෙ නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තිය පිළිබඳව පවා 'අතම්මයතාව' පුරුදුකළ යුතු බව. එතකොට, 'අතම්මයො' කියන පදය යෙදෙනව රහතන් වහන්සේ පිළිබඳව. ඒත් අර අර්ථයෙන් .කිසිවක් පිළිබඳ 'තම්මයතාවක්' නැහැ. කිසිම දෙයක් පිළිබඳව අල්ලාගැනීමක් නැති නිසාම ඒ අල්ලාගන්න දෙයට සම්බන්ධයක් නැහැ. අල්ලාගන්න දෙය ඔස්සේ රහතන් වහන්සේ හඳුනාගන්ට බැහැ. මේ බව ප්‍රකාශකරන එක්තරා ගාථාධර්මයක් සඳහන් වෙනව අඞ්ගුත්තර නිකායෙ තික නිපාතයෙ දෙවදූත වග්ගයෙ.

**'පසය්හ මාරං අභිභුය්‍ය අන්තකං - යො ච ඵුසී ජාතික්ඛයං පධානවා**
**සො තාදිසො ලොකවිදූ සුමෙධො - සබ්බෙසු ධම්මෙසු අතම්මයො මුනි'**[10]

'යම් වීර්යවන්ත මුනිවරයෙක්, ජීවිතය කෙළවර කරන අර්ථයෙන්, අන්තක නම් වූ මාරයා මැඩගෙන, ජයගෙන, අභිභවා, ජාතික්ෂය නම් වූ උපත ක්ෂය කිරීමේ තත්ත්වය මෙලොව දීම සපර්ශ කළේද - 'ඵුසී' වැදගත් වචනයක් එතනත් - 'යොච ඵුසී ජාතික්ඛයං පධානවා' 'ජාතික්ෂය තත්ත්වය සපර්ශකළා. ඒ තාදි ගුණ ඇති, ලෝකය අවබෝධකරගත් ප්‍රඥාවන්ත මුනිවරයා 'සබ්බෙසු ධම්මෙසු අතම්මයො'. හැම දෙයක් පිළිබඳවම අතම්මයයි.

මෙන්න මේ අතම්මයතා කියන අදහසම තවත් ආකාරයකින් අපට ඉදිරිපත් කරන්න පුළුවනි. අර දිට්ඨ සුත මුත විඤ්ඤාත පිළිබඳව නොඇල්ම. මෙහිදී මතුකරගන්න පුළුවන් වටිනා සූත්‍රයක් තියෙනව. ඉතාමත්ම ගැඹුරු සූත්‍රයක් හැටියට සැළකෙනව උදාන පාළියෙ බොධිවග්ගයෙ එන බාහියසූත්‍රය. බාහියදාරුචීරිය තාපසතුමා සුප්පාරක පටුනෙ ඉඳල, බොහොම් ඈත ඉඳල, බුදුපියාණන්වහන්සේ සොයාගෙන ජේතවනාරාමයට පැමිණියා. එනකොට බුදුපියාණන්වහන්සේ පිණ්ඩපාතෙ වැඩල. ඒ තමන්ගේ නොඉවසිලිමත්කම නිසා දුවගෙන ගිහිල්ල බුදුපියාණන්වහන්සේ හමුවුන හැටියෙ වැඳවැටිල ඉල්ලා සිටිය "අනේ මට ධර්මය දේශනාකරන්න" කියල. ඒ අවස්ථාවෙ බුදුපියාණන් වහන්සේ පළමුවෙන්ම 'මේක අවස්ථාව නොවෙයි. අපි මේ පිණ්ඩපාතෙ වඩිනව' කියල ඒ විදියේ වාක්‍යයක් ප්‍රකාශකළා. මේක සමහර විට කෙනෙකුට හිතාගන්න බැරිවෙන්න පුළුවන්. මේක බුද්ධඥානය. මහාකරුණාවත් ප්‍රඥාවත් අනුව කරපු එක්තරා විශේෂ උපක්‍රමයක් වෙන්න ඕන. ඒ කියන්නේ අර බාහිය දාරුචීරිය තාපසයාගේ ඒ ඉක්මන්කම වැළැක්වීමට හෝ එහෙමත් නැත්නම් ධර්ම ගෞරවය ඇති කිරීමට. ධර්ම ගෞරවය ඇතිකරල සංවේගය ඇතිකිරීමටයි බුදුපියාණන්වහන්සේ අර ප්‍රතික්ෂේප කළේ පළමුවෙනි වරට. ඊළඟට දෙවෙනි වරටත් ඔහු ඉල්ලා සිටිය, - බාහියදාරුචීරිය තාපසයා - මට ධර්මය දේශනා කරන්නය කියල. ඒ අවස්ථාවෙ ඉල්ලා සිටියෙ 'මම දන්නේ නැහැ මගේ ජීවිතය කොයි වෙලාවෙ නැතිවෙයිද කියල. මම දන්නෙ නැහැ භාග්‍යවතුන් වහන්සේගේ ජීවිතය කොයිවෙලාවෙ නැතිවෙයිද කියල. ඒක නිසා මට කොහොමහරි ධර්මය ටිකක් කියන්න' කියල ඇවිටිලිකළා. ඒ අවස්ථාවෙත් බුදුපියාණන්වහන්සේ ප්‍රතික්ෂේප කළා. තුන්වෙනි වරට කළ ඉල්ලීම අනුවයි බුදුපියාණන්වහන්සේ මේ කෙටි දේශනාව කළේ. පුදුම අන්දමේ ධර්ම උපදේශයක් ඒක. 'සංඛිත්ත ධම්ම දෙසනා' කියල එතන සඳහන් වෙනව. මේ බාහියදාරුචීරිය ඛිප්පාභිඤ්ඤා ගණයට ගැනෙන ඉතාමත්ම ඉක්මනින් යමක් වටහාගැනීමේ ශක්තිය ඇති කෙනෙක් නිසා බුදුපියාණන් වහන්සේ කෙටි දේශනාවක් ප්‍රකාශ කළා.

**'තස්මාතිහ තෙ බාහිය එවං සික්ඛිතබ්බං දිට්ඨෙ දිට්ඨමත්තං භවිස්සති සුතෙ සුතමත්තං භවිස්සති, මුතෙ මුතමත්තං භවිස්සති, විඤ්ඤාතෙ විඤ්ඤාතමත්තං භවිස්සති, එවං හි තෙ බාහිය සික්ඛිතබ්බං යතො ඛො තෙ බාහිය දිට්ඨෙ දිට්ඨමත්තං භවිස්සති, සුතෙ සුතමත්තං භවිස්සති මුතෙ මුතමත්තං භවිස්සති විඤ්ඤාතෙ විඤ්ඤාතමත්තං භවිස්සති තතො ත්වං බාහිය න තෙන, යතො ත්වං බාහිය න තෙන තතො ත්වං බාහිය න තත්ථ යතො ත්වං බාහිය න තත්ථ තතො ත්වං බාහිය නෙවිධ න හුරං න උභයමන්තරෙ එසෙවන්තො දුක්ඛස්ස'.** [11]

ඔච්චරයි දේශනාව. මේ දේශනාව අහල ඉවර වෙනවත් එකක්ම බාහියදාරුචීරිය තාපසතුමා එහෙමම රහත්වුනා. එතකොට මේ දේශනාවෙ ගැඹුර අපිට යන්තම් හිතාගන්න පුළුවන් කොයි තරම්ද කියල. ඉස්සෙල්ලම අපි මේක සිංහලෙන් තේරුම් ගන්න උත්සාහ කරමු. අර විදියට ඇව්ටිලි කරල බේරෙන්න බැරි උනාම බුදුපියාණන්වහන්සේ ප්‍රකාශ කරනව හරියට අර 'ඔන්න එහෙනම් අහගන්න' කියන්න වගේ 'තස්මාතිහ තෙ බාහිය එවං සික්ඛිතබ්බං' - එහෙනම් බාහිය ඔබ මෙහෙම හික්මෙන්න. 'දිට්ඨෙ දිට්ඨමත්තං භවිස්සති' - දුටුයෙහි, ඇත්ත වශයෙන්ම, මෙතන 'දුටුදෙයෙහි' කියනවට වඩා මෙතන 'දුටුයෙහි' කියලයි කියන්න වෙන්නෙ. 'දුටුයෙහි' - දුටුබව පමණක්ම වන්නේය. ඒ කියන්නෙ දක්නා ලද්දෙහි දක්නා ලද බවම වන්නේය කියන එකයි. අසන ලද්දෙහි අසන ලද බව පමණක්ම වන්නේය. 'මුතෙ මුතමත්තං' - 'මුත' කියල කියන්නෙ දිවෙන් නැහැයෙන් කයින් ලබන ස්පර්ශය පිළිබඳව, ඒ තුනටම අල්ලල තමයි 'මුත' කියල කියන්නෙ. දැනුන බව. එතකොට දැනුන දෙයෙහි දැනුන බව පමණක්ම වන්නේය. එහෙම නැත්නම් 'දැනුනෙහි' දැනුනු බව පමණක්ම වන්නේය.

'විඤ්ඤාතෙ' - දැනගත් දෙයෙහි, 'දතුයෙහි කියල කියමු අපි ඒකට. දතුයෙහි දත්බව පමණක්ම වන්නේයි. 'එවං හි තෙ බාහිය සික්ඛිතබ්බං' - මෙන්න මේ අන්දමටයි බාහිය ඔබ හික්මිය යුත්තෙ. ඔය විදියට එතකොට ආර්ය ව්‍යවහාර වශයෙන්ම - ආර්ය ව්‍යවහාරයෙන්ම - බුදුපියාණන්වහන්සේ මේ බාහිය තාපසතුමාට ආමන්ත්‍රණය කරල නිර්වාණ ප්‍රතිපදාවෙ තැබුව, මේ පාඨයෙන්. ඊළඟට ප්‍රකාශ කරනව ඒ ශික්ෂා මාර්ගය. ඇත්ත වශයෙන්ම මෙතන තියෙනව ත්‍රිවිධ ශික්ෂාවම. ත්‍රිවිධ ශික්ෂාවෙම ආශචර්යවත් සම්පිණ්ඩනයක් මේ සූත්‍රය. ඊළඟට බුදුපියාණන්වහන්සේ ප්‍රකාශ කරනව අර ප්‍රතිපදාව කරගෙන ගියොත් ඔබට මෙහෙමයි වෙන්නෙ කියන එක.

> **'යතො ඛො තෙ බාහිය දිට්ඨෙ දිට්ඨමත්තං භවිස්සති, සුතෙ සුතමත්තං භවිස්සති, මුතෙ මුතමත්තං භවිස්සති විඤ්ඤාතෙ විඤ්ඤාතමත්තං භවිස්සති තතො ත්වං බාහිය න තෙන යතො ත්වං බාහිය න තෙන තතො ත්වං බාහිය න තත්ථ.' යතො ත්වං බාහිය නතත්ථ, තතො ත්වං බාහිය නෙවිධ න හුරං න 'උභයමන්තරෙ එසෙවන්තො දුක්ඛස්ස.**

'යම් විටෙක බාහිය ඔබට දුටුයෙහි දුටුබව පමණක්ම වන්නේද ඇසුණෙහි ඇසුනබව පමණක්ම වන්නේද, දැනුනෙහි දැනුන බව පමණක්ම වන්නේද, දතුයෙහි දත්බව පමණක්ම වන්නේද, එවිට බාහිය ඔබ 'එයින්' නොවේ. මෙතන අපට කියන්න වෙන්නෙ අමුතු ප්‍රහේලිකා වචනවලින්. ඒ විදියටමයි පරිවර්තනය කරන්න වෙන්නෙ.'

'තතො ත්වං බාහිය න තෙන' ඒ කියන්නෙ 'එවිට ඔබ එයින් නොවන්නේය.' ඊළඟට 'යතො ත්වං බාහිය න තෙන' - 'යම් විටෙක ඔබ එයින් නොවන්නේද, 'තතො ත්වං බාහිය න තත්ථ' - එවිට ඔබ එහි නොවන්නේය'. 'යතො ත්වං බාහිය න තත්ථ, තතො ත්වං බාහිය නෙවිධ න හුරං න උභයමන්තරෙ' - යම් විටෙක බාහිය ඔබ එහි නොවන්නේද, එවිට බාහිය ඔබ මෙතනත් නොවෙයි, එතනත් නොවෙයි. දෙතැන අතරත් නොවෙයි. 'එසෙවන්තො දුක්ඛස්ස' - 'මෙයම දුකෙහි කෙළවරයි'. මෙතන ටිකක් ඉඟියක් වගේ අපට දෙන්න සිද්ධවෙනව මේ 'තෙන', 'තත්ථ' කියන වචන පිළිබඳව. මෙතන මේ 'තෙන' කියල කිව්වෙ, ඒ අදහස පැහැදිලි වෙන කාරණයක් තමයි දැන් අපි 'තමමයො ආදී වචනවලින් ප්‍රකාශ කළේ. යම්කිසි දෙයක් තණ්හා - මාන - දිට්ඨිවලින් අල්ලාගත්තානම්, ඒ දෙය හෙල්ලෙනකොට මේ පුද්ගලයත් හෙල්ලෙනව. ඒ දේ අනුවමයි මඤ්ඤනා කෙරෙන්නෙ. අන්න ඒ අදහස සඳහා තමයි 'තෙන මඤ්ඤති' කියල තියෙන්නෙ. සුත්ත නිපාතයෙ අට්ඨක වග්ගයෙ ජරාසූත්‍රයෙ සඳහන් වෙනව - 'ධොනො න හි තෙන මඤ්ඤති' - යදිදං දිට්ඨසුතමුතෙසු වා'[12] ඔන්න හොඳ නිදර්ශනයක්. 'ධොනො' කියල කියන්නෙ රහතන්වහන්සේට නමක්.

## අධෝලිපි

1. ම.නි. III 508 පිටුව (බු.ජ. 12)
2. ථෙර. 186 පිට (බු.ජ. 28)
3. ම.නි. III 508 පිටුව ( බු.ජ. 12)
4. සු.නි. 322 පිට. (බු.ජ. 25)
5. සං.නි. III 16 පිට (බු.ජ. 15)
6. සු.නි 336 පිට (බු.ජ. 25)
7. උදා. ඛුනි. I 292 පිට (බු.ජ. 24)
8. ථෙර. 252 පිට (බු.ජ. 28)
9. ම.නි. III 164 පිට (බු.ජ. 12)
10. අං.නි. I 270 පිට (බු.ජ. 18)
11. උදා. ඛු.නි. I 144 පිට (බු.ජ.24)
12. සු. නි. 258 පිට (බු. ජ. 25)

# 15 වන

# දේශනය

# 15 වන දේශනය

**"නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස"**

"එතං සන්තං එතං පණීතං යදිදං සබ්බසංඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං".

"මෙය ශාන්තය මෙය ප්‍රණීතය එනම් සියලු සංස්කාරයන්ගේ සංසිඳීම සියලු උපධීන් අතහැරදැමීම, තණ්හාව ක්‍ෂය කිරීම, නොඇල්ම නම් වූ විරාගය, නැවැත්ම නම් වූ නිරෝධය, නිවීම නම් වූ නිබ්බානය".

**අතිපූජනීය මහෝපාධ්‍යාය මාහිමිපාණන් වහන්සේ ප්‍රධාන ගරුතර යෝගාවචර මහා සංඝරත්නයෙන් අවසරයි. නිබ්බාන යන මාතෘකාව යටතේ පවත්වනු ලබන දේශනා මාලාවේ පසළොස්වන දේශනයයි මේ.**

බාහිය දරුචීරිය තවුසාණන් මසුන්දනාවලින් මිදුනු අතම්මය තත්ත්වයට - රහත්බවට - පත්කිරීමට සමත්වූ කෙටි ධර්මෝපදේශයක් අප ගියවර දේශනය අගභරියේදී උදාන පාළියෙන් දැක්වූව. ඇසූකෙණෙහිම - 'තාවදෙව' - රහත් බව ලබාදීමට, නිවන ලබාදීමට, තරම් සාරවත්වූ ඒ බුද්ධ දේශනාව ගැන සැහෙන විවරණයක් කිරීමට අද අපි නැවතත් ඒ බාහිය සූත්‍රදේශනාව මතක්කර ගනිමු.

**'තස්මාතිහ තෙ බාහිය එවං සික්ඛිතබ්බං. දිට්ඨෙ දිට්ඨමත්තං භවිස්සති සුතෙ සුතමත්තං භවිස්සති. මුතෙ මුතමත්තං භවිස්සති. විඤ්ඤාතෙ විඤ්ඤාතමත්තං භවිස්සති. එවං හි තෙ බාහිය සික්ඛිතබ්බං. යතො ඛො තෙ බාහිය දිට්ඨෙ දිට්ඨමත්තං භවිස්සති. සුතෙ සුතමත්තං භවිස්සති. මුතෙ මුතමත්තං භවිස්සති. විඤ්ඤාතෙ විඤ්ඤාතමත්තං භවිස්සති තතො ත්වං බාහිය න තෙන. යතො ත්වං බාහිය න තෙන. තතො ත්වං බාහිය න තත්ථ. යතො ත්වං බාහිය න තත්ථ. තතො ත්වං බාහිය නෙවිධ න හුරං න උභයමන්තරෙ එසෙවන්තො දුක්ඛස්ස'**

තස්මාතිහ තෙ බාහිය එවං සික්ඛිතබ්බං' - 'එහෙනම් බාහිය ඔබ මෙසේ හික්මිය යුතුය. දිට්ඨෙ දිට්ඨමත්තං භවිස්සති' - දුටුයෙහි, දුටුබව පමණක්ම, දුටුමාත්‍රයම වන්නේය. 'සුතෙ සුතමත්තං භවිස්සති' - ඇසුණෙහි, ඇසුණු දෙයෙහි, ඇසුණු බව පමණක්ම, එහෙම නැත්නම් ඇසුණුමාත්‍රයම වන්නේය. 'මුතෙ මුතමත්තං භවිස්සති' - 'මුත' කියල කිව්වෙ අර දිවෙන් ශරීරයෙන්, නැහැයෙන් දැනෙන ස්පර්ශයටයි. ඒ මුතයෙහි, එහෙම නැත්නම් දැනුනෙහි,

දැනුන දෙයෙහි, දැනුන බව පමණක්ම වන්නේය. 'විඤ්ඤාත' කියල කියන්නෙ හිතින් හිතු විඤ්ඤාණයෙන් දැනගත්, කියන එකයි. 'විඤ්ඤාතෙ විඤ්ඤාතමත්තං භවිස්සති' -අපි එකට ලේසියට පාවිච්චි කළොත්- 'දැනගතුයෙහි', එහෙම නැත්නම් 'දතුයෙහි', දත්බව පමණක්ම වන්නේය. මෙසේය බාහිය ඔබ විසින් හික්මිය යුත්තේ. ඊළඟ කොටස -

'යතො ඛො තෙ බාහිය දිට්ඨෙ දිට්ඨමත්තං භවිස්සති, සුතෙ සුතමත්තං භවිස්සති මුතෙ මුතමත්තං භවිස්සති, විඤ්ඤාතෙ විඤ්ඤාතමත්තං භවිස්සති' බාහිය යම්විටෙක ඔබට දිට්ඨයෙහි දිට්ඨමාත්‍රයම වන්නේද, සුතයෙහි සුතමාත්‍රයම වන්නේද, මුතයෙහි මුත මාත්‍රයම වන්නේද, විඤ්ඤාතයෙහි විඤ්ඤාතමාත්‍රයම වන්නේද, 'තතො ත්වං බාහිය න තෙන' - එවිට බාහිය ඔබ 'එයින්' නොවේ. අපි හිතාගන්න ඕන මෙතන ක්‍රියා පදේ. 'එයින් නොවන්නේය' කියන එක වෙන්න ඕන අදහස. ඊළඟට 'යතො ත්වං බාහිය න තෙන' - 'යම් විටක බාහිය ඔබ එයින් නොවෙයි නම්' 'තතො ත්වං බාහිය න තත්ථ' - 'එවිට බාහිය ඔබ 'එහි' නොවේ. ඊළඟට 'යතො ත්වං බාහිය න තත්ථ' - යම් විටක බාහිය ඔබ 'එහි' නොවේ නම්' 'තතො ත්වං බාහිය නෙවිධ න හුරං න උභයමන්තරෙ' - 'එවිට ඔබ' මෙතනත් නැත එතනත් නැත. දෙතැන අතරත් නැත' 'එසෙවන්තො දුක්ඛස්ස' - 'මෙයම දුකෙහි කෙළවරයි.

මේ සූත්‍රදේශනාවට සැහෙන අර්ථවිවරණයක් කිරීමට යතුරක් හැටියට අපි පළමුවෙන්ම මේකෙ තිබෙන ප්‍රහේලිකා පද දෙක තෝරාගන්න එද තරමක් දුරට උත්සාහ කළා. මේ ප්‍රහේලිකා විදියේ පද දෙක තමයි 'න තෙන' 'න තත්ථ' කියන පද දෙක. 'ඔබ එයින් නොවේ', 'ඔබ එහි නොවේ' කිසි සම්බන්ධයක් නැති වචන දෙකක් වගේ. මේකට සාධකවශයෙන් ගැනීමට අපි සුත්ත නිපාතයේ අට්ඨකවග්ගයෙ ජරා සූත්‍රයෙන් ගාථා දෙපදයක් උපුටා දැක්වුව.

**'ධොනො න හි තෙන මඤ්ඤති - යයිදං දිට්ඨසුතම්මුතෙසු වා'** -

'ධොන' කියන්නෙ රහතන්වහන්සේටම යොදන පදයක්. කෙලෙස් දූලි පිසහැරිය, පිඹහැරිය කෙනා කියන අදහසයි. එතකොට ධොන කියන රහත්තෙම 'න තෙන මඤ්ඤති' එයින් මඤ්ඤනා නොකරයි. 'යයිදං' - එනම්, 'දිට්ඨ සුතම්මුතෙසු වා' - 'දිට්ඨය හෝ සුතය හෝ මුතය හෝ පිළිබඳව'. මේ ගාථා දෙපදය හරියට අපට ඉබේම ලැබුනු, අහම්බෙන් ලැබුනු, අටුවාවක් වගෙයි, මේ බාහිය සූත්‍රයෙ ප්‍රහේලිකා පදයට. මක්නිසාද, 'න තෙන' කියන වචනයේ එතනින් හැඟෙන අදහස අර, ක්‍රියාපදයකුත් නැති ඒ පද කීපයෙ අදහස, මොකක්ද කියල හිතාගන්න පුළුවනි, මේ මුල් පදයෙන්ම. 'ධොනො න හි තෙන මඤ්ඤති' 'ධොන' තෙම එයින් මඤ්ඤනා

නොකරයි. එතකොට බාහිය සූත්‍රයේ මඤ්ඤනා කියන වචනය කොතැනකවත් සඳහන් නැතත්, මෙතන මේ කියන්නෙ මඤ්ඤනා කිරීමක් බව අපට හිතාගන්න පුළුවන්. 'තෙන මඤ්ඤති' - මේ 'තෙන මඤ්ඤති' කියන එකට අපට තවදුරටත් සාධක හැටියට දක්වන්න පුළුවන් අපි කීපවරක්ම උපුටා දැක්වූ 'යෙන යෙන හි මඤ්ඤන්ති තතො තං හොති අඤ්ඤථා'- යම් යම් දෙයකින් මඤ්ඤනා කරත්ද, ඒ නිසාම, එය නිසාම එය අනිකක් බවට පත්වෙයි. මේක කීපවරක්ම ප්‍රකාශ කළා. ඒ වගේම තවත් පදයක් අපට කලින් හමුවුනා 'තෙන ච මා මඤ්ඤි' . එයින් මඤ්ඤනා නොකරව. එතකොට මෙතන බාහිය සූත්‍රයෙත් 'න තෙන' කියන එකේ අදහස අර මඤ්ඤනාව පිළිබඳව 'න තෙන මඤ්ඤති' කියන එක බව, ඒ පළමුවන කරුණයි මේ සාධක දෙපදයෙන් ලබාගන්න පුළුවන් පිහිට. ඊළඟට දෙවෙනි කාරණය හැටියට අපට ගන්න පුළුවනි, මේ 'න තෙන මඤ්ඤති' කියන එකෙන් 'න තෙන' - 'එයින් නොවේ' - මෙතන 'එයින්' කියල කියන්නෙ කුමක් සඳහාද, 'එයින්' කියල කීමෙන් හැඟෙන්නෙ මොකක්ද කියන එක. ඒකත් පැහැදිලි වෙනව අර ගාථාවෙ දෙවන පදයෙන්. '**යදිදං**' කියන එක අටුවා ස්වරූපය හැටියටත් හිතාගන්න පුළුවනි. '**එතං**' - ධොන තෙම එයින් මඤ්ඤනා නොකරයි. **එතං** දිට්ඨ සුත මුත පිළිබඳව. මේ පදයෙ යෙදිල තියෙන්නෙ දිට්ඨ සුත මුත කියන වචන තුන පමණයි. අපේ මේ බාහිය සූත්‍රයෙ මූලික සැකිල්ල දිට්ඨ සුතමුත විඤ්ඤාත කියන පද හතරයි. එතකොට 'න තෙන' කියන එකට කලින් තියෙන්නෙ අර 'දිට්ඨෙ දිට්ඨමත්තං භවිස්සති' ආදී පද හතර නිසා හිතාගන්න පුළුවනි අපට 'න තෙන' කියල බුදුරජාණන්වහන්සේ ප්‍රකාශ කළේ අර දිට්ඨය හේ සුතය හෝ මුතය හෝ විඤ්ඤාතය හෝ පිළිබඳව 'එයින්' නොවන්නේය කියන එකයි. ඊ ළඟට මේ '**එයින් නොවන**' මේ අදහසම, මේ මඤ්ඤනාව පිළිබඳ අදහසම, තවදුරටත් අපට මතුකරගන්න පුළුවනි. කලින් අවසථාවක දීඝ විස්තරයක් කළ ඒ මූලපරියාය සූත්‍රයෙ 'පඨවි' කියන මුල්පදය මුල්කරගෙනයි අපි මඤ්ඤනා කියන වචනය තේරුවෙ. ඇත්ත වශයෙන්ම මූලපරියාය සූත්‍රයේ පද විසි හතරක්ම තිබෙනව. ඒ විසිහතරෙන්, හතරක් තමයි දිට්ඨ සුත මුත විඤ්ඤාත කියන පද. එතකොට මූල පරියාය සූත්‍රයෙ ඒ රටාව දැන් අපට පුරුදුයි. එතන කියපු පුද්ගලයන් තුන්දෙනා පිළිබඳව. එතනින් සෙඛ පුද්ගලය පිළිබඳව අපි ගනිමු. - 'පඨවිං පඨවිතො අභිඤ්ඤාය පඨවිං මා මඤ්ඤි පඨවියා මා මඤ්ඤි පඨවිතො මා මඤ්ඤී පඨවිං මෙ ති මා මඤ්ඤී පඨවිං මා අභිනන්දි' - සෙඛ පුද්ගලයා පිළිබඳව පඨවිය ගැන කියනකොට ප්‍රකාශවෙන්නෙ, කියන්නෙ, ඔහොමයි. ඒ වෙනුවට අපි යෙදුවොත් 'දිට්ඨ' කියන එක -දිට්ඨං දිට්ඨතො අභිඤ්ඤාය දිට්ඨං මා මඤ්ඤි දිට්ඨස්මිං මා මඤ්ඤි දිට්ඨතො මා මඤ්ඤි දිට්ඨං මෙති මා මඤ්ඤි දිට්ඨං මා අභිනන්දි' - එතකොට සෙඛ

පුද්ගලයට තියෙන්නෙ ශික්ෂණයක්. සෙඛ පුද්ගලයට මේ කියාපු දිට්ඨ සුත මුත විඤ්ඤාත කියන හතර පිළිබඳව මඤ්ඤනා නොකරව කියල කියන්නෙ අන්න අර කියාපු විදියට නොහිතව. දිට්ඨය, දිට්ඨවශයෙන්, අභිඤ්ඤාය. සඤ්ජානිත්වා නොවෙයි, අභිඤ්ඤාය. සාමාන්‍ය පුහුදුන් සඤ්ඤාවෙන් නොවෙයි. අභිඤ්ඤාවශයෙන් ගැඹුරු වැටහීමක් ලබාගන්නව දිට්ඨය පිළිබඳව. එහෙම ලබාගෙන 'දිට්ඨං මා මඤ්ඤි', දිට්ඨය වස්තුත්වයෙන් , වස්තුවක් හැටියට, දෙයක් හැටියට නොහඟුව. 'දිට්ඨං මා මඤ්ඤි කියල කියන්නේ ඒකයි. දිට්ඨය පිළිබඳව ඒ විදියට මඤ්ඤනා නොකරව. ඊළඟට 'දිට්ඨස්මිං මා මඤ්ඤි' - 'දිට්ඨයෙහි' යයි නොහඟුව. 'දිට්ඨයෙන්' යයි නොහඟුව. මේවායේ ව්‍යාකරණ රටාවට තියෙන සම්බන්ධය අපි කලින් අවස්ථාවක පෙන්නුම් කරල තියෙනව. 'දිට්ඨං මෙති මා මඤ්ඤි - ඒ විදියට කළාට පස්සේ. ඊළඟට 'දිට්ඨං මෙති' - 'දිට්ඨය මගේ යයි නොහඟුව'. ඊළඟට 'දිට්ඨං මා අභිනන්දි' - ඒ විදියට දිට්ඨය තමාගෙ දෙයක් කරගත්තට පස්සේ ඒ පිළිබඳව සතුටක් ඇතිවෙනව. තණ්හාවක් ඇතිවෙනව. 'ඒව ඇතිකරගන්න එපා' කියන එකයි. මේ මොකද බුදුපියාණන්වහන්සේ 'දිට්ඨෙ දිට්ඨමත්තං භවිස්සති' කියල ප්‍රකාශ කළේ? මේ උන්වහන්සේ පළමුවෙන්ම දුන්නු උපදේශයයි. ආර්‍ය ව්‍යවහාරයෙන්මයි බුදුපියාණන්වහන්සේ බාහිය දරුචීරිය තාපසතුමාට ආමන්ත්‍රණය කරන්නෙ. ඒ තරම් නුවණ දියුණු පුද්ගලයෙක් නිසා. 'ඔබට දිට්ඨයෙහි දිට්ඨ මාත්‍රයම වන්නේය'. දුටුයෙහි දුටුමතින්ම නැවතීමක්.

එතකොට මඤ්ඤනා නොකිරීම දුටුයෙහි දුටුමතින්ම නතරවීමක්. දුටුයෙහි දුටුමතින් නතරනොවී, අර කියාපු විදියට දිට්ඨයෙහි දිට්ඨයෙන් ආදී වශයෙන් සිතුවොත් එතනින් සිදුවෙන්නෙ 'තම්මයතාව'ක්. තම්මයතා කියන වචනයත් අපි ගියවර දේශනයේදී හැඳින්වුව. 'තම්මයො' කියන්නෙ අර 'රන්මය' 'රිදීමය'' කිව්ව වගේ අර විදියට මඤ්ඤනාකරන්න පටන්ගත්තට පස්සෙ ඒ දේත් තමාත් එක්කෙනක් බවට පත්වෙනව. මැණිකක් අල්ලගත්තු කෙනා මැණික් අයිතිකාරයා උනා වගේ. මැණිකට මොකක්හරි උනොත් ඒ පුද්ගලයට ඒක බලපාන්න වගේ. දිට්ඨයෙ, තණ්හාමාන දිට්ඨි වශයෙන් ඇලී වෙලී පැටලී ගත්තාම, අර විදියට මඤ්ඤනාකරල, මමත්වයෙන් හිතල, එතකොට ඔන්න තම්මයතාවක් ඇතිවෙනව. දැන් මෙතන බුදුපියාණන්වහන්සේ 'අතම්මයතා' ප්‍රතිපදාවට දනව බාහියදරුචීරියව. ඒ කියන්නෙ මේ පිළිබඳව මඤ්ඤනා කරන්න එපා. එතකොට එයින් ඇතිවෙන්නෙ 'අතම්මයතාව' - එයින් වෙන්වීම. විරාග ප්‍රතිපදාවයි එතනින් හැඟෙන්නෙ. එතකොට දිට්ඨය පිළිබඳව මඤ්ඤනා නොකරතොත් ඒ පිළිබඳව තම්මයතාවක් නැහැ. 'අතම්මයො'. ඒකේ ඇලී වෙලී පැටලී ගත්තෙ නැත්නම් ඒ පුද්ගලයට තමා දිට්ඨය තුළ ඉන්නව කියල හැඟීමක් එන්නේ නැහැ. අපි අර සෙල්ලම් ගෙය ඇතුළෙ ඉන්නව කියල

වරක් සඳහන් කළා. මැණියන් තමන් සෙල්ලම් ගෙය තුළ ඉන්නව කියල හිතන්නෙ නැතුව වගේ මේ පුද්ගලය අර විදියට මඤ්ඤනා කරන්නෙ නැත්නම් තමා දිට්ඨය තුළය කියල හැඟීමක් නැහැ. 'න තත්ථ' කියන එකත් ඔන්න අපට එතකොට තේරුම් ගන්න පුළුවන්. 'යතො ත්වං බාහිය, න තෙන තතො ත්වං බාහිය න තත්ථ' -යම් අවස්ථාවක ඔබ 'එයින්' නොවේද, ඔබ 'එයින්' මඤ්ඤනා නොකරයිද, එවිට ඔබ 'එහි' ද නොවන්නේය. ඔබ 'දිට්ඨය තුළ වන්නෙ නැහැ. ඒ වගේම සුතමුත විඤ්ඤාත ආදිය තුළ වන්නෙ නැහැ. ඊළඟට ඒ අනුව අපට හිතාගන්න පුළුවනි 'යතො ත්වං බාහිය න තත්ථ තතො ත්වං බාහිය නෙව ඉධ නහුරං න උභයමන්තරෙ' - යම් අවස්ථාවක ඔබ අර විදියට දිට්ඨයෙන් මඤ්ඤනා නොකරනව නම්, දිට්ඨය තුළ යයි නොහඟී නම්, - දිට්ඨය තුළ ඉන්නව' කියන්නෙ, දිට්ඨය තුළ 'මමෙක්' ඉන්නව කියන එක වගේ-. දිට්ඨය තුළ 'මම ඉන්නව' - එහෙම හිතන්නෙ නැත්නම්, එවිට ඔබ 'නෙව ඉධ' මෙතනත් නැත, 'නහුරං' එතනත් නැත' න උභයමන්තරෙ' ඒ දෙතැන අතරත් නැත. මේ දෙකොනක් සහ මැදක්, උඩත් යටත් මැදසරසත් ආදිය ගැන දේශනා කීපයකදීම අපි සෑහෙන පමණ සාකච්ඡා කරල තියෙනව. එතකොට මෙයින් හැඟෙන්නෙ කුමක්ද? අර කලින් අවස්ථාවක අපි ප්‍රකාශ කළා අස්මිමාන කුඤ්ඤය ගැසීමෙන් තමයි ලෝකයක් මනින්නෙ, ලෝකයක් පැන නගින්නෙ, ලෝකයක් හටගන්නෙ කියල. ඒ එක්කම ව්‍යාකරණ රටාව බිහිවෙන ආකාරයත් අපි ප්‍රකාශකළා. ඒ කියන්නෙ 'අස්මි' - 'වෙමි' කියන අදහසත් එක්කම 'මෙතනක්' ඇතිවෙනව. මෙතැන මම, එතැන ඔහු, ඔතැන ඔබ. එතකොට ව්‍යාකරණ රටාවෙ මූලික පදනමත් ඒකයි. ප්‍රථම පුරුෂ, මධ්‍යම පුරුෂ, උත්තම පුරුෂ ආදී වශයෙන්. එතකොට මනින්න ලෝකයක් පැන නගිනව. ව්‍යාකරණ රටාවක් පැන නගිනව. එතැනම තමයි ප්‍රපංචය. ඒ ප්‍රපංචයෙන් මිදීමයි මෙතන එතකොට' නෙව ඉධ නහුරං න උභයමන්තරෙ' කියල ප්‍රකාශ කළේ. තමා ලෝකයක ඉන්නව කියන හැඟීම නැහැ. තමාත් ලෝකයත් කියල දෙකක් බෙදගැනීමක් නැහැ. 'එසෙවන්තො දුක්ඛස්ස' - ඔන්න මේකම තමයි දුකෙහි කෙළවර - නිවන. එතකොට තරමක් දුරට අපට හිතාගන්න පුළුවනි බුදුරජාණන්වහන්සේ මේ කෙටි සූත්‍රදේශනාවෙන් ඉදිරිපත්කළ මූලික කාරණා.

ඊළඟට අපට මෙතන තියෙන පද හතර ගැනත් තවදුරටත් යමක් කියන්න පුළුවනි. අංගුත්තර නිකායෙ චතුක්ක නිපාතයෙ සඳහන්වෙනව 'චත්තාරො අරියවොහාරා' කියල ආර්‍ය ව්‍යවහාර හතරක්. තවත් තැන්වල ඒ විදියටම සඳහන්වෙනව. ඒ ආර්‍යව්‍යවහාර හතර මොනවද. 1. 'දිට්ඨෙ දිට්ඨවාදිතා 2. සුතෙ සුතවාදිතා 3.මුතෙ මුතවාදිතා 4.විඤ්ඤාතෙ විඤ්ඤාතවාදිතා. දිට්ඨය පිළිබඳව, දුටුදෙය පිළිබඳව, දුටු බව කියනව.

ඇසුදේ පිළිබඳව ඇසුබව කියනව, ඇසුවයි කියල කියනව. දැනුන දේ පිළිබඳව දැනුනු බව කියනව. ඇත්ත ඇති හැටියට කියනව කියන එකයි මේ. විඤ්ඤාතය පිළිබඳව දැනගත්තු බව කියනව. මේක සාමාන්‍ය අර්ථයෙන් ගත්තොත් මේ කියන ආර්ය ව්‍යවහාර සත්‍යවාදී ප්‍රතිපත්තිය අඟවන පද හතරක්. ඒ අර්ථයෙන් සමහර සූත්‍රවල වගේම විනය පිටකයෙත් යෙදිල තියෙනව. සාමාන්‍යයෙන් සත්‍යවාදිබව හඟවනව. ගැඹුරු අදහසකින් නොවෙයි. නමුත් මේ සත්‍යය පිළිබඳ විවිධ මටටම් තියෙනව. මේ සත්‍යවාදීබව ඇත්තවශයෙන්ම ප්‍රත්‍යක්ෂයත් එක්ක සමාන්තරව යන සාක්ෂිදීමක්. ඒ ප්‍රත්‍යක්ෂය ඉහළට යන්න යන්න ඒ එක්කම අර සාක්ෂියත් වෙනස්වෙනව.

ඉතාමත්ම ප්‍රකට කථාන්තරයක් පිණ්ඩපාතික තිස්ස ස්වාමීන් වහන්සේ පිළිබඳ කථාව. කවුරුත් වගේ අහල තියෙන නිසා අතුරු විස්තර අවශ්‍ය නැහැ. අර පිණ්ඩපාතික තිස්ස ස්වාමීන්වහන්සේට ස්ත්‍රියක් මගදී හමුවෙලා හිනාවුනාම දත්ටිකේ නිමිත්ත විතරයි ගත්තෙ. නිමිත්ත නොගෙනම හිටියෙ නැහැ. තමන්ගෙ කමටහන් නිමිත්ත අල්ල ගත්ත, ඒ දත් ඇට ටිකෙන්. ඒක නිසා ඊළඟට ඒ ස්ත්‍රියගේ ස්වාමි පුරුෂයා ඇවිල්ල ඇහුවාම දැක්කද ස්ත්‍රියක් කියල 'නැහැ මම ඇටසැකිල්ලක් දැක්ක කිව්ව'. ඒක ඒ එක්තරා මට්ටමක්. ඔන්න ඔය විදියට සත්‍යවාදීබව ප්‍රත්‍යක්ෂයත් එක්ක යන වෙනස්වන එක්තරා තරාතිරම් ඇති දෙයක්. මේකෙ ඉහළම මට්ටම තමයි පරම සත්‍යය. පරමාර්ථසත්‍යය නොවෙයි. ඒ පරම සත්‍යය කුමක්ද කියන එකත් බුදුපියාණන්වහන්සේ ධාතුවිභංග සූත්‍රයෙම එක තැනක සඳහන් කරනව.

'එතං හි භික්ඛු පරමං අරියසච්චං යදිදං අමොසධම්මං නිබ්බානං'. මහණ මෙයයි පරම සත්‍යය එනම් - 'අමොසධම්මං නිබ්බානං' මුසාවක් නොවන, මුසා ස්වභාවයක් නැති, නිවන. අනිකුත් හැම සත්‍යයක්ම මුසාවක් වෙනව ඊට ඉහළ එකට ගියාම. නමුත් නිවන පරම සත්‍යය වන්නෙ කිසිසේත් මුසාවක් බොරුවක් බවට හැරෙන්නෙ නැති නිසයි.

එතකොට මෙන්න මේ කියාපු ඉහළ මට්ටමෙන් සාක්ෂිදෙන්න පුළුවන්කමක් තිබෙන බව අපට හෙළිවෙනව මජ්ඣිම නිකායෙ ඡබ්බිසොධන සූත්‍රයෙන්. මේ ඡබ්බිසොධන සූත්‍රයෙ බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කරනව යම්කිසි කෙනෙක් අර්හත්වය සැලකළහම, ඒ භික්ෂූන් වහන්සේගෙන් අනිකුත් භික්ෂූන්වහන්සේල යම් යම් ප්‍රශ්න ඇසිය යුතු බව. යම් යම් ධර්ම න්‍යායයන් මුල්කරගෙන ප්‍රශ්න ඇසිය යුතු බව. එක ධර්ම න්‍යායයක් තමයි අර දිට්ඨ සුත මුත විඤ්ඤාත යන හතර පිළිබඳව. ඇත්ත වශයෙන්ම රහත් කෙනෙක් නම් ඒ ස්වාමීන්වහන්සේ දියයුතු පිළිතුර බුදුපියාණන් වහන්සේ ප්‍රකාශකරනව. මෙන්න මේ විදියටයි.

**'දිට්ඨෙ ඛො අහං ආවුසො අනුපායො අනපායො අනිස්සිතො අප්පටිබද්ධො විප්පමුත්තො, විසංයුත්තො විමරියාදිකතෙන චෙතසා විහරාමි'**

අන්න ඉහළම අර්ථයෙන් සාක්ෂිදුන්න දිට්ඨය පිළිබඳව රහත්කෙනෙක් හැටියට. ඒ කියන්නෙ, ඇවැත්නි මම දිට්ඨය පිළිබඳව, 'අනුපායො' - අනුපායො කියන්නෙ රාග වශයෙන් ළං නොවී, 'අනපායො'- ද්වේෂ වශයෙන් ඉවත් නොවී, 'අනිස්සිතො' - තණ්හාමාන දිට්ඨි වශයෙන් එහි නොරැඳී, 'අප්පටිබද්ධො' ඡන්දරාග වශයෙන් එහි නොබැඳී, 'විප්පමුත්තො' - කෙලෙස් ආදීන් ගෙන් මිදිල, 'විසංයුත්තො' - සංයෝජන වලින් මිදිල, සංයෝජන වලින් ගැලවිලා, 'විමරියාදිකතෙන චෙතසා' - මරියාද කියල කියන්නෙ මායිම. මායිම්කර නොගත් සිතකින් වාසයකරනව. මේ මායිම් අපට හිතාගන්න පුළුවනි. අර අජ්ඣත්ත බහිද්ධා ආදී මායිම්. ඒවායින්නෙ මේ මුළුමහත් භවයම ගොඩනැගෙන්නෙ. මායිමක් ඇති තැන තියෙනව අර විදියෙ ඇලුම් බැඳුම් ගැටුම්. ඒ හැම එකක්ම වැට කඩුලු තිබෙන තැනක තිබෙනව. එතකොට 'විමරියාදිකතෙන චෙතසා' - ඒ විදියෙ වැටකඩුලු මායිම් නැති සිතකින් යුක්තව මම වාසය කරනව, දිට්ඨය පිළිබඳව. අන්න ඒ විදියට ප්‍රකාශ කරන්න පුළුවන්කම තමයි ඉහළම සාක්ෂිදීම. 'චත්තාරො අරිය වොහාරා' - ආර්‍ය ව්‍යවහාරවලින් දෙන්න පුළුවන් ඉහළම සාක්ෂිය තමයි රහත්බව. එතකොට අපි දැන් මේ සතර ආර්‍ය ව්‍යවහාර පිළිබඳවත් සෑහෙන යමක් ප්‍රකාශකළා.

ඊළඟට ප්‍රධාන කාරණයක් තමයි, බුදුපියාණන්වහන්සේ මේ බාහිය දරුචීරිය තවුසාණන්ට අධිසීල අධිචිත්ත අධිපඤ්ඤ කියන ත්‍රිවිධ ශික්ෂාවම ඉදිරිපත් කළේ මේ ආර්‍යව්‍යවහාර හතර තුළින්. ඒක නම් අටුවාවත් පිළිගන්නව. නමුත් මෙතෙන්දි අපට විස්තරයකුත් කරන්න සිද්ධවෙනව. කොහොමද මේ සීල, සමාධි පඤ්ඤ බේරගන්නෙ මේ කෙටි උපදේශය තුළින්. බාහිය සූත්‍රයේ ඒ මුල්කොටස මොකක්ද? අපි කලින් ප්‍රකාශකළේ. 'තස්මාතිහ බාහිය එවං සික්ඛිතබ්බං' - මෙතන හැඟවෙනව ශික්ෂාවට දැම්මබව මුලදීම. 'බාහිය එසේනම් ඔබ මේ විදියට හික්මිය යුතුයි. 'දිට්ඨෙ දිට්ඨමත්තං භවිස්සති' - දිට්ඨයෙහි දිට්ඨය පමණක්ම වන්නේය. - අපි මේ පහසුවට පාවිච්චි කරනව පාළි වචනම දැන් අපි තේරෙන නිසා. දිට්ඨයෙහි දිට්ඨමාත්‍රයම වන්නේය. සුතයෙහි සුතමාත්‍රයම වන්නේය. මුතයෙහි මුතමාත්‍රයම වන්නේය. විඤ්ඤාතයෙහි විඤ්ඤාත මාත්‍රයම වන්නේය. මෙතනින් මේ කියැවෙන්නෙ අධිශීල ශික්ෂාව. දැන් අධිශීල ශික්ෂාවට අයිති ප්‍රධානම කාරණයක් තමයි, ඉන්ද්‍රිය සංවර ශීලය.

ඒ ඉන්ද්‍රිය සංවර ශීලයේ මූලධර්ම අඩංගුවෙනව මේ කියාපු කෙටි උපදේශයේ. මක්නිසාද? දුටුවෙහි දුටුමතින් නතරවෙනව නම් ඒ පිළිබඳව

නිමිති අනුව්‍යඤ්ජන ගැනීමක් නැහැ. මේ දුටුදෙය පිළිබඳව මේක හොඳයි මේක නරකයි ආදී වශයෙන්, නිමිති අනුව්‍යඤ්ජන ගැනීමක් නැහැ. ඒකෙන්ම ඉන්ද්‍රිය සංවරය සැලසෙනව. එතකොට ඉන්ද්‍රිය සංවර ශීලයට ඒක අදාල වෙන්නෙ අර නිමිති අනුව්‍යඤ්ජන නොගැනීමෙන් කියන එක අපට හිතාගන්න පුළුවන්. මෙතන අධිසීල සික්ඛාවත් තිබෙනව. ඊළඟට අධිචිත්ත සික්ඛාවට මේක උපකාර වෙන්නෙ, දුටුයෙහි දුටුමතින් නතරවෙනවනම්, ඒ පිළිබඳ විතර්ක කරන්න යන්නෙ නැතිව නීවරණ ප්‍රහානයට මඟ සලසගන්නව. මක්නිසාද? නීවරණ අරගෙන එන්නෙ මේ විතර්කයි. එතකොට අධිචිත්ත සික්ඛාවට - සමාධියට - අදළ කොටසත් මෙතනම තිබෙනව. සීල සමාධි. ඊළඟට අධිපඤ්ඤ. මේක ගැන විශේෂයෙන් යමක් කියන්න සිද්ධ වෙනව. මෙතන අධිපඤ්ඤ හැටියට ගතයුත්තේ කුමක්ද? ඇත්ත වශයෙන්ම අර මඤ්ඤනා ප්‍රපඤ්චවලින් මිදීමයි. දුටුවෙහි දුටුමතින් නතර උනොත් මූලපරියාය සූත්‍ර ආදියෙහි අපි දැක්වූ අර අතු ඉති ආදියට යාම වළකිනව. දිට්ඨය වස්තුත්වයෙන් අරගෙන, 'දෙයක්' හැටියට අරගෙන, 'එය තුළ', 'එයින්', 'එය මගේ', ආදී වශයෙන් ප්‍රපඤ්චව කිරීම් නතරවෙනව. මඤ්ඤනා ප්‍රපඤ්ච ආදියෙන් සිත මුදු ගැනීමට උපකාරීවෙනව. ඒ වගේම බුදුරජාණන්වහන්සේ ප්‍රකාශකරල තියෙනව, ඇස් කන් නාසාදි ආයතන හයම පාළු ගම් වගේ කියල. 'සුඤ්ඤමිදං අත්තෙන වා අත්තනියෙන වා' - මේ ඇස් කන් නාසාදී හැම එකක්ම ආත්මයකින් හෝ ආත්මයකට අයිති දෙයකින් ශූන්‍යයි. ආත්මයකුත් නෑ මෙතන. ආත්මයට අයිති දේකුත් නෑ. ඒනිසා හරියට පාලු ගම් වගේ. ඔක්කොම මිනිස්සු පලා ගිහිච්ච නිකම් පාලු ගම් වගේ. අන්න ඒ පාලුගම් තත්ත්වයෙන් සළායතනයම සැළකීමට උපකාරවන උපදේශයක් තමයි 'දිට්ඨෙ දිට්ඨමත්තං භවිස්සති' දුටුයෙහි දුටුමාත්‍රයම පමණයි. ඇසුවෙහි ඇසුමාත්‍රයම පමණයි. අන්න ඒ අනුවත් අපට හිතාගන්න පුළුවන් මෙතන කියන මේ අධිපඤ්ඤව - පඤ්ඤව - දියුණුවීමට උපකාරවන කොටස් මොනවද කියල. ඒ විදියට ගත්තොත් සාමාන්‍යයෙන් ප්‍රපඤ්චයෙන් කෙරෙන්නෙ එක්තරා විදියක දිගින් දිගට ගනුදෙනු කිරීමක්. දිට්ඨ සුත මුත ආදියෙන් දිගින්දිගට ගනුදෙනු කිරීමක් මෙතන නෑ එතකොට. ඒ වගේම 'දිට්ඨෙ දිට්ඨමත්තං භවිස්සති' සුතෙ සුතමත්තං භවිස්සති' මුතෙ මුතමත්තං භවිස්සති, විඤ්ඤාතෙ විඤ්ඤාතමත්තං භවිස්සති' - ආදී වශයෙන් ගැනීම නිසා අර තම්මයතාවත්, එය මගේය කියන හැඟීමත්, නැතිවෙලා යනව. ඒ එක්කම මමත්වය, අස්මිමානය, ඊළඟට අර ප්‍රපංචයට, උපකාරවන දේවල්, සියල්ලම ඒ එක්කම නැතිවෙලා යනව. ප්‍රපඤ්ච නිරෝධය, භව නිරෝධය, දුක්ඛ නිරෝධය, ඒ හැම එකකටම උපකාරවන අර අස්මිමාන කුඤ්ඤය ගැලවීම සිදුවෙනව මේ ශික්ෂණය නිසා. එතකොට ත්‍රිවිධ ශික්ෂාවම මේ දේශනාවෙ අඩංගු බව අපට මේ අනුව හිතාගන්න පුළුවනි.

මේ විදියට බුදුපියාණන්වහන්සේ ත්‍රිවිධ ශික්‍ෂාවම ඉදිරිපත්කළාට පස්සෙ සිඬවන දේ තමයි අර 'න තෙන න තත්‍ථ, නෙවිධ, නහුරං, න උභයමන්තරේ' කියල ප්‍රකාශකරල පෙන්නුවෙ. මේ ත්‍රිවිධ ශික්‍ෂා මාර්ගයෙ ගමන්කරල බාහිය දරුචීරිය තාපසයාණන්ගෙ නුවණ මුහුකුරා ගියාට පස්සෙ තමයි බුදුපියාණන්වහන්සේ 'එවිට ඔබ එයින් නොවන්නේය, එයින් නොවන්නේ නම් ඔබ එහි නොවන්නේය. ඔබ එහි නොවන්නේ නම් ඔබ මෙතනත් නැත. එතැනත් නැත. ඒ දෙක අතරත් නැත. මෙයම දුකේ කෙළවරයි' කියල අර භවනිරොධයවූ නිර්වාණය පිළිබඳ ප්‍රත්‍යක්‍ෂයයි එතනින් ප්‍රකාශකරන්නෙ. මුළු මහත් සද්ධර්මයම එක්තරා විදියකට හකුලුවල දක්වන වටිනා සූත්‍රයක් හැටියට මේ සූත්‍රය දක්වන්න පුළුවනි. බුදුපියාණන්වහන්සේ මේ උපදේශය දෙනවත් එක්කම බාහියදරුචීරිය තාපසයාණන්ගේ සිත එකෙණෙහිම සියලුම ආශ්‍රවයන්ගෙන් මිදුන බව සඳහන් වෙනව. 'තාවදෙව' කියල තියෙනව. එකෙණෙහිම සිත මිදුන ආශ්‍රවයන්ගෙන්.

ඊළඟට අපි ආයෙත් උදානපාළියෙ එන මේ කථා ප්‍රවෘත්තියට යමු. අර විදියට බුදුපියාණන්වහන්සේ පිණ්ඩපාතයේ වඩින්න සූදනම් වෙලා ඉන්න අවස්ථාවෙ බොහොම ඇවිටිලි කරල තේ මේ ධර්මදේශනාව ලබාගත්තෙ. ඒකෙන් නියම ප්‍රතිඵලත් නෙළාගත්තට පස්සෙ බුදුපියාණන්වහන්සේ ආයිමත් පිණ්ඩපාත චාරිකාවෙ වැඩමකළා. ඒ එක්කම වාගේ වැඩිවෙලාවක් යන්න කලින් කුඩාවසුපැටියෙක් ඇති එළදෙනක් මේ බාහිය දරුචීරිය රහතන්වහන්සේට ඇනල ජීවිතක්‍ෂයට පත්කළා. බුදුපියාණන්වහන්සේත් පිණ්ඩපාතය වළඳල භික්‍ෂුන්වහන්සේලා පිරිසකුත් එක්ක ආයෙමත් ඒ පැත්තෙන් වඩින අතරෙ දැක්ක මේ බාහියදරුචීරිය රහතන් වහන්සේගේ මෘතදේහය. දැකල සංඝයා වහන්සෙලාට ප්‍රකාශ කළා මේ සිරුර ඇඳක තබල ගෙනිහිල්ල ආදහනය කරන්න. ආදහනය කරල එතන ස්තූපයක් ගොඩනගන්න කියල. මේ කාලක්‍රියාකරල ඉන්නෙ නුඹලගෙ සබ්‍රහ්ම චාරින්වහන්සේ නමක් කියලත් ප්‍රකාශකළා. එතකොට සංඝයා වහන්සේලාත් ඒ අනුව බාහියදරුචීරිය රහතන්වහන්සේගේ ශරීරය අරගෙන ගිහිල්ල අර විදියට ආදහනය කරල බුදුපියාණන්වහන්සේ ළඟට ඇවිල්ල ඒ කාරණය ප්‍රකාශ කළා. අපි දැන් ඒ කටයුතු නිමකරලයි ආවේ කියල. ඊළඟට ප්‍රශ්නයක් ඇහුව මේ බාහියදරුචීරිය මියගියාට පස්සෙ කොහාටද ගියෙ' - කා ගති කො අභිසම්පරායො' කියලයි ප්‍රශ්නකළේ. බාහිරදරුචීරියගේ 'ගතිය' කුමක්ද? ගතිය කියල කියන්නෙ ගියතැන, කුමක්ද? 'අභිසම්පරායො' පරලොව තත්ත්වය කුමක්ද? මරණින් මතු තත්ත්වය කුමක්ද? කියල ඔය විදියට ප්‍රශ්නකළා. එතකොට බුදුපියාණන්වහන්සේ ප්‍රකාශ කරනව: 'මහණෙනි බාහිය දරුචීරිය

පණ්ඩිතයි. මට මේ ධර්මය උගන්වන්න කියල වැඩි කරදර කළේ නැහැ. ඒ ධර්මය අනුව පිළිපැද්ද. බාහිය පිරිනිවන් පෑව. කියල ප්‍රකාශ කරල ඊ ළඟට උදානගාථාවකුත් වදාළ.

**'යත්ථ ආපො ච පඨවී තෙජො වායො න ගාධති**
**න තත්ථ සුක්කා ජොතන්ති ආදිච්චො නප්පකාසති**
**න තත්ථ චන්දිමා භාති තමො තත්ථ න විජ්ජති**
**යදා ච අත්තනා වෙදි මුනි මොනෙන බ්‍රාහ්මණො**
**අථ රූපා අරූපා ච සුඛදුක්ඛා පමුච්චති.**

මේ ගාථාව ගැන පරමත්ථදීපනී උදාන අටුවාව පුදුම විදියෙ අර්ථ විවරණයක් දෙන්නෙ. මේ ගාථාවෙ අදහස ඉස්සෙල්ල අපි සළකල බලමු, සාමාන්‍ය වශයෙන්. 'යත්ථ ආපො ච පඨවී තෙජො වායො න ගාධති'. යම්තැනක පඨවි, ආපො, තෙජො, වායො, කියන මේ සතර මහාභූතයෝ ප්‍රතිෂ්ඨාවක් නොලබත්ද, 'න තත්ථ සුක්කා ජොතන්ති' එතැන තරු නොදිළෙයි.' ආදිච්චො නප්පකාසති' - සූර්යයා අප්‍රකටය. සූර්යයා එළිය නොවිහිදුවයි කියන එකයි. 'න තත්ථ චන්දිමා භාති' - එතැන හඳ ශෝභමානවන්නෙ නැහැ. සඳ එළිය විහිදුවන්නෙ නැහැ. 'තමො තත්ථ න විජ්ජති' - එතැන අන්ධකාරයත් නැහැ. 'යදා ච අත්තනා වෙදි මුනි මොනෙන බ්‍රාහ්මණො' . ක්ෂීණාශ්‍රව බ්‍රාහ්මණ නම්වූ ඒ රහතන්වහන්සේ, ඒ මුනිවරයා, යම් අවස්ථාවක චතුරාර්යසත්‍යය පිළිබඳව මොන නම්වූ ප්‍රඥවෙන් තමාම ප්‍රත්‍යක්ෂකරගත්තේ වේද', අථ රූපා අරූපා ච සුඛ දුක්ඛා පමුච්චති' එවිට රූපයෙනුත් අරූපයෙනුත් සැපයෙනුත්, දුකෙනුත් මිදෙනව. ඔය විදියටයි ගාථාවෙ අර්ථය.

මේ ගැන දීර්ඝ විග්‍රහයක් කරන අටුවාව -අපට අවශ්‍ය කොටස විතරක් ප්‍රකාශ කරමු - පුදුම විදියේ අදහසක් ප්‍රකාශකරනව කියල අපි කිව්වේ අටුවාව මේ ගාථාව තෝරන්නෙ හරියට අර බාහියදාරුචීරිය රහතන්වහන්සේ පිරිනිවන් පෑමෙන් පසු ගියතැන පිළිබඳ විස්තරයක් හැටියටයි. වෙන එකක් තබා 'නිබ්බාන ගති' කියන වචනය පවා යොදනව. අපි හිංගල කරල කිව්වොත් බාහිය රහතන්වහන්සේ පිරිනිවන්පෑමෙන් පසු **'නිවන් ගියතැන'** පිළිබඳ විස්තරයක් හැටියට, ඒ තැන, 'පුථුජ්ජනෙහි දුබ්බිඤ්ඤෙය්‍යා' - පෘථග්ජනයින්ට තේරුම් ගන්න බැරි තැනක්. ඊළඟට ඒකෙ ලක්ෂණ හැටියට දක්වනව - පඨවි ආපො තෙජො වායො එතැන නැහැ. ඉරත් නෑ. හඳත් නෑ. තරුත් නෑ. ඒ වගේම එතැන පඨවි ආපො තෙජො වායො නැත්තෙ මක්නිසාද? අසංඛත වූ ඒ අනුපාදිසෙස නිබ්බානධාතුවෙ සංඛත ධර්ම කිසිවක් නැති නිසයි ඒ පඨවි ආපො ආදිය නැතෙයි කියල තියෙන්නෙ. ඊළඟට එතැන -ඒ කියාපු අද්භූත තැන- ඉරකුත් නැහැ. හඳකුත් නෑ. තරුත් නෑ ඊ ළඟට අර 'තමො තත්ථ න විජ්ජති' -

එතැන අඳුරක් නැත කියල කිව්වේ මක්නිසාද කියන ප්‍රශ්නය නගල, ඒකට උත්තරේකුත් දෙනව. මක්නිසාද එතැන අන්ධකාරයක් නැහැයි කියල ප්‍රකාශකළේ? එහෙම කියල තියෙන්නෙ, අටුවාව කියන හැටියට, දැන් කෙනෙකුට සැකයක් ඇතිවෙන්න පුළුවන් ඉරත්, හඳත්, තරු ආදියත් නැත්නම් එතැන අන්ධකාරයක් තිබෙන්න ඕනය කියල. නමුත් කොයිතරම් පුදුමද කියතොත් මේ අනුපාදිසෙස නිබ්බාන ධාතුව, අර විදියට ඉරත් හඳත් නැතිඋනාට මොකද එතැන අඳුරකුත් නැහැ. ඉර හඳ තරු ආදිය නැත්නම් කෙනෙකුට සැක හිතෙන්න පුළුවනි මේ අනුපාදිසෙස නිබ්බාන ධාතුව ලොකාන්තරය වගේ මහා අන්ධකාර තැනක්ය කියල. ඒ සැකය වැළැක්වීමටය මෙතන මේ බුදුපියාණන්වහන්සේ එහි අඳුරක් නැත කියල විශේෂයෙන් ප්‍රකාශකරල තියෙන්නෙ.

ඉතින් ඔය විදියට අටුවාව කරන විස්තරයට අනුව අපට නිගමනය කරන්න ඉඩදීල තියෙන්නෙ අර ඉර හඳ තරු නැති **නමුත්** -මෙතන 'නමුත්' කියන වචනය අපි අවධාරණය කරනව, යම්කිසි හේතුවක් නිසා- ඉර හඳ තරු ආදිය නැති '**නමුත්**' එහි අන්ධකාරයක්ද නැත කියල. ඔය විදියටයි අටුවාව තෝරන්නෙ.

මේ දේශනාමාලාවෙ මෙතෙක් අපි ඉදිරිපත් කළ විවරණමාර්ගීය අනුව, මේ අටුවා මගින් ටිකක් ඉවත්වෙන්න සිද්ධ වෙනව අපට. මේ ගාථාවෙ 'යත්ථ ආපො ච පඨවී' ආදී වශයෙන් මෙතන මේ කියන 'යම්තැන' බාහියදාරුචීරිය රහතන්වහන්සේ 'ගියතැන' නොවෙයි. මරණින් පස්සෙ 'ගියතැනක්' නොවෙයි. අටුවාව හිතාගන්නෙ මේ බුදුපියාණන්වහන්සේ මේ ගාථාව ප්‍රකාශකළේ අර භික්ෂූන් වහන්සේලා අහපු ප්‍රශ්නෙට පිළිතුරක් දීමටය කියල. අර භික්ෂූන්වහන්සේලා ඇහුවෙ 'බාහියදාරුචීරිය ගියතැන කුමක්ද? 'මරණින් මතු තත්ත්වය කුමක්ද? කියලයි. නමුත් මේක හොඳට සැළකිල්ලෙන් කියවල බැලුවාම තේරෙනව ඒ භික්ෂූන් ඒ ප්‍රශ්නය ඇසුවෙ, තමන් ඒ ගෙනිහිල්ල දැවුවෙ රහතන්වහන්සේ කෙනෙකුගෙ ශරීරයක් බව නොදත් නිසා. එහෙම දැනගත්තානම් ඒ ප්‍රශ්නය අහන්නෙ නැහැ. ඒ නිසා තමයි බුදුපියාණන්වහන්සේ එතෙන්දි ප්‍රකාශ කළේ- කලින් ප්‍රකාශ නොකොට එතැන්දි ප්‍රකාශකළේ,- 'බාහිය පිරිනිවන් පෑව' කියල. 'මට කරදර නොකර බාහිය බොහොම ඉක්මනින්ම පිරිනිවන් පෑව කියල. ඉතින් ඒකයි පිළිතුර. අර සංඝයා වහන්සේලා අහපු ප්‍රශ්නෙට පිළිතුර බාහිය පිරිනිවන් පෑව කියන එකයි. පිරිනිවන් පෑවය කිව්වට පස්සෙ ඉතින් තේරුම් ගන්නව, ඒ ස්වාමීන්වහන්සේල ධම්ඥනය ඇති නිසා, අපි අහපු ප්‍රශ්නයම වැරදියි කියල. එතකොට මේ ගාථාව ඊට අමතරව බුදුපියාණන්වහන්සේ වදළ එක්තරා ප්‍රීතිවාක්‍යයක්. ඒ විදියෙ උදානගාථා කොතෙකුත් තියෙනව. අපි කලිනුත් ප්‍රකාශකළා, උදානපාළියෙ එන ගාථා

බොහොම ප්‍රවේශමෙන් ඕන විග්‍රහ කරන්න. මක්නිසාද? කථාන්තරයට වඩා හුහාක් ඈතට විහිදිල යනව. මුළුමහත් ධම්සාගරයෙම කිමිදෙනව. ඒ එකගාථාවක් ඇති. පොතනම් බොහොම පොඩියි. ලොකු පොතක් නොවෙයි. බුදුපියාණන්වහන්සේ ප්‍රකාශකළ ප්‍රීති වාක්‍යයක් මේක. මේක පිළිතුර නොවෙයි කොහේ ගියාද කියන එකට.

එහෙමනම් කොහොමද අපි මේ 'යත්ථ' කියනඑක තේරුම්ගන්නේ? ඒකට දැනටමත් අපි සාධකයක් ඉදිරිපත්කරල තියෙනව, අර අනිදස්සන විඤ්ඤාණය පිළිබඳව අපි හත්වෙනි දේශනයේදී පමණ විග්‍රහයක්කළා. බුදුපියාණන්වහන්සේ මේ ප්‍රකාශකරන්නෙ මොකක්ද? බාහිය දරුචීරිය රහතන්වහන්සේ ගියතැන නොවෙයි බාහිය රහතන් වහන්සේ මෙලොවදීම -'දිට්ඨෙව ධම්මෙ'- ප්‍රත්‍යක්ෂකරගත්, අර්හත්ඵල සමාධියෙන් ප්‍රත්‍යක්ෂකරගත්, 'අනිදස්සන විඤ්ඤාණ' තත්ත්වයයි.

**'විඤ්ඤාණං අනිදස්සනං - අනන්තං සබ්බතොපභං**
**එත්ථ ආපො ච පඨවී - තෙජො වායො න ගාධති'**

යන ගාථාපද අපි මතක්කර ගනිමු කේවඩ්ඪ සූත්‍රයෙන්. ඒකෙ තුන්වෙනි පදයෙන් අපට පිළිතුරු ලැබෙනව, මෙන්න මේ 'යත්ථ' කියන එකට. බාහිය සූත්‍රයෙ මුල් පදයෙ තියෙන්නෙ - 'යත්ථ ආපොච පඨවී තෙජො වායො න ගාධති' කියල. කේවඩ්ඪ සූත්‍රයෙ ගාථාවෙ මේ පදයෙන් පිළිතුරු ලැබෙනව ඒකට. 'එත්ථ ආපොච පඨවී තෙජො වායො න ගාධති' ඒ කියන්නෙ අර මුල්පදයෙන් කියාපු අනිදස්සන විඤ්ඤාණය ගැනයි.

**'විඤ්ඤාණං අනිදස්සනං - අනන්තං සබ්බතොපභං**
**එත්ථ ආපො ච පඨවී - තෙජො වායො න ගාධති'** -

කියලයි කේවඩ්ඪ සූත්‍රයෙ ගාථාවෙ සඳහන් වෙන්නෙ.එතකොට අපිට හිතාගන්න පුළුවන් මේ තැන කුමක්ද කියල. අර අනිදස්සන විඤ්ඤාණයයි. අපි දැනටමත් බොහොම විස්තර කරල තියෙනව -අර සතර මහා භූතයින්- පඨවි ආපො තෙජො වායො, ප්‍රතිෂ්ඨාවක් ලබන්නෙ නෑ ඒ විඤ්ඤාණයෙ. හොල්මන් කරන්නෙ නෑ. එතකොට ඒ ටික අපි තේරුම්ගත්ත නම්, ඊළඟට තියෙන ලොකුම ප්‍රශ්නය තමයි ඉරත් හඳත් තරුත් ගැන මේ මොකක්ද ප්‍රකාශකරන්නෙ. ඒ කියාපු අනිදස්සන විඤ්ඤාණයෙ 'න තත්ථ සුක්කා ජොතන්ති' තරු දිළිසෙන්නෙ නැත. ඉරත් ප්‍රකටව බබලන්නෙ නැත. හඳත් එළිය විහිදුවන්නෙ නැත. ඒ වගේම අන්ධකාරයකුත් එතැන නැත. මේව අපි කොහොමද තෝරගන්නෙ?

මෙතන අපි කෙටියෙන්ම සඳහන් කළොත් මූලදීම, බුදුපියාණන් වහන්සේ මේ ප්‍රකාශ කරන්නෙ අනන්ත වූ හැමපැත්තෙන්ම ප්‍රභාවත්වූ, හැම

පැත්තෙන්ම ආලෝකය ඇති -'අනනතං සබබතො පහං'- අනිදස්සන විඤ්ඤාණයෙ ප්‍රභාවයෙන්, ඒ ප්‍රභාව නිසාම අර කියාපු ඉර හඳ තරු ආදිය නිෂ්ප්‍රභා වන බවයි. 'නිෂ්ප්‍රභා' කියන වචනය සමාජයෙ නම් තියෙන්නෙ ඉහළ උසාවියෙ තීන්දුවකින් පහල උසාවියෙ තීන්දුවක් නිෂ්ප්‍රභා වෙනව වගේ එකක්. එහෙම එකක් නොවෙයි මෙතන. ආලෝකයෙන්මත් නිෂ්ප්‍රභාවෙන ස්වභාවයක් තියෙනව. අපි ඒක අර දේශනා කීපයකදීම එළියට ගත්තු සිනමාදර්ශනයෙන් පැහැදිලිකළා, කෙටියෙන් ආයෙත් සළකල බැලුවොත්, සිනමා දර්ශනයක් නරඹන්නන්ගේ අවධානය යොමුවෙලා තිබෙන්නෙ ඒ තිරය මත වැටෙන පටු ආලෝකධාරාව කෙරෙහියි. ඒ නරඹන්නන් අර සිනමාදර්ශනය හැටියට සළකන චිත්‍ර දකින්නෙ ඒ පටු ආලෝකධාරාවත් අවට ඇති ඝන අන්ධකාරයත් පිහිටකරගෙනයි. මේ දෙවෙනි කාරණයත් ඉතා වැදගත්. ඒ රූප පෙනෙන්නෙ අර ආලෝකධාරාව නිසාම පමණක් නොවෙයි. අවට ඇති ඝන අන්ධකාරයත් උපකාරකරගෙනයි. ඒ බව හෙලිවෙන්නෙ අර ශාලාව ඒකාලෝක උන විටයි. ඒ ශාලාව ඒකාලෝක උනොත් හදිසියෙ දොරකවුලු හැරීමෙන් හෝ වෙන කිසි ආලෝක ක්‍රමයකින් හෝ, හිටිගමන් ආලෝකවත් වුන හැටියෙ, අර තිරේ මත වැටෙන චිත්‍ර විවර්ණවෙලා මැකිල යනව. අර කලින් වැටුන ආලෝකධාරාව නිෂ්ප්‍රභාවෙනව. ලොකු ප්‍රභාවකින් ඊට අඩු ප්‍රභාවක් නැතිවී යාමයි මේ නිෂ්ප්‍රභා කියන වචනයේ අර්ථය. දැන් එතකොට ඒ සිනමා දර්ශනය සමහරවිට රුචිනොවන්න පුළුවනි. හැමතිස්සෙම සිනමාව ගැන කථාකිරීම 'නච්ච ගීතවාදිත' හැටියට හිතන්න පුළුවනි. ඒ නිසා අපි කල්පනාකරල බලමු මේ සිනමා දර්ශනය ශාලාවකට සීමාවුන දෙයක්ද කියල. අප ඇස් ඉදිරිපිට තියෙන ලෝකසිනමාවෙත් මේ විදියෙම දෙයක් සිද්ධවෙනව. මේ විදියෙම නිෂ්ප්‍රභා වීමක් සිද්ධ වෙනව. හැන්දෑ අහසේ තරු පායාගෙන එනකොට අපි ඒ සහන් එළියෙන් යන්තමින් රූප දකින්න පටන්ගන්නව. අර අන්ධකාරය එන අතරෙ හොඳට තරු පායල තියෙනකොට යන්තමින් අපට රූප පෙනෙන්න පටන් ගන්නව. ටික වෙලාවකින් හඳ පායනවා. එතකොට තරුවලට යන කලදසාව මොකක්ද? තරුවල දීප්තිය මැකිලයනව. තරු නිෂ්ප්‍රභා වෙනව. ඊළඟට අපි රාත්‍රිකාලයේ හඳේ සෞම්‍ය එළියෙන් සුන්දර ලෝකයක රූප දකිමින් සිටිනව. රැය ගෙවීයනව. ඉර උදවෙනව. එතකොට මොකද වෙන්නෙ? හඳේ කාන්තිය යනව අර සූර්යයාගේ තේජසින්. හඳ නිෂ්ප්‍රභාවෙනව. ඊළඟට අපි දවල්කාලයේ නිසැක අන්දමින්ම- ඉර එළිය තියෙනවනම්, අපට සැකයක් නෑ පෙනෙන රූප පිළිබඳව- නිසැක අන්දමින්ම, ප්‍රකට ලෙසම අප අවට තියෙන නොයෙකුත් විචිත්‍ර වෛවර්ණ රූප මේ ලෝක සිනමාවෙ නරඹමින් සිටිනව, දවල් කාලයේ. බුදුරජාණන්වහන්සේ වදාළ ආර්යඅෂ්ටාංගික මාර්ගය පුරුදු කරන ආර්යශ්‍රාවක කෙනෙකුගේ චිත්තසන්තානයේ ආගන්තුක

උපක්ලේෂ ඉවත්වෙලා නෛසර්ගික ප්‍රභාස්වරබව මතුවුනා කියල හිතමු. එතකොට මොකද වෙන්නෙ? තරුත් නිෂ්ප්‍රභා වෙනව. හඳත් නිෂ්ප්‍රභා වෙනව. ඉරත් නිෂ්ප්‍රභා වෙනව. තරු එළියෙන් හඳඑළියෙන්, ඉර එළියෙන් පෙනුන රූපත් විවර්ණ වෙලා මැකිලයනවා. ඒ රූපවලම සෙවනැල්ලක් වන අරූපයත් මැකිල යනව. අපි ගියවර දේශනයේදී ප්‍රකාශකළා මේ රූපයත් ආකාශයත් චිත්‍රයත් පසුබිමත් වගේ, එතකොට මේ ඔක්කොම සිද්ධ වෙන්නෙ මේ ආකාශයේ. අර පසුබිමේ. අර සිනමා දර්ශනය අපට ලස්සනට පෙනුනෙ අන්ධකාරය නිසා. ඒ අන්ධකාරයෙ එක එක මට්ටම් තමයි අපි අර තරු එළිය, හඳඑළිය, හිරුඑළිය, කියල ප්‍රකාශකළේ. ලෝකයා හිතන්නෙ හිරුඑළිය ලැබුනහම ඇස් තියෙනවනම් පෙනෙන්ට ඕන කියලයි. ඊට එහාට හිතන්න ශක්තියක් නැහැ. නමුත් බුදුපියාණන්වහන්සේ ප්‍රකාශකරල තියෙනව හිරුඑළියටත් වැඩිය ප්‍රභාවත් දෙයක් ලෝකයේ තියෙනව කියලා. 'නත්ථි පඤ්ඤා සමා ආභා'[2] 'ප්‍රඥාව හා සමාන ආභාවක් නැත' - අපි කලින් අවස්ථාවක දේශනයක ප්‍රකාශකළ සූත්‍ර පාඨයක්, බුද්ධදේශනාවක්, අපි නැවතත් සිහියට නගා ගනිමු.

**'චතස්සො ඉමා භික්ඛවෙ පභා කතමා චතස්සො චන්දප්පභා සූරියප්පභා. අග්ගිප්පභා. පඤ්ඤාපභා ඉමා ඛො භික්ඛවෙ චතස්සො පභා එතදග්ගං භික්ඛවෙ ඉමාසං චතුන්නං පභානං යදිදං පඤ්ඤාපභා'** [3]

මහණෙනි මේ ප්‍රභාවෝ හතර දෙනෙකි. කවර සතර දෙනෙක්ද? චන්ද්‍ර ප්‍රභාව, සූර්‍යප්‍රභාව, අග්නිප්‍රභාව, ප්‍රඥප්‍රභාව. මේවාය මහණෙනි ඒ ප්‍රභා හතර. මහණෙනි මේ ප්‍රභා හතර අතුරින් මෙයම ශ්‍රේෂ්ඨය. එනම් ප්‍රඥප්‍රභාව'. දැන් එතකොට අපිට පේනව අර රූපඅරූප මැකිල යන්නෙ මක්නිසාද කියල. මේ ප්‍රඥවෙ තියෙනව 'නිබ්බෙධිකා පඤ්ඤා' කියල කියන විනිවිද යන ස්වභාවයක්. රූප පෙනෙනකොට රූපයත් එක්කම එතන හෙවනැලිත් පෙනෙනව. හෙවනැලි පෙනීමෙන්ම පේනව එතැන සම්පූර්ණයෙන්ම අන්ධකාරය දුරුවෙලා නැතිබව. හැම පැත්තෙන්ම ආලෝකයක් වැටෙනව නම් හෙවනැල්ලක් නෑ එතන . ඒ ආලෝකය විනිවිද යන ස්වභාවයක් ඇති එකක් නම් එතන රූපයක් නැහැ. එතකොට රූපයත් අරූපයත් මුල්කරගෙනයි ලෝකයා සැපදුක් කියල දෙයක් තියන ලෝකයක සැපදුක් විඳින්නෙ. එතකොට අපිට දැන් බාහිය සූත්‍රයෙ ගාථාව, අටුවා මඟින් ඉවත්වුනාට මොකද, ඊට වඩා, සමහරවිට, අර්ථවත් විදියට තේරුම් කරන්න පුළුවන්. අපි නැවතත් ඒ ගාථාව ඒ නිසාම ප්‍රකාශ කරමු.

**'යත්ථ ආපො ච පඨවී - තෙජො වායො න ගාධති**
**න තත්ථ සුක්කා ජොතන්ති - ආදිච්චො නප්පකාසති**
**න තත්ථ චන්දිමා භාති - තමො තත්ථ න විජ්ජති**
**යදා ච අත්තනා වෙදී - මුනි මොනෙන බ්‍රාහ්මණො**
**අථ රූපා අරූපා ච - සුඛදුක්ඛා පමුච්චති'**

සම්පූර්ණයෙන්ම ගාථාවෙ අර්ථය අපට දක්වන්න පුළුවනි මේ විවරණක්‍රමය අනුව. ඒ වගේම අපි සාධකවශයෙන් ප්‍රකාශකරන්න ඕන, දැන් අටුවාවෙ ඉර, හඳ, තරු පිළිබඳව කරන විවරණයෙ අඩුපාඩුව වැඩියත් පෙනෙන්න සාධක කීපයක් අපට මේ ගාථාවෙන්ම උපුටල දක්වන්න පුළුවන්. අටුවාවෙ ප්‍රකාශකළේ අර 'අනුපාදිසෙස නිබ්බානධාතු' නම් යම්කිසි ගුඪ තැනක, පෘථග්ජනයින්ට තේරුම්ගන්න බැරි යම්කිසි ගුප්ත තැනක, ඉර හඳ තාරකා ආදිය නැතිබවයි මේ ගාථාවෙන් කියන්නෙ කියල. නමුත් මේ ගාථාවෙ ඇත්ත වශයෙන්ම යෙදිල තියෙන පද, -ඒ ක්‍රියාපද,- ඉර හඳ තාරකා නැතිබව කියනව නොවෙයි. ඊට වැඩිය යමක් කියනව. 'න තත්ථ සුක්කා ජොතන්ති' තරු දිලිසෙන්නෙ නැහැ. තරු දිලෙන්නෙ නෑ. තරු ඇත්තවශයෙන්ම නැත්නම්, ඒකට වෙන පාළි වචනයක් යොදන්න පුළුවන් න දිස්සන්ති, එහෙම නැත්නම් න විජ්ජන්ති ආදී වශයෙන් පෙනෙන්නේ නෑ. විද්‍යමාන වෙන්නෙ නෑ. ඉරහඳ ආදිය පිළිබඳවත් ඒ විදියට යොදන්න පුළුවන්. නමුත් මෙතෙන්දි යෙදිල තියෙන්නෙ ඇත්තවශයෙන්ම ආලෝකය, එළිය විහිදීම, බැබලීම, දීප්තිය අඟවන ක්‍රියාපද කීපයක්. 'න තත්ථ සුක්කා ජොතන්ති' - එහි තරු දිලිසෙන්නෙ නෑ. 'ආදිච්චො නප්පකාසති' - සූර්යයා ප්‍රකට වන්නෙ නැහැ. ප්‍රකටව ආලෝකය විහිදුවන්නෙ නැහැ. 'න තත්ථ චන්දිමා භාති' - චන්ද්‍රයා ශෝභමානව එළිය විහිදුවන්නෙ නැහැ. මක්නිසාද? මේව නිකමට ප්‍රකාශකරපු දේවල් නොවෙයි. මේක ප්‍රීති වාක්‍යයක්. මේ කියාපු උදාන ගාථාව ගැඹුරු ප්‍රීතිවාක්‍යයක්. අර ගුඪධර්මයක් ප්‍රකාශකරන දෙයක් නොවෙයි. අපි කලින් '**නමුත්**' කියන වචනයක් ගැන විශේෂ අවධාරණයක් කළා. අර අටුවා විග්‍රහයෙදි. දැන් ඒකෙ වැදගත්කමයි අපි ඊළඟට ප්‍රකාශකරන්න බලාපොරොත්තු වෙන්නෙ. මේ ගාථාවෙ තියෙන ඊළඟ ප්‍රහේලිකා පදයක් හැටියට අටුවාව ඉදිරිපත්කරල තියෙන්නෙ 'තමො තත්ථ න විජ්ජති' කියන පදය. අන්ධකාරයක් එහි නැත. මේක අටුවාවට ලොකු ගැටලුවක්. අර විදියට ඉර හඳ තාරකාත් නැත. ඉර හඳ තාරකා නැති නමුත් එතැන අන්ධකාරයක්ද නැත. අපි මේ ප්‍රකාශකළ නිෂ්ප්‍රභාවන ධර්මතාවට අනුව කල්පනාකරල බැලුවහම කියන්න වෙන්නෙ හාත්පසින්ම වෙනස් විවරණයක්. ඒ අනිදස්සන විඤ්ඤාණයෙ ආලෝකය තිබෙන **නිසාම** ඉර හඳ තාරකා අප්‍රකටයි. '**නමුත්**' කියන එක නොවෙයි දැන්, '**නිසා**' කියන එකයි යොදන්න වෙන්නෙ. අර සබ්බතොපභ ස්වභාවය නිසාමයි එතැන අන්ධකාරයක් නැත්තෙ. අර තරු ආදිය දිලිසෙන්නෙත් නැත්තෙ.

ඔන්න ඔය විදියට අපට එතකොට මේ උදාන ගාථාවෙනුත් ඉතාමත්ම වටිනා කාරණා රාශියක් හෙළිවෙනවා. ඒ ධර්ම උපදේශයෙන් පමණක් නොවෙයි මේ ගාථාවෙනුත් අපේ මාතෘකාව වන නිබ්බානය පිළිබඳව

ලොකු එළියක් ලැබෙනව. මේ 'නිබ්බාන' කියන එක, මේ 'අනුපාදිසෙස නිබ්බානධාතු' කියල අටුවාව බොහෝවිට තෝරන මේ අරුම පුදුම තැන, ඇත්තවශයෙන්ම මේ අපේ සිතයි. මේ සිතේ ප්‍රභාස්වර බව දැක්වීමට බුදුපියාණන්වහන්සේ දුන් වචන කීපයක් මේ. ඇත්ත වශයෙන්ම ඒ එලසමවතේදී සිදුවෙන්නෙ කුමක්ද? ලෝකයා මේ අවට තියෙන දේ දකින්නෙ පටු ආලෝකධාරා හයක් මගින්. ඇස් කන් නාසාදි ඒ ආයතන හයෙන්. ඒවායින් පෙන්වන දේවල් ලෝකයා දකින්නෙ. මේ ප්‍රඥ ප්‍රභාව උද උනාම යම්කිසි සන්තානයක, අර සළායතනය නිරුද්ධ වෙනව. ඒ සළායතන නිරෝධය දැන් අපි කියාපු වචන කීපයකින්ම ප්‍රකාශ කරන්න පුළුවන්. නාමරූප නිරෝධය, විඤ්ඤාණ නිරෝධය, සළායතන නිරෝධය, මේ කොයි වචනවලින් කීවත් අර ප්‍රත්‍යක්‍ෂයමයි. මේ සළායතනය නිරුද්ධ උනාට මොකද යම්කිසිවක් නොදකිනව නොවෙයි එතන. ඒ දකින දේ තමයි ඔය ශූන්‍යත්වය. ලෝකය පිළිබඳ ශූන්‍යත්වය. 'සුඤ්ඤ ලොකො' කියල ඇත්ත වශයෙන්ම ප්‍රකාශකෙරෙන්නෙ අර කියාපු, ලෝකයා ඇතෙයි කියල හිතාගන්න රූප ආදිය ඒ හැම එකක්ම ප්‍රඥව හමුවේදි විනිවිද යනව. ඒව අප්‍රකට වෙනව. අන්න ඒ විදියට ගත්තාම අපට මේ බාහිය සූත්‍රයෙන් ධර්මකාරණා රාශියක් මතුකරගන්න පුළුවන්.

ඊළඟට තවත් මේකට සමාලෝචනාත්මක වශයෙනුත් යම් කිසිවක් ප්‍රකාශකළොත්, මේ සූත්‍රයෙ අපට පෙනෙනව ඇත්තවශයෙන්ම අර ධර්මයේ 'ස්වාක්ඛාත, සන්දිට්ඨික අකාලික, එහිපස්සික, ඔපනයික, පච්චත්තං වෙදිතබ්බ විඤ්ඤූහි කියන ඒ ෂඩ් ගුණය. අපි ඒකට ෂඩ් ගුණය කියල කියමු. ඒ ගුණ හය ඉතාමත්ම පුදුම අඳමින් විදහාපාන සූත්‍රයක් තමයි මේ බාහිය සූත්‍රය. මීට කලින් දේශනයකදී අපි උපමාවක් හැටියට දැක්වුව 'උදැසන හිරු රැසේ දිලෙන දිලිසෙන පිණි බින්දුවක්'. බොහොම පොඩි උපමාවක්. වැලක හෝ කොළයක හෝ එල්ලෙන ඉතා කුඩා පිණිබිඳුවක් තුළින් සූර්යයාගේ දේදුනු වර්ණ සංකලනය දැකීම ඉතාමත්ම සීරුවෙන් කළයුත්තක්. සූර්යයාට මූනදල හිටගත්තු පමණින්, එහෙම නැත්නම් ඉඳගත්තු පමණින්, ඒ පිණි බිඳුව තුළින් සූර්යයාගේ ෂඩ්වර්ණය, ඒ දේදුනුවර්ණ සංකලනය, දකින්න බැහැ. ඒ සඳහා යම්කිසි දෘෂ්ටිකෝණයක් ඕන. නියම දෘෂ්ටිකෝණය අනුව හරියට නිසි එල්ලය අල්ලල බැලුවොත් තමයි අර පිණිබිඳුව තුළින් දේදුනු වර්ණය දකින්න පුළුවන් වෙන්නෙ. දේදුන්නක් පායනකම් ඉන්න ඕනෙත් නැහැ. ඒක තුළින් දකින්න පුළුවන් දේදුනු වර්ණය. හැබැයි හරි දෘෂ්ටිකෝණයෙන් පමණයි. මේ විදියටම බුදුපියාණන්වහන්සේගේ සද්ධර්මයෙහි ෂඩ්වර්ණය, අර ස්වාක්ඛාතාදි ෂඩ්වර්ණය, දැකීමටත් යම්කිසි දෘෂ්ටිකෝණයක් තිබෙනව. ඒක තමයි සම්මා දිට්ඨිය. එතකොට මේ සම්මාදිට්ඨිය සෘජුකරගැනීමට මේ ගැඹුරු සූත්‍රවල අර්ථ

ප්‍රත්‍යවේක්ෂාවත් උපකාර වෙනව. ගම්භීර සූත්‍රාර්ථ ප්‍රත්‍යවේක්ෂාව මේ සම්මාදිට්ඨිය හරිගස්සගන්න උපකාර වෙනව. සම්මාදිට්ඨිය නැති තැන ශීලය සීලබ්බතයට නැඹුරු වෙනව. සමාධිය මිච්ඡා සමාධියට ඇදිල යනව. ඇත්ත වශයෙන්ම සමහරවිට කෙනෙක් අර හිරුදෙසට මූනලා ඉඳගත්තවගේ බුදුපියාණන්වහන්සේගේ ධර්මය දිහාවට හැරිල හිටියත්, සරණගමන මාත්‍රයෙන් ලැබෙන දයාදයක් නොවෙයි සම්මාදිට්ඨිය. උත්සාහයෙන් සැළකිල්ලෙන් දියුණුකර ගතයුතු දෙයක්. කෙළින් කරගතයුතු දෘෂ්ටියක්. 'දිට්ඨුජ්ජුකම්ම' කියල එහෙමත් කියන්නෙ. එතකොට කොයිතරම් කාලයක් බද්ධ පයර්‍යංකයෙන්ම මේ බුද්ධසූර්යයා දෙස බලාගෙන හිටියත් සමහරවිට කෙනෙකුට අර ධර්මයේ ෂඩ්වර්ණය දකින්න බැහැ. නියම දෘෂ්ටිකෝණය සමහරවිට අඟලකින් සියයකින් කොටසක් වෙන්න පුළුවන්. නමුත් ඒක අත්‍යවශ්‍ය දෙයක්. අත්‍යවශ්‍ය වෙනසක්. ඒ වෙනස කළා නම් එකෙණෙහිම- 'තාවදෙව' - අර බාහියරහතන්වහන්සේ වගේ - බුදුපියාණන්වහන්සේ දේශනා කළ ධර්මයෙ ෂඩ්වර්ණය දකිනව. එතකොට මෙන්න මේකයි ධර්මතාව. අර සම්මාදිට්ඨියෙ වැදගත්කම විශේෂයෙන් ප්‍රකාශ කළේ මක්නිසාද, මෙකල බොහොම දෙනෙක් අතර යම්කිසි විදියක පටලැවිල්ලක් තියෙනව. හදගත්තු පටලැවිල්ලක් තිබෙනව. ත්‍රිවිධශික්ෂාවත් මේ ආර්‍යාෂ්ටාංගික මාර්ගයේ සම්මාදිට්ඨියත් කොහොමද ගලපන්නේ කියල. බොහොම දෙනෙක් අහන ප්‍රශ්නයක් මේක.

ත්‍රිවිධ ශික්ෂාව කියල ගත්තාම සීල, සමාධි,පඤ්ඤා. ප්‍රඥාව අගටයි තියෙන්නෙ. ඉස්සෙල්ල ශීලය පුරාගෙන පුරාගෙන ගිහිල්ල, ඊළඟට සමාධිය වඩනව. සමාධිය වඩාගෙන වඩාගෙන ගිහිල්ල, අන්තිමට තමයි ප්‍රඥාව. එතකං හිතන්න ඕන නැහැ ප්‍රඥාවක් ගැන. නමුත් ආර්‍යඅෂ්ටාංගික මාර්ගයෙ එහෙම නොවෙයි කියල තියෙන්නෙ. සම්මා දිට්ඨිය මුලටම. වෙන එකක් තබා බුදුපියාණන්වහන්සේ මජ්ඣිමනිකායෙ මහාචත්තාරීසක සූත්‍රයෙ, පුන පුනා, නැවත නැවතත්, අවධාරණාත්මකව ප්‍රකාශකරනව 'තත්‍ර භික්ඛවෙ සම්මාදිට්ඨි පුබ්බංගමා' - [4] 'මහණෙනි එහිලා සම්මාදිට්ඨියම පූර්වාංගමය, පෙරටුවෙනව' කියල. වෙන එකක් තබා ශීලාදී ගුණධර්ම පිළිබඳව ප්‍රකාශ කරන ඡේදවලත් තියෙනව 'සම්මාදිට්ඨි පුබ්බංගමා'. සීලාදි දේවල් පිළිබඳව පවා හොඳට බැලුවොත් මහා චත්තාරීසක සූත්‍රයෙ ප්‍රකාශවෙනව සම්මාදිට්ඨිය පූර්වාංගමයි.

එතකොට අපි කොහොමද මේක ගලපන්නෙ. ආර්‍යාෂ්ටාංගිකමාර්ගයේ මුලටම දාල තියෙන්නෙ පඤ්ඤා කොටසට අයිති මේ සම්මාදිට්ඨිය. ඒක බොහොම ප්‍රකටකාරණයක්, 'සම්මාදිට්ඨි සම්මා සංකප්ප' දෙක ප්‍රඥාස්කන්ධයට ගැනෙනවයි. සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව කියන අංග තුන ශීලස්කන්ධයට හසු වෙනවය. සම්මා වායාම සම්මා සති

සම්මා සමාධි කියන ඒව සමාධිස්කන්ධයට අයිතිය කියල. ඉතින් ඔය විදියට ඉස්සෙල්ලම ප්‍රඥාව, ඊළඟට ශීලය, ඊළඟට සමාධිය, ආර්‍ය අෂ්ටාංගික මාර්ගයෙ. නමුත් මේ ස්කන්ධ තුන ගැන බලන කොට ශීලය මුලට. සමාධිය දෙවෙනියට. ප්‍රඥාව අගට. මෙතෙන්දිත් අපට උපකාර වෙනව මැදුම් සඟියෙ චූල වේදල්ල සූත්‍රයෙ ධම්මදින්නා රහත් මෙහෙණින්වහන්සේ විසාඛ උපාසක තුමාට දෙන පිළිතුර. විසාඛ උපාසකතුමා ධම්මදින්නා රහත්මෙහෙණින් වහන්සේගෙන් විමසනවා 'ආර්‍යවෙනි මේ ආර්‍යාෂ්ටාංගික මාර්ගයෙන් මේ ත්‍රිවිධස්කන්ධය සීල සමාධි පඤ්ඤා සංගෘහීත වුනාද, එහෙම නැත්නම් ත්‍රිවිධ ස්කන්ධයෙන් ආර්‍යාෂ්ටාංගික මාර්ගය සම්පූර්ණ වුනාද? ඒ කාලෙත් මේ විදියේ ප්‍රශ්නකරපු අය ඉන්න ඇති. ඒකයි එහෙම අහල තියෙන්නෙ. ආර්‍යාෂ්ටාංගික මාර්ගයෙන් ත්‍රිවිධ ස්කන්ධය සම්පූර්ණ වුනාද? එහෙම නැත්නම් සීල සමාධි පඤ්ඤාවලින් ආර්‍යාෂ්ටාංගික මාර්ගය සම්පූර්ණ වෙනවද? එතකොට ධම්මදින්නා රහත්මෙහෙණින්වහන්සේ දෙන පිළිතුර, 'ඇවැත් විසාඛය, ආර්‍යාෂ්ටාංගික මාර්ගයෙන් ත්‍රිවිධ ශික්ෂාව සංගෘහීත වුනා නොවෙයි. සකස් වුනා නොවෙයි. ත්‍රිවිධ ශික්ෂාවෙනුයි ආර්‍යාෂ්ටාංගික මාර්ගය සංගෘහීත වෙලා තියෙන්නෙ. සමහරවිට මේකෙ තවමත් පටලැවිල්ලක් තිබෙන්න පුළුවන්. අපි ඒක නිසා, මේ පටලැවිල්ල අවබෝධයෙන්ම තේරුම්ගතයුතු එකක් නිසා, මේකට තවත් පටලැවිල්ලක් එකතු කරමු. පටවල් තුනකින් අඹරපු කඹයක් දිගේ ඉහළට නගින්නට උත්සාහ කරන කෙනෙකුගේ ඇඟිලි තුඩු සමහරවිට පළමුවැනි පට සමහර විට, දෙවෙනි පට, සමහරවිට තුන්වෙනි පට අල්ලනව. ඒ නගින උත්සාහයේදි මේ පටවල්වල 1,2,3, කියන මේ අංක පිළිවෙල ගැන, මේ ගැන පටලැවිල්ලක් නැහැ අර කඹේ දිගේ නගින තැනැත්තට, මේ පළමුවෙනි පටද අහු උනේ, දෙවෙනි පටද අහුඋනෙ, තුන්වෙනි පටද කියල. මේව හොඳට ඇඹරිලා තියෙන්න ඕන කඹේ දිගේ නගින්න. එතකොට මේ ප්‍රශ්නරාශියක්ම පැන නැඟිල තියෙන්නෙ ඉලක්කම් අනුව හිතන්න, සංඛ්‍යාලේඛන අනුව හිතන්න, පුරුදුවුනු එක්තරා විදියක ආකල්පයක් නිසයි. මේ වගේම බුදුපියාණන්වහන්සේගේ මේ ආර්‍යාෂ්ටාංගික මාර්ගය කියන කඹේ දිගේ ඉහළට නගින ආර්‍යශ්‍රාවකයට අර සීලසමාධි පඤ්ඤාවලත් ඒ වගේම අර අටහිමගේ කියන ඒ අංක පිළිවෙල පිළිබඳවත් කිසිම පටලැවිල්ලක් නැහැ. නමුත් යම්කිසි කෙනෙක් සීල සමාධි පඤ්ඤාවල තිබෙන අංක පිළිවෙල බලල, ඒ අනුව සම්මාදිට්ඨිය ගැන උදාසීන වෙතොත්, ඒක පස්සට දැම්මොත්, අන්න එතෙන්දි නම් සමහරවිට පටලැවිල්ලක් සිද්ධ වෙන්න ඉඩ තියෙනව. එතකොට මේ අනුව අපට බාහිය සූත්‍රයේ වැදගත්කම හිතාගන්න පුළුවනි, ඉතාමත්ම ගැඹුරින්. මේ මුළුමහත් සද්ධර්මයෙම අර්ථසමුදය කෙටියෙන් ඉදිරිපත් කරල තියෙනව. මේ කාලෙ හිතන්න වගේ නිවන්පුරයට ඇතුල්වෙන්න අවශ්‍ය සංඥා ගොඩවල් කිසිවක් මෙතන නැහැ. සාමාන්‍යයෙන් ලෝකයා හිතන්නෙ නිවන්පුරයට ඇතුල්වීමට

සුදුසුකමක් වශයෙන් සංඥගොඩක් එකතුකරගෙන යන්න ඕන කියල. නමුත් මෙතන තියෙන්නෙ ඇත්තවශයෙන්ම සඤ්ඤ අනුසයෙනුත් සිත මුදා ගැනීමක්. 'සඤ්ඤා නානුසෙන්ති' [5] කියල කියන්නෙ. ඒ විදියට සඤ්ඤ අනුසයෙන් සිත මුදගැනීමේ ප්‍රතිපදාවකුයි මේ බාහිය සූත්‍රයෙ අඩංගුවෙලා තියෙන්නෙ. 'දිට්ඨෙ දිට්ඨමත්තං' ආදියෙන් ප්‍රකාශවෙන්නෙ. අමුතුවෙන් ගොඩගහගන්න දෙයක් නොවෙයි. 'ආගන්තුක උපකෙල්ශ' කියල කියන්නෙ සාමාන්‍යයෙන් ලෝකයේ උපකෙල්ශ කියන ටික පමණක් නොවෙයි. මේ අපේ සිත්වල, මේ දීඝ සංසාරයේ ආශ්‍රව ශක්තිය නිසා ඇලිල බැඳිල තියෙන මේ මලකඩ රාශිය. ඒවාට ලෝකයා දැනුම කියල කියන, ඥනය කියල කියන, මේ සංඥගොඩත් ඇතුළත්. ඉලක්කම් පවා ඒකට අයිතියි. මේ හැමදෙයක්ම ගැලවිල යන ඒ ධර්මතාව තමයි බුදුපියාණන් වහන්සේ මේ කෙටියෙන් ප්‍රකාශ කරල තියෙන්නෙ. ඒක නිසා මේක වොහාර දෙසනා කියල හෝ මේව සාමාන්‍ය සම්මුති දේසනා කියල හෝ ඒ විදියට නොතකා හැරීමට, සුළුකොට තැකීමට, කිසිම හේතුවක් නෑ. මේ උදන සූත්‍රය කෙනෙකුට ඇත්තවශයෙන්ම උදනයක් අනන්න තරම් වටිනා සූත්‍රදේශනාවක්.

## අධෝලිපි

1. ම.නි. III 142 පිට (බු.ජ.12)
2. සං.නි. I 12 පිට (බු.ජ. 13)
3. අං.නි. II 268 පිට (බු.ජ. 19)
4. ම.නි. III 212 පිට (බුජ. 12)
5. ම.නි. I 274 පිට (බු.ජ. 10)